## අ.පො.ස. (උ.පෙළ) විභාගය

# ඇගයීම් වාර්තාව

# 2020

## 71 සිංහල භාෂාව

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස. (උ. පෙළ) විභාගය - 2020

# ඇගයීම් වාර්තාව

# 71 - සිංහල


පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු හිමිකම් ඇවරිණි**
**අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2020**
**ඇගයීම් වාර්තාව - සිංහල**

උපදේශකත්වය : ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස්

සැලසුම හා සංවිධානය : ඩබ්ලිව්. එස්. ඩී. වීරසිංහ
විභාග කොමසාරිස්
පර්යේෂණ හා සංවර්ධන

විෂය සම්බන්ධීකරණය : එච්. කේ. සී.කේ. කුමාරි
නියෝජ්‍ය විභාග කොමසාරිස්
පර්යේෂණ හා සංවර්ධන

**අන්තර්ගත සංවර්ධන සඳහා**

විෂය පාදක මඟ පෙන්වීම : මහාචාර්ය ස්වර්ණා ඉහළගම
සිංහල අධ්‍යනය අංශය
කැළණිය විශ්ව විද්‍යාලය

ශාස්ත්‍රීය මඟ පෙන්වීම : ඩබ්ලිව්. එස්. ඩී. වීරසිංහ
විභාග කොමසාරිස්
පර්යේෂණ හා සංවර්ධන

අන්තර්ගත සංවර්ධන කමිටුව : එච්. කේ. සී.කේ. කුමාරි
නියෝජ්‍ය විභාග කොමසාරිස්
පර්යේෂණ හා සංවර්ධන

: එම්. කේ. ප්‍රදීප් ඉඳුනිල් පියරත්න
නියෝජ්‍ය කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශ දෙපාර්තමේන්තුව

: ආර්. කේ. ඒ. එල්. පද්මසිරි
ගුරු උපදේශක
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය
කුලි/ නැගෙනහිර, නක්කාවත්ත

: එම්. ඒ. අමාලි යසින්තා
ශ්‍රී. ලං. ගු. සේ.
ක්ලිෆ්ටන් බාලිකා විද්‍යාලය
කොළඹ 10

: එස්. ඒ. ඩබ්ලිව්. ඩී. පෙරේරා
ශ්‍රී. ලං. ගු. සේ.
ජනාධිපති බාලිකා විද්‍යාලය
නාවල

: ඩී. වයි. සී. ජී. සෙනෙවිරත්න
ශ්‍රී. ලං. ගු. සේ.
බප/පිලි / නැගෙනහිර ඇරැව්වල
ධර්මපාල ම.වි, පන්නිපිටිය

: කේ. ඒ.කේ. ඒ. කුමාර
ශ්‍රී. ලං. ගු. සේ
කොටහේන මධ්‍ය මහා විද්‍යාලය

| | | |
|---|---|---|
| ලේඛන කළමනාකරණ සහය | : | එම්. ඩබ්ලිව්. ඩී. ටී. ආර්. මාරසිංහ<br>සංවර්ධන නිලධාරි |
| පරිගණක පිටු සැකසුම | : | ජේ. කේ. එච්. නවෝදනි ජයනෙත්ති<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| පිටකවර සැකසුම | : | ඒ. එල්. කේ. චතුරාණි<br>කළමනාකරණ සේවා නිලධාරි |

## විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ 2020 වර්ෂයේ සිංහල විෂයයට අදාළව මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කර ඇත්තේ අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ දත්තමය හා විශ්ලේෂණාත්මක අවබෝධයක් ලබා දීම, ඔවුන්ගේ ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනීම සහ එම අනාවරණයන් පදනම් කරගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මෙන්ම පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ අරමුණ පෙරදැරිව ය.

මෙම වාර්තාවේ, විෂය නිර්දේශයේ අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා හා ඉගෙනුම් ඵල අනුව අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇත. ඒ අනුව එක් එක් පරීක්ෂණ අයිතමය සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර, ශක්තීන් හා දුර්වලතා මෙන් ම වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඒ සඳහා සුදුසු අධ්‍යාපන යෝජනා ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව ගුරුවරුන්, පාසල් පරිපාලකයන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයන්, සිසුන් සහ දෙමාපියන් ඇතුළු අධ්‍යාපන පද්ධතියේ සියලූ ම පාර්ශ්වකරුවන් සඳහා වැදගත් ලේඛනයකි. වාර්තාවේ අන්තර්ගත, විශ්ලේෂණ මගින් ගුරුවරුන්ට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දුර්වලතා නිවැරදිව හඳුනාගෙන ඉලක්කගත ඉගැන්වීම් ක්‍රමෝපායන් සැලසුම් කිරීමට හැකි වන අතර, සිසුන්ට තම ඉගෙනුම් අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව සූදානම් වීමට මග පෙන්වයි. එමෙන් ම විෂයමාලා සංශෝධනය, ගුරු වෘත්තීය සංවර්ධනය, සම්පත් වෙන් කිරීම සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ද මෙම වාර්තාව ඉවහල් වනු ඇත.

මෙම වාර්තාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා, අපේක්ෂකයන්ගේ සාධන දත්ත සමග එක් එක් පරීක්ෂණ අයිතමයට අදාළ විශ්ලේෂණ, නිරීක්ෂණ සහ නිර්දේශ ඒකාබද්ධව අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. එමඟින් සිසුන් මුහුණ දෙන සංකල්පමය දුර්වලතා සහ ඉගෙනුම් අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන ඒ සඳහා සුදුසු මැදිහත්වීම් සැලසුම් කළ හැකි වනු ඇත. තවද, මෙම වාර්තාව ඉදිරි වසරවල අපේක්ෂකයන්ගේ සාධනය සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීම සඳහා දත්ත පදනමක් ලෙස ද භාවිත කළ හැකිය.

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා දත්ත මත පදනම් වූ තීරණ ගැනීම අත්‍යවශ්‍ය වන බැවින්, මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති අනාවරණයන් සහ නිර්දේශ ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ගුරුවරුන් සහ සිසුන් විසින් ප්‍රායෝගිකව භාවිතයට ගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට දායක කර ගනු ඇතැයි මම විශ්වාස කරමි.

අවසාන වශයෙන්, මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කිරීම සඳහා කැපවීමෙන් දායක වූ සියලූ ම සම්පත්දායකයන්ට සහ විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ නිලධාරීන්ට මාගේ හෘදයංගම ස්තූතිය පුද කරමි. විශේෂයෙන් ම විද්‍යාත්මක ප්‍රවේශයකින් මෙම වාර්තාව සම්පාදනය කිරීම සඳහා ඔවුන් දැක්වූ වෘත්තීමය දායකත්වය ඉතා අගය කොට සලකමි.

ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

# සංක්ෂිප්තය

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ 2020 වර්ෂයේ සිංහල විෂයයට අදාළව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද මෙම ඇගයීම් වාර්තාව, අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ප්‍රකාශනයකි. මෙම වාර්තාව ගුරුවරුන්, විෂයභාර නිලධාරීන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පර්යේෂකයන්, සිසුන් සහ දෙමාපියන් සඳහා ප්‍රයෝජනවත් ලේඛනයක් ලෙස භාවිත කළ හැකි ය. මෙම වාර්තාව ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.

පළමු කොටසෙහි, සිංහල විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන්ගේ සාමාන්‍ය තොරතුරු, මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව අපේක්ෂක සංඛ්‍යාව, දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප අනුව සාධනය, ශ්‍රේණි ව්‍යාප්තිය සහ අනෙකුත් සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත. එමෙන්ම විෂය අරමුණු, ඇගයීම් රාමුව සහ විභාගයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද ලබා දී ඇත.

දෙවන කොටසෙහි, I පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි I පත්‍රයේ ව්‍යූහය, ප්‍රශ්න සැකැස්ම, ලකුණු ලබාදීමේ පටිපාටිය සහ එක් එක් ප්‍රශ්නයට අපේක්ෂකයන් දැක්වූ ප්‍රතිචාර පිළිබඳ දත්තමය විශ්ලේෂණ ද අන්තර්ගත වේ. තව ද, අයිතමවල පහසුතාව/පහසුතා දර්ශක, විභේදන හැකියාව සහ අපේක්ෂකයන්ගේ සාමාන්‍ය ප්‍රතිචාර රටා ද විග්‍රහ කර ඇත.

තෙවන කොටසෙහි, II පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි එක් එක් ප්‍රශ්නය, එහි කොටස් හා අනුකොටස් සඳහා අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇති අතර, අයිතමවල පහසුතා දර්ශක, නිපුණතා මට්ටම් සහ සංකල්පමය දුර්වලතා හඳුනාගෙන ඇත. එසේම, එම අනාවරණයන් මත පදනම්ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී ලෙස සංවිධානය කිරීම සඳහා සංවර්ධනාත්මක යෝජනා ද ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව සකස් කිරීම සඳහා සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory - CTT) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory - IRT) යන විද්‍යාත්මක ප්‍රවේශයන් යොදාගෙන අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය කර ලබාගත් දත්ත භාවිත කර ඇත. මීට අමතරව පිළිතුරු පත්‍ර ඇගයීමේ කටයුතුවල නිරත වූ ප්‍රධාන පරීක්ෂකවරුන්, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන් සහ සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ, අදහස් සහ යෝජනා ද මෙම වාර්තාව සකස් කිරීම සඳහා පාදක කරගෙන ඇත.

මෙම වාර්තාවේ ඇතුළත් විශ්ලේෂණයන් සහ නිර්දේශ, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, විෂය සාධනය ඉහළ නැංවීම, විෂයමාලා සංවර්ධනය සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

# පටුන

පිටු අංකය

**I කොටස**


1. විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අරමුණු 1

1.2 අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු 2

1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 2

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2

1.2.3 විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3

1.2.4 විභාගයට පෙනී සිටි පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - කලාප අනුව 5

1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය 9

**II කොටස**

2. ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය I පත්‍රය 10

2.1 සිංහල I පත්‍රය ව්‍යුහය 10

2.2 I පත්‍රයේ විශ්ලේෂණය 11

2.3 සිංහල I පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂී නිරීක්ෂණ හා නිර්දේශ 14

2.3.1 ප්‍රශ්න අංක අංක 1 සහ අපේක්ෂිත පිළිතුර 14

2.3.2 ප්‍රශ්න අංක අංක 1 සඳහා විශ්ලේෂණය 21

2.3.3 ප්‍රශ්න අංක අංක 2 සහ අපේක්ෂිත පිළිතුර 24

2.3.4 ප්‍රශ්න අංක අංක 2 සඳහා විශ්ලේෂණය 28

2.3.5 ප්‍රශ්න අංක අංක 3 සහ අපේක්ෂිත පිළිතුර 30

2.3.6 ප්‍රශ්න අංක අංක 3 සඳහා විශ්ලේෂණය 35

2.3.7 ප්‍රශ්න අංක අංක 4 සහ අපේක්ෂිත පිළිතුර 37

2.3.8 ප්‍රශ්න අංක අංක 4 සඳහා විශ්ලේෂණය 39

2.3.9 ප්‍රශ්න අංක අංක 5 සහ අපේක්ෂිත පිළිතුර 41

2.3.10 ප්‍රශ්න අංක අංක 5 සඳහා විශ්ලේෂණය 44

2.3.11 ප්‍රශ්න අංක අංක 6 සහ අපේක්ෂිත පිළිතුර 46

2.3.12 ප්‍රශ්න අංක අංක 6 සඳහා විශ්ලේෂණය 48

2.3.13 ප්‍රශ්න අංක අංක 7 සහ අපේක්ෂිත පිළිතුර 50

2.3.14 ප්‍රශ්න අංක අංක 7 සඳහා විශ්ලේෂණය 57

2.3.15 ප්‍රශ්න අංක අංක 8 සහ අපේක්ෂිත පිළිතුර 59

2.3.16 ප්‍රශ්න අංක අංක 8 සඳහා විශ්ලේෂණය 61

**III කොටස**

3. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - II පත්‍රය 63
3.1 II පත්‍රය විශ්ලේෂණය 64
3.2 සිංහල II පත්‍රය I කොටසෙහි පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත, නිරීක්ෂණ, නිගමන 68
3.3 සිංහල II පත්‍රය - I කොටස 70
3.4 II පත්‍රය - I කොටස සඳහා ලකුණු දීමේ පටිපාටිය 73
3.5 II පත්‍රය - I කොටසේ වරණ තෝරාගෙන ඇති ආකාරය 74
3.6 II පත්‍රය එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂි නිරීක්ෂණ හා නිර්දේශ 77
3.6.1 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර 77
3.6.2 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය 80
3.6.3 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර 82
3.6.4 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය 83
3.6.5 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර 85
3.6.6 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය 87
3.6.7 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර 89
3.6.8 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය 90
3.6.9 ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර 92
3.6.10 ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය 94
3.6.11 ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර 96
3.6.12 ප්‍රශ්න අංක 7සඳහා විශ්ලේෂණය 97
3.6.13 ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර 99
3.6.14 ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය 104

**Iv කොටස**

ඉගෙනුම් - ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා 106

## වගු නාමාවලිය

පිටු අංකය

| | | |
|---|---|---|
| වගුව 1.1 : | මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 2 |
| වගුව 1.2 : | ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 2 |
| වගුව 1.3 : | දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 3 |
| වගුව 1.4 : | අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 5 |
| වගුව 1.5 : | පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය | 9 |
| වගුව 3.1 : | සිංහල II පත්‍රය I කොටස සඳහා ලකුණු දීමේ පටිපාටිය | 73 |
| වගුව 3.2 : | එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය | 74 |

# ප්‍රස්තාර නාමාවලිය


| | පිටු අංකය |
|---|---|
| ප්‍රස්තාරය 2.1 II පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය සහ එක් එක් ප්‍රශ්නයේ පහසුතාව | 11 |
| ප්‍රස්තාරය 2.2 පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය | 12 |
| ප්‍රස්තාරය 2.3 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය | 13 |
| ප්‍රස්තාරය 2.4 ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 21 |
| ප්‍රස්තාරය 2.5 ප්‍රශ්න අංක 1 සඳහා පහසුතා දර්ශකය | 21 |
| ප්‍රස්තාරය 2.6 ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 28 |
| ප්‍රස්තාරය 2.7 ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශකය | 28 |
| ප්‍රස්තාරය 2.8 ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 35 |
| ප්‍රස්තාරය 2.9 ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශකය | 35 |
| ප්‍රස්තාරය 2.10 ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 39 |
| ප්‍රස්තාරය 2.11 ප්‍රශ්න අංක 4 සඳහා පහසුතා දර්ශකය | 39 |
| ප්‍රස්තාරය 2.12 ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 44 |
| ප්‍රස්තාරය 2.13 ප්‍රශ්න අංක 5 සඳහා පහසුතා දර්ශකය | 44 |
| ප්‍රස්තාරය 2.14 ප්‍රශ්න අංක 6 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 48 |
| ප්‍රස්තාරය 2.15 ප්‍රශ්න අංක 6 සඳහා පහසුතා දර්ශකය | 48 |
| ප්‍රස්තාරය 2.16 ප්‍රශ්න අංක 7සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 57 |
| ප්‍රස්තාරය 2.17 ප්‍රශ්න අංක 7 සඳහා පහසුතා දර්ශකය | 57 |
| ප්‍රස්තාරය 2.18 ප්‍රශ්න අංක 8සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 61 |
| ප්‍රස්තාරය 2.19 ප්‍රශ්න අංක 8 සඳහා පහසුතා දර්ශකය | 61 |
| ප්‍රස්තාරය 3.1 II පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය සහ එක් එක් ප්‍රශ්නයේ පහසුතාව | 64 |
| ප්‍රස්තාරය 3.2 පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය | 65 |
| ප්‍රස්තාරය 3.3 II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය | 66 |
| ප්‍රස්තාරය 3.4 විෂයය තේමා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශක | 67 |
| ප්‍රස්තාරය 3.5(a) II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය | 75 |
| ප්‍රස්තාරය 3.5(b) II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය | 76 |
| ප්‍රස්තාරය 3.6 ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 80 |
| ප්‍රස්තාරය 3.7 ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශකය | 80 |
| ප්‍රස්තාරය 3.8 ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 83 |
| ප්‍රස්තාරය 3.9 ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශකය | 83 |
| ප්‍රස්තාරය 3.10 ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 87 |
| ප්‍රස්තාරය 3.11 ප්‍රශ්න අංක 4 සඳහා පහසුතා දර්ශකය | 87 |
| ප්‍රස්තාරය 3.12 ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 90 |
| ප්‍රස්තාරය 3.13 ප්‍රශ්න අංක 5 සඳහා පහසුතා දර්ශකය | 90 |
| ප්‍රස්තාරය 3.14 ප්‍රශ්න අංක 6 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 94 |
| ප්‍රස්තාරය 3.15 ප්‍රශ්න අංක 6 සඳහා පහසුතා දර්ශකය | 94 |
| ප්‍රස්තාරය 3.16 ප්‍රශ්න අංක 7 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 97 |
| ප්‍රස්තාරය 3.17 ප්‍රශ්න අංක 7 සඳහා පහසුතා දර්ශකය | 97 |
| ප්‍රස්තාරය 3.18 ප්‍රශ්න අංක 8 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 104 |
| ප්‍රස්තාරය 3.19 ප්‍රශ්න අංක 8 සඳහා පහසුතා දර්ශකය | 104 |

# I කොටස

## 1. විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අරමුණු

01. භාෂාවේ අනන්‍යතාව, සුවිශේෂ බව හා භාෂා රීතී හඳුනා ගෙන තොරතුරු ව්‍යක්ත ව නිරවුල්ව හා නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ ශක්‍යතා වර්ධනය කරගැනීම.

02. ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක ලේඛනවල ශිල්පීය මූලධර්ම, ආකෘතික ලක්ෂණ, රචනා රීතී හා භාෂා ව්‍යවහාර පිළිබඳ පරිචය ලබා ගැනීම.

03. පුරාතන හා නූතන සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සමාජ, සංස්කෘතික, අගය අවබෝධ කර ගැනීම.

04. වින්දනාත්මක, විචාරාත්මක හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගනිමින් සාහිත්‍ය කෘති රස වින්දනයට මෙන්ම නිර්මාණකරණයට පෙලඹවීම.

05. වර්ධනය වන්නාවූත්, ව්‍යාප්ත වන්නාවූත්, සාහිත්‍ය, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහාගත හැකිවන පරිදි භාෂා කුසලතා වර්ධනය කර ගනිමින් ජීවිත අභියෝග ජය ගැනීම.

06. භාෂාව හා සාහිත්‍ය පරිශීලනය මගින් ස්වීයත්වය, භාෂා මාමකත්වය, ජාතික අනන්‍යතාව හා සාමකාමී සහජීවනය වර්ධනය කර ගැනීම.

මූලාශ්‍රය - සිංහල විෂය නිර්දේශය 12 -13 ශ්‍රේණි, 2017, ජා.අ.ආ

## 1.2 අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

වගුව 1.1

**මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය**

| මාධ්‍යය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ප්‍රතිශතය | ස්ත්‍රී | ප්‍රතිශතය | එකතුව | පුරුෂ | ප්‍රතිශතය | ස්ත්‍රී | ප්‍රතිශතය | එකතුව | පුරුෂ | ප්‍රතිශතය | ස්ත්‍රී | ප්‍රතිශතය |
| සිංහල | 56,410 | 15,015 | 26.62 | 41,395 | 73.38 | 7,824 | 2,230 | 28.50 | 5,594 | 71.50 | 64,234 | 17,245 | 26.85 | 46,989 | 73.15 |

මුලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි.දෙ.

2020 උසස් පෙළ විභාගයේ සිංහල (71) විෂය සඳහා පෙනී සිටි මුළු අපේක්ෂකයන් සංඛ්‍යාව 64,234කි. ඉන් ස්ත්‍රී අපේක්ෂකයන් 46,986ක් අතර එය මුළු අපේක්ෂකයන්ගෙන් 73%ක් වේ. පුරුෂ අපේක්ෂකයන් ප්‍රමාණය 17245ක් වන අතර එය සමස්ත අපේක්ෂකයන්ගේ 27%ක් පමණ වේ. පුරුෂ අපේක්ෂකයන් මෙන් තුන් ගුණයක් පමණ වැඩි ස්ත්‍රී අපේක්ෂකයන් සංඛ්‍යාවක් සිංහල විෂය තෝරා ගැනීම විශේෂත්වයකි.

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

වගුව 1.2

**ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය**

| ශ්‍රේණිය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | |
| | | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| A | 6,289 | 365 | 2.43 | 5,924 | 14.31 | 360 | 32 | 1.43 | 328 | 5.86 | 6,649 | 397 | 2.30 | 6,252 | 13.31 |
| B | 17,044 | 1,598 | 10.64 | 15,446 | 37.31 | 1,241 | 136 | 6.10 | 1,105 | 19.75 | 18,285 | 1,734 | 10.06 | 16,551 | 35.22 |
| C | 18,003 | 3,955 | 26.34 | 14,048 | 33.94 | 2,403 | 462 | 20.72 | 1,941 | 34.70 | 20,406 | 4,417 | 25.61 | 15,989 | 34.03 |
| S | 11,430 | 6,030 | 40.16 | 5,400 | 13.05 | 2,573 | 831 | 37.26 | 1,742 | 31.14 | 14,003 | 6,861 | 39.79 | 7,142 | 15.20 |
| F | 3,644 | 3,067 | 20.43 | 577 | 1.39 | 1,247 | 769 | 34.48 | 478 | 8.54 | 4,891 | 3,836 | 22.24 | 1,055 | 2.25 |
| එකතුව | 56,410 | 15,015 | 100.00 | 41,395 | 100.00 | 7,824 | 2,230 | 100.00 | 5,594 | 100.00 | 64,234 | 17,245 | 100.00 | 46,989 | 100.00 |

මුලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි.දෙ.

2020 උසස්පෙළ සිංහල විෂයය සඳහා පෙනී සිටි මුළු අපේක්ෂකයන්ගෙන් 10.3% A සාමර්ථ්‍ය, 28.4% B සාමර්ථ්‍ය, 31.7% C සාමර්ථ්‍ය, 21.8%, S සාමර්ථ්‍ය ලබාගෙන ඇත. අපේක්ෂකයන්ගෙන් 7.6% මෙම විෂය අසමත්ය. සිංහල විෂයය සඳහා පෙනී සිටි ස්ත්‍රී හා පුරුෂ අපේක්ෂකයන්ගෙන් ඒ ඒ සාමර්ථ්‍ය ලබාගත් සංඛ්‍යාවේ ප්‍රතිශතයකින් සංසන්දනය කිරීමේ දී පුරුෂ අපේක්ෂකයින්ගේ 2.3%ක් A සාමර්ථ්‍ය ලබා ඇති අතර ස්ත්‍රී අපේක්ෂකයන් A සාමර්ථ්‍ය ලැබීමේ ප්‍රතිශතය 13.3%ක් වේ. B සාමර්ථ්‍ය ලැබීමේ දී පුරුෂ අපේක්ෂකයන් 10%ක් ප්‍රතිශතයක් ලබා ගන්නා අතර ස්ත්‍රී අපේක්ෂකයන් ප්‍රමාණය 35%ක් වේ. S සාමර්ථ්‍ය ලබන පුරුෂ අපේක්ෂකයන් 39.8%ක් වනවිට එය ස්ත්‍රී අපේක්ෂකයන් සම්බන්ධයෙන් 15%ක් වේ. පුරුෂ අපේක්ෂකයන් 22%ක් විෂය අසමත් වන විට ස්ත්‍රී අපේක්ෂකයන් සිංහල විෂය අසමත් වන්නේ 2%ක් පමණ ය.

## 1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

### වගුව 1.3

දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන (A) ලැබූ | | අධි සම්මාන (B) ලැබූ | | සම්මාන (C) ලැබූ | | සාමාන්‍ය (S) ලැබූ | | සමත් (A+B+C+S) ලැබූ | | දුර්වල (W) ලැබූ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 3,262 | 316 | 9.69 | 770 | 23.61 | 1,080 | 33.11 | 805 | 24.68 | 2,971 | 91.08 | 291 | 8.92 |
| 2. ගම්පහ | 5,094 | 457 | 8.97 | 1,371 | 26.91 | 1,687 | 33.12 | 1,187 | 23.30 | 4,702 | 92.30 | 392 | 7.70 |
| 3. කළුතර | 3,396 | 475 | 13.99 | 963 | 28.36 | 979 | 28.83 | 703 | 20.70 | 3,120 | 91.87 | 276 | 8.13 |
| 4. මහනුවර | 4,632 | 356 | 7.69 | 1,287 | 27.78 | 1,588 | 34.28 | 1,072 | 23.14 | 4,303 | 92.90 | 329 | 7.10 |
| 5. මාතලේ | 2,002 | 257 | 12.84 | 600 | 29.97 | 676 | 33.77 | 386 | 19.28 | 1,919 | 95.85 | 83 | 4.15 |
| 6. නුවරඑළිය | 1,404 | 103 | 7.34 | 398 | 28.35 | 490 | 34.90 | 355 | 25.28 | 1,346 | 95.87 | 58 | 4.13 |
| 7. ගාල්ල | 4,304 | 434 | 10.08 | 1,408 | 32.71 | 1,343 | 31.20 | 815 | 18.94 | 4,000 | 92.94 | 304 | 7.06 |
| 8. මාතර | 3,242 | 552 | 17.03 | 1,101 | 33.96 | 874 | 26.96 | 501 | 15.45 | 3,028 | 93.40 | 214 | 6.60 |
| 9. හම්බන්තොට | 2,584 | 225 | 8.71 | 780 | 30.19 | 825 | 31.93 | 519 | 20.09 | 2,349 | 90.91 | 235 | 9.09 |
| 10. යාපනය | -00 | -00 | 0 | -00 | 0 | -00 | 0 | -00 | 0 | -00 | 0 | -00 | 0 |
| 11. මන්නාරම | -00 | -00 | 0 | -00 | 0 | -00 | 0 | -00 | 0 | -00 | 0 | -00 | 0 |
| 12. වව්නියාව | 108 | 13 | 12.04 | 27 | 25.00 | 31 | 28.70 | 31 | 28.70 | 102 | 94.44 | 6 | 5.56 |
| 13. මුලතිව් | 32 | 1 | 3.13 | 13 | 40.63 | 9 | 28.13 | 5 | 15.63 | 28 | 87.50 | 4 | 12.50 |
| 14. කිලිනොච්චි | -00 | -00 | 0 | -00 | 0 | -00 | 0 | -00 | 0 | -00 | 0 | -00 | 0 |
| 15. මඩකලපුව | -00 | -00 | 0 | -00 | 0 | -00 | 0 | -00 | 0 | -00 | 0 | -00 | 0 |
| 16. අම්පාර | 1,408 | 111 | 7.88 | 430 | 30.54 | 478 | 33.95 | 295 | 20.95 | 1,314 | 93.32 | 94 | 6.68 |
| 17. ත්‍රිකුණාමලය | 461 | 41 | 8.89 | 110 | 23.86 | 154 | 33.41 | 109 | 23.64 | 414 | 89.80 | 47 | 10.20 |
| 18. කුරුණෑගල | 5,920 | 741 | 12.52 | 1,970 | 33.28 | 1,871 | 31.60 | 1,080 | 18.24 | 5,662 | 95.64 | 258 | 4.36 |
| 19. පුත්තලම | 2,181 | 192 | 8.80 | 621 | 28.47 | 738 | 33.84 | 487 | 22.33 | 2,038 | 93.44 | 143 | 6.56 |
| 20. අනුරාධපුරය | 3,738 | 358 | 9.58 | 1,159 | 31.01 | 1,197 | 32.02 | 744 | 19.90 | 3,458 | 92.51 | 280 | 7.49 |
| 21. පොලොන්නරුව | 1,639 | 329 | 20.07 | 556 | 33.92 | 426 | 25.99 | 253 | 15.44 | 1,564 | 95.42 | 75 | 4.58 |
| 22. බදුල්ල | 2,710 | 272 | 10.04 | 845 | 31.18 | 947 | 34.94 | 518 | 19.11 | 2,582 | 95.28 | 128 | 4.72 |
| 23. මොණරාගල | 2,108 | 315 | 14.94 | 662 | 31.40 | 632 | 29.98 | 376 | 17.84 | 1,985 | 94.17 | 123 | 5.83 |
| 24. රත්නපුරය | 3,159 | 573 | 18.14 | 980 | 31.02 | 924 | 29.25 | 548 | 17.35 | 3,025 | 95.76 | 134 | 4.24 |
| 25. කෑගල්ල | 3,026 | 168 | 5.55 | 993 | 32.82 | 1,054 | 34.83 | 641 | 21.18 | 2,856 | 94.38 | 170 | 5.62 |
| සමස්ත දිවයින | **56,410** | **6,289** | **11.15** | **17,044** | **30.21** | **18,003** | **31.91** | **11,430** | **20.26** | **52,766** | **93.54** | **3,644** | **6.46** |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි.දෙ.

සිංහල විෂය සඳහා සමස්ත පාසල් අපේක්ෂකයන් 56,410ක් පෙනී සිට ඇති අතර ගම්පහ, කුරුණෑගල දිස්ත්‍රික්කවලින් අපේක්ෂකයන් 5000 ඉක්මවා මෙම විෂයය සඳහා පෙනී සිට ඇත. යාපනය, මන්නාරම, කිලිනොච්චිය හා මඩකලපුව දිස්ත්‍රික්කවලින් එකදු අපේක්ෂකයෙකුවත් ඉදිරිපත් වී නැත.

එක් එක් දිස්ත්‍රික්කවල සමත්වීමේ ප්‍රතිශත සලකා බැලීමේ දී මුලතිව් 87.50%ක් ද, ත්‍රිකුණාමලය 89.9%ක් ද, ලෙස සමත් වීමේ ප්‍රතිශතයක් ලැබී ඇති අතර අනෙකුත් සියලු දිස්ත්‍රික්කවල සමත්වීමේ ප්‍රතිශතය 90% ඉක්මවා ඇත. එම දිස්ත්‍රික්ක අතරින් ද, නුවරඑළිය (95.87%), මාතලේ (95.85%), කුරුණෑගල (95.64%), පොලොන්නරුව (95.42%), බදුල්ල (95.28%) රත්නපුර (95.76%) යන දිස්ත්‍රික්කවල සමත්වීමේ ප්‍රතිශතය 95% ඉක්මවා ඇත. සමස්ත දිවයිනේ පාසල් අපේක්ෂකයන්ගේ සමත් වීමේ ප්‍රතිශතය 93.54% වේ.

## 1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

වගුව 1.4 අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන (A) ලැබූ | | අධි සම්මාන (B) ලැබූ | | සම්මාන සම්මාන (C) ලැබූ | | සාමාන්‍ය සම්මාන (S) ලැබූ | | සමත් (A+B+C+S) ලැබූ | | දුර්වල (W) ලැබූ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 875 | 83 | 9.49 | 203 | 23.20 | 291 | 33.26 | 218 | 24.91 | 795 | 90.86 | 80 | 9.14 |
| 2. හෝමාගම | 566 | 32 | 5.65 | 127 | 22.44 | 193 | 34.10 | 162 | 28.62 | 514 | 90.81 | 52 | 9.19 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 1,118 | 125 | 11.18 | 268 | 23.97 | 387 | 34.62 | 261 | 23.35 | 1,041 | 93.11 | 77 | 6.89 |
| 4. පිළියන්දල | 703 | 76 | 10.81 | 172 | 24.47 | 209 | 29.73 | 164 | 23.33 | 621 | 88.34 | 82 | 11.66 |
| 5. ගම්පහ | 1,518 | 204 | 13.44 | 467 | 30.76 | 478 | 31.49 | 281 | 18.51 | 1,430 | 94.20 | 88 | 5.80 |
| 6 මිනුවන්ගොඩ | 1,349 | 124 | 9.19 | 402 | 29.80 | 432 | 32.02 | 295 | 21.87 | 1,253 | 92.88 | 96 | 7.12 |
| 7. මීගමුව | 1,093 | 52 | 4.76 | 244 | 22.32 | 374 | 34.22 | 310 | 28.36 | 980 | 89.66 | 113 | 10.34 |
| 8. කැලණිය | 1,134 | 77 | 6.79 | 258 | 22.75 | 403 | 35.54 | 301 | 26.54 | 1,039 | 91.62 | 95 | 8.38 |
| 9. කළුතර | 1,443 | 181 | 12.54 | 402 | 27.86 | 430 | 29.80 | 298 | 20.65 | 1,311 | 90.85 | 132 | 9.15 |
| 10. මතුගම | 738 | 167 | 22.63 | 230 | 31.17 | 178 | 24.12 | 116 | 15.72 | 691 | 93.63 | 47 | 6.37 |
| 11. හොරණ | 1,215 | 127 | 10.45 | 331 | 27.24 | 371 | 30.53 | 289 | 23.79 | 1,118 | 92.02 | 97 | 7.98 |
| 12. මහනුවර | 1,946 | 214 | 11.00 | 631 | 32.43 | 569 | 29.24 | 420 | 21.58 | 1,834 | 94.24 | 112 | 5.76 |
| 13. දෙනුවර | 367 | 11 | 3.00 | 90 | 24.52 | 138 | 37.60 | 104 | 28.34 | 343 | 93.46 | 24 | 6.54 |
| 14. ගම්පොළ | 656 | 25 | 3.81 | 174 | 26.52 | 271 | 41.31 | 152 | 23.17 | 622 | 94.82 | 34 | 5.18 |
| 15. තෙල්දෙණිය | 461 | 30 | 6.51 | 94 | 20.39 | 177 | 38.39 | 114 | 24.73 | 415 | 90.02 | 46 | 9.98 |
| 16. වත්තේගම | 485 | 44 | 9.07 | 123 | 25.36 | 185 | 38.14 | 96 | 19.79 | 448 | 92.37 | 37 | 7.63 |
| 17. කටුගස්තොට | 717 | 32 | 4.46 | 175 | 24.41 | 248 | 34.59 | 186 | 25.94 | 641 | 89.40 | 76 | 10.60 |
| 18. මාතලේ | 962 | 204 | 21.21 | 337 | 35.03 | 253 | 26.30 | 139 | 14.45 | 933 | 96.99 | 29 | 3.01 |
| 19. ගලේවෙල | 624 | 31 | 4.97 | 145 | 23.24 | 254 | 40.71 | 156 | 25.00 | 586 | 93.91 | 38 | 6.09 |
| 20. නාඋල | 160 | 6 | 3.75 | 45 | 28.13 | 66 | 41.25 | 35 | 21.88 | 152 | 95.00 | 8 | 5.00 |
| 21. විල්ගමුව | 256 | 16 | 6.25 | 73 | 28.52 | 103 | 40.23 | 56 | 21.88 | 248 | 96.88 | 8 | 3.13 |
| 22. නුවරඑළිය | 138 | 4 | 2.90 | 28 | 20.29 | 55 | 39.86 | 45 | 32.61 | 132 | 95.65 | 6 | 4.35 |
| 23. කොත්මලේ | 275 | 31 | 11.27 | 89 | 32.36 | 86 | 31.27 | 59 | 21.45 | 265 | 96.36 | 10 | 3.64 |
| 24. හැටන් | 243 | 34 | 13.99 | 77 | 31.69 | 75 | 30.86 | 47 | 19.34 | 233 | 95.88 | 10 | 4.12 |
| 25. වලපනේ | 317 | 16 | 5.05 | 95 | 29.97 | 123 | 38.80 | 73 | 23.03 | 307 | 96.85 | 10 | 3.15 |
| 26. හඟුරන්කෙත | 431 | 18 | 4.18 | 109 | 25.29 | 151 | 35.03 | 131 | 30.39 | 409 | 94.90 | 22 | 5.10 |
| 27. ගාල්ල | 2,035 | 199 | 9.78 | 665 | 32.68 | 664 | 32.63 | 372 | 18.28 | 1,900 | 93.37 | 135 | 6.63 |
| 28. ඇල්පිටිය | 927 | 109 | 11.76 | 334 | 36.03 | 259 | 27.94 | 167 | 18.02 | 869 | 93.74 | 58 | 6.26 |
| 29. අම්බලන්ගොඩ | 766 | 70 | 9.14 | 241 | 31.46 | 224 | 29.24 | 157 | 20.50 | 692 | 90.34 | 74 | 9.66 |
| 30. උඩුගම | 576 | 56 | 9.72 | 168 | 29.17 | 196 | 34.03 | 119 | 20.66 | 539 | 93.58 | 37 | 6.42 |
| 31. මාතර | 1,155 | 144 | 12.47 | 377 | 32.64 | 351 | 30.39 | 198 | 17.14 | 1,070 | 92.64 | 85 | 7.36 |
| 32. අකුරැස්ස | 537 | 80 | 14.90 | 191 | 35.57 | 165 | 30.73 | 72 | 13.41 | 508 | 94.60 | 29 | 5.40 |
| 33. මුලටියන-හක්මණ | 784 | 99 | 12.63 | 283 | 36.10 | 204 | 26.02 | 139 | 17.73 | 725 | 92.47 | 59 | 7.53 |
| 34. මොරවක-දෙනියාය | 766 | 229 | 29.90 | 250 | 32.64 | 154 | 20.10 | 92 | 12.01 | 725 | 94.65 | 41 | 5.35 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන (A) ලැබූ | | අධි සම්මාන (B) ලැබූ | | සම්මාන (C) ලැබූ | | සාමාන්‍ය (S) ලැබූ | | සමත් (A+B+C+S) ලැබූ | | දුර්වල (W) ලැබූ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 35. තංගල්ල | 731 | 70 | 9.58 | 250 | 34.20 | 234 | 32.01 | 117 | 16.01 | 671 | 91.79 | 60 | 8.21 |
| 36. හම්බන්තොට | 962 | 52 | 5.41 | 225 | 23.39 | 325 | 33.78 | 245 | 25.47 | 847 | 88.05 | 115 | 11.95 |
| 37. වලස්මුල්ල | 891 | 103 | 11.56 | 305 | 34.23 | 266 | 29.85 | 157 | 17.62 | 831 | 93.27 | 60 | 6.73 |
| 38. යාපනය | -00 | -00 | 0 | -00 | 0 | 0 | 0.00 | 0 | 0 | -00 | 0 | 0 | 0 |
| 39. දූපත් | -00 | -00 | 0 | -00 | 0 | 0 | 0.00 | 0 | 0 | -00 | 0 | 0 | 0 |
| 40. තෙන්මාරච්චි | -00 | -00 | 0 | -00 | 0 | 0 | 0.00 | 0 | 0 | -00 | 0 | 0 | 0 |
| 41. වලිකාමම් | -00 | -00 | 0 | -00 | 0 | 0 | 0.00 | 0 | 0 | -00 | 0 | 0 | 0 |
| 42. වඩමාරච්චි | -00 | -00 | 0 | -00 | 0 | 0 | 0.00 | 0 | 0 | -00 | 0 | 0 | 0 |
| 43. කිලිනොච්චි දකුණ | 48 | 1 | 2.08 | 16 | 33.33 | 13 | 27.08 | 17 | 35.42 | 47 | 97.92 | 1 | 2.08 |
| 44. කිලිනොච්චි උතුර | 13 | 6 | 46.15 | 3 | 23.08 | 3 | 23.08 | 1 | 7.69 | 13 | 100.00 | 0 | 0.00 |
| 45. මන්නාරම | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 46. මඩු | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 47. වව්නියාව දකුණ | 47 | 6 | 12.77 | 8 | 17.02 | 15 | 31.91 | 13 | 27.66 | 42 | 89.36 | 5 | 10.64 |
| 48. වව්නියාව උතුර | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 49. මුලතිව් | 32 | 1 | 3.13 | 13 | 40.63 | 9 | 28.13 | 5 | 15.63 | 28 | 87.50 | 4 | 12.50 |
| 50. තුනුක්කායි | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 51. මඩකලපුව | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 52. කල්කුඩා | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 53. පදිරිප්පු | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 54. මඩකලපුව මධ්‍යම | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 55. මඩකලපුව බටහිර | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 56. අම්පාර | 764 | 42 | 5.50 | 225 | 29.45 | 299 | 39.14 | 162 | 21.20 | 728 | 95.29 | 36 | 4.71 |
| 57. කල්මුනේ | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0 | -00 | 0.00 | 0 | 0.00 |
| 58. සමන්තුරෙයි | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0 | -00 | 0.00 | 0 | 0.00 |
| 59. මහඔය | 273 | 23 | 8.42 | 76 | 27.84 | 87 | 31.87 | 63 | 23.08 | 249 | 91.21 | 24 | 8.79 |
| 60. දෙහිඅත්තකණ්ඩිය | 371 | 46 | 12.40 | 129 | 34.77 | 92 | 24.80 | 70 | 18.87 | 337 | 90.84 | 34 | 9.16 |
| 61. අක්කරෙයිපත්තුව | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 62. තිරුක්කෝවිල් | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 63. ත්‍රිකුණාමලය | 62 | 5 | 8.06 | 12 | 19.35 | 25 | 40.32 | 16 | 25.81 | 58 | 93.55 | 4 | 6.45 |
| 64. මුතූර් | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 65. කන්තලේ | 281 | 17 | 6.05 | 66 | 23.49 | 94 | 33.45 | 72 | 25.62 | 249 | 88.61 | 32 | 11.39 |
| 66. කින්නියා | -00 | -00 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | -00 | 0.00 | 0 | 0.00 |
| 67. ත්‍රිකුණාමලය උතුර | 118 | 19 | 16.10 | 32 | 27.12 | 35 | 29.66 | 21 | 17.80 | 107 | 90.68 | 11 | 9.32 |
| 68. කුරුණෑගල | 1,160 | 233 | 20.09 | 450 | 38.79 | 300 | 25.86 | 143 | 12.33 | 1,126 | 97.07 | 34 | 2.93 |
| 69. කුලියාපිටිය | 1,058 | 85 | 8.03 | 365 | 34.50 | 332 | 31.38 | 220 | 20.79 | 1,002 | 94.71 | 56 | 5.29 |
| 70. නිකවැරටිය | 818 | 102 | 12.47 | 250 | 30.56 | 265 | 32.40 | 153 | 18.70 | 770 | 94.13 | 48 | 5.87 |
| 71. මහව | 1,196 | 163 | 13.63 | 396 | 33.11 | 370 | 30.94 | 212 | 17.73 | 1,141 | 95.40 | 55 | 4.60 |
| 72. ගිරිඋල්ල | 941 | 52 | 5.53 | 269 | 28.59 | 371 | 39.43 | 214 | 22.74 | 906 | 96.28 | 35 | 3.72 |
| 73. ඉබ්බාගමුව | 747 | 106 | 14.19 | 240 | 32.13 | 233 | 31.19 | 138 | 18.47 | 717 | 95.98 | 30 | 4.02 |
| 74. පුත්තලම | 958 | 52 | 5.43 | 277 | 28.91 | 327 | 34.13 | 231 | 24.11 | 887 | 92.59 | 71 | 7.41 |
| 75. හලාවත | 1,223 | 140 | 11.45 | 344 | 28.13 | 411 | 33.61 | 256 | 20.93 | 1,151 | 94.11 | 72 | 5.89 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන (A) ලැබූ | | අධි සම්මාන (B) ලැබූ | | සම්මාන (C) ලැබූ | | සාමාන්‍ය (S) ලැබූ | | සමත් (A+B+C+S) ලැබූ | | දුර්වල (W) ලැබූ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 76. අනුරාධපුරය | 1,158 | 98 | 8.46 | 413 | 35.66 | 376 | 32.47 | 186 | 16.06 | 1,073 | 92.66 | 85 | 7.34 |
| 77. තඹුත්තේගම | 674 | 66 | 9.79 | 195 | 28.93 | 217 | 32.20 | 150 | 22.26 | 628 | 93.18 | 46 | 6.82 |
| 78. කැකිරාව | 800 | 95 | 11.88 | 230 | 28.75 | 249 | 31.13 | 172 | 21.50 | 746 | 93.25 | 54 | 6.75 |
| 79. ගලෙන්බිදුණුවැව | 594 | 44 | 7.41 | 169 | 28.45 | 193 | 32.49 | 134 | 22.56 | 540 | 90.91 | 54 | 9.09 |
| 80. කැබිතිගොල්ලෑව | 512 | 55 | 10.74 | 152 | 29.69 | 162 | 31.64 | 102 | 19.92 | 471 | 91.99 | 41 | 8.01 |
| 81. පොලොන්නරුව | 416 | 101 | 24.28 | 133 | 31.97 | 103 | 24.76 | 59 | 14.18 | 396 | 95.19 | 20 | 4.81 |
| 82. හිඟුරක්ගොඩ | 758 | 151 | 19.92 | 257 | 33.91 | 198 | 26.12 | 117 | 15.44 | 723 | 95.38 | 35 | 4.62 |
| 83. දිඹුලාගල | 465 | 77 | 16.56 | 166 | 35.70 | 125 | 26.88 | 77 | 16.56 | 445 | 95.70 | 20 | 4.30 |
| 84. බදුල්ල | 483 | 33 | 6.83 | 155 | 32.09 | 174 | 36.02 | 100 | 20.70 | 462 | 95.65 | 21 | 4.35 |
| 85. බණ්ඩාරවෙල | 589 | 25 | 4.24 | 143 | 24.28 | 216 | 36.67 | 147 | 24.96 | 531 | 90.15 | 58 | 9.85 |
| 86. මහියංගනය | 604 | 45 | 7.45 | 205 | 33.94 | 224 | 37.09 | 103 | 17.05 | 577 | 95.53 | 27 | 4.47 |
| 87. වැලිමඩ | 610 | 114 | 18.69 | 201 | 32.95 | 178 | 29.18 | 103 | 16.89 | 596 | 97.70 | 14 | 2.30 |
| 88. පස්සර | 145 | 20 | 13.79 | 54 | 37.24 | 53 | 36.55 | 15 | 10.34 | 142 | 97.93 | 3 | 2.07 |
| 89. වියලුව | 279 | 35 | 12.54 | 87 | 31.18 | 102 | 36.56 | 50 | 17.92 | 274 | 98.21 | 5 | 1.79 |
| 90. මොනරාගල | 663 | 70 | 10.56 | 194 | 29.26 | 221 | 33.33 | 136 | 20.51 | 621 | 93.67 | 42 | 6.33 |
| 91. වැල්ලවාය | 450 | 74 | 16.44 | 149 | 33.11 | 139 | 30.89 | 64 | 14.22 | 426 | 94.67 | 24 | 5.33 |
| 92. බිබිල | 670 | 107 | 15.97 | 209 | 31.19 | 187 | 27.91 | 125 | 18.66 | 628 | 93.73 | 42 | 6.27 |
| 93. තණමල්විල | 325 | 64 | 19.69 | 110 | 33.85 | 85 | 26.15 | 51 | 15.69 | 310 | 95.38 | 15 | 4.62 |
| 94. රත්නපුර | 1,170 | 202 | 17.26 | 374 | 31.97 | 348 | 29.74 | 203 | 17.35 | 1,127 | 96.32 | 43 | 3.68 |
| 95. බලන්ගොඩ | 565 | 58 | 10.27 | 156 | 27.61 | 195 | 34.51 | 130 | 23.01 | 539 | 95.40 | 26 | 4.60 |
| 96. නිවිතිගල | 513 | 88 | 17.15 | 162 | 31.58 | 150 | 29.24 | 94 | 18.32 | 494 | 96.30 | 19 | 3.70 |
| 97. ඇඹිලිපිටිය | 911 | 225 | 24.70 | 288 | 31.61 | 231 | 25.36 | 121 | 13.28 | 865 | 94.95 | 46 | 5.05 |
| 98. කෑගල්ල | 1,300 | 85 | 6.54 | 475 | 36.54 | 450 | 34.62 | 239 | 18.38 | 1,249 | 96.08 | 51 | 3.92 |
| 99. මාවනැල්ල | 1,050 | 52 | 4.95 | 290 | 27.62 | 371 | 35.33 | 254 | 24.19 | 967 | 92.10 | 83 | 7.90 |
| 100. දෙහිඕවිට | 676 | 31 | 4.59 | 228 | 33.73 | 233 | 34.47 | 148 | 21.89 | 640 | 94.67 | 36 | 5.33 |
| සමස්ත දිවයින | 56,410 | 6,289 | 11.15 | 17,044 | 30.21 | 18,003 | 31.91 | 11,430 | 20.26 | 52,766 | 93.54 | 3,644 | 6.46 |

**මූලාශ්‍රය** : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි.දෙ.

2020 අ.පො.ස උසස් පෙළ විභාගයේ දී අධ්‍යාපන කලාප 100න් 20ක සිංහල විෂයය සඳහා එකදු අපේක්ෂකයෙකු හෝ පෙනී සිට නැත. අපේක්ෂකයන් මෙම විෂයය සඳහා පෙනී සිට ඇති අධ්‍යාපන කලාප 80න් 46ක් දිවයිනේ සමත් ප්‍රතිශතය වන 93.54% ඉක්මවූ සමත් ප්‍රතිශතයක් වාර්තා කර ඇත. වැඩි ම අපේක්ෂකයන් ප්‍රමාණයක් ගාල්ල අධ්‍යාපන කලාපයෙන් විභාගයට පෙනී සිට ඇති අතර අඩු ම අපේක්ෂකයන් ප්‍රමාණයක් ත්‍රිකුණාමලය උතුර අධ්‍යාපන කලාපයෙන් පෙනී සිට ඇත.

## 1.2.5 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

### වගුව 1.5
### පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 0 | 0.00 | 64,234 | 100.00 |
| 81 - 90 | 601 | 0.94 | 64,234 | 100.00 |
| 71 - 80 | 7276 | 11.33 | 63,633 | 99.06 |
| 61 - 70 | 15397 | 23.97 | 56,357 | 87.74 |
| 51 - 60 | 16220 | 25.25 | 40,960 | 63.77 |
| 41 - 50 | 13340 | 20.77 | 24,740 | 38.52 |
| 31 - 40 | 8371 | 13.03 | 11,400 | 17.75 |
| 21 - 30 | 2631 | 4.10 | 3,029 | 4.72 |
| 11 - 20 | 312 | 0.49 | 398 | 0.62 |
| 00 - 10 | 86 | 0.13 | 88 | 0.13 |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි.දෙ.

වැඩිම අපේක්ෂකයන් පිරිසක් ලකුණු ලබාගෙන ඇත්තේ 31- 40 පන්ති ප්‍රාන්තරයේ ය. 91 -100 පන්ති ප්‍රාන්තරයේ කිසිදු අපේක්ෂකයෙකු ලකුණු ලබාගෙන නොමැති අතර ලකුණු 0 ලබාගත් අපේක්ෂකයන් දෙදෙනෙකු සිටීම විශේෂත්වයකි.

## II කොටස

## 2. ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - I පත්‍රය

### 2.1 සිංහල I ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය - කාලය පැය 03යි. (ඊට අමතර ව කියවීම කාලය මිනිත්තු 10යි.)**

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

පළමු ප්‍රශ්නය - මෙම ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විත වේ.

| | | |
|---|---|---|
| (අ - ඉ) | අවබෝධය | ලකුණු 16 |
| (ඊ) | අවස්ථා සම්බන්ධය | ලකුණු 12 |
| (උ) | රසාස්වාදය | ලකුණු 12 |
| | | ලකුණු 40 |

ප්‍රශ්න අංක 02 සිට 08 තෙක් ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සකස් කරනු ලබන අතර ඉන් හතරකට පිළිතුරු සැපයිය යුතු ය. මෙහි එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60කි.

I පත්‍රය සඳහා මුළු ලකුණු = 40 + 60 = 100

මූලාශ්‍රය : අ.පො.ස (උ.පෙළ) විභාගය - 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න

## 2.2 I පත්‍රයේ විශ්ලේෂණය

ප්‍රස්තාරය 2.1

II පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය සහ එක් එක් ප්‍රශ්නයේ පහසුතාව




මූලාශ්‍රය : RD/ 16/03/04 /AL/ සහ RD/16/04/AL පත්‍රිකාවලින් පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි.දෙ.

මෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වූවකි. දෙවන ප්‍රශ්නයේ සිට අටවන ප්‍රශ්නය තෙක් ප්‍රශ්නවලින් හතරක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය. අපේක්ෂකයන් වැඩි පිරිසක් තෝරා ගෙන ඇත්තේ 2, 3, 5 හා 8 යන ප්‍රශ්න යි. ඒවායේ පහසුතාව පිළිවෙළින් 53%, 69%, 43% හා 53% වේ. සියලුම ප්‍රශ්න අතුරින් වැඩි ම පහසුතා අගය ඇත්තේ 3 ප්‍රශ්නයෙහි (69%) වන අතර අඩු ම පහසුතා අගය වන 36% 4 ප්‍රශ්නය සඳහාය. අපේක්ෂකයන්ගෙන් 23%ක් තෝරාගෙන ඇති ප්‍රශ්නයෙහි පහසුතාව 47%කි.

**ප්‍රස්තාරය 2.2**

පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය




මූලාශ්‍රය : RD/ 16/03/AL/ පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි. දෙ.

මෙම ප්‍රස්තාරයෙන් 2, 4, 5, 6 ප්‍රශ්න සඳහා අපේක්ෂකයන් වැඩි ප්‍රතිශතයක් ලකුණු ලබාගෙන ඇත්තේ එම ප්‍රශ්න සඳහා වෙන්කළ ලකුණින් 26 -50% පන්ති ප්‍රාන්තරය තුළ ය. 1,3,7,8 ප්‍රශ්න සඳහා අපේක්ෂකයන් වැඩි ප්‍රතිශතය ලකුණු ලබාගෙන ඇත්තේ එම ප්‍රශ්න සඳහා වෙන්කළ ලකුණින් 51-75% පන්ති ප්‍රාන්තරය තුළ ය.

**ප්‍රස්තාරය 2.3**

I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/ 16/04/AL/ පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි. දෙ.

## 2.3 I පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා සුවිශේෂී නිරීක්ෂණ සහ නිර්දේශ

### 2.3.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර

**උපදෙස්:**
✳ **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන **(අ)**, **(ආ)**, **(ඉ)**, **(ඊ)** හා **(උ)** උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද **(ඌ)** හා **(එ)** ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

**(අ)** 'පුතණ්ඩ, එසේ සිතන්නේ හැයි ද? මුඹ වර්ධන ව සිටියවුන් හෙයින් ගෙයි තබාගෙන හිඳුමෝ ද? ජාති ආදීන් සරි සාමාන්‍ය තැනකට පාවාදියහැක්කැ'යි කිවුය. 'අපට අනික් කවුරුනුත් නොකැමැත්තේ මුන් නොලදොත් මියමී' කිවුය. මැණියෝ නොයෙක් ලෙස කියාත් ගිවිස්වාගත නොහී පියාණන්ට කිවුය. උයිත් කියා ගිවිස්වාගත නොහී කළමනා කිම් දෝහෝ යි සිතා ඒ සොරු මරන්ට ගෙනයන තැනැත්තවුන්ට මසු දහසක් සොරා යවා 'තෙලෙ හැරගෙන තුලූ නොමරා අපට එවුවමැනවැ'යි කියා යවූය. එයිත් ගිවිස උං සිටාණන්ට හැරලා අනිකකු මරාපියා 'සොරු මරාපීම්හ'යි රජ්ජුරුවන්ට කිවුය. සිටාණෝත් තමන්ගේ දුවණියන් **අර්ථී ව** උං ම කැමති හෙයින් මරණින් ගැලවුණු තැනැත්තවුට සරණපාවා දුන්හ.

(i) සොරා මරන්නට ගෙන යන්නවුන්ට මසු දහසක් දෙන ලද්දේ කවුරුන් විසින් ද?

(ii) මසු දහසක් ලබා දීමෙන් අපේක්ෂා කළේ කුමක් ද?

(iii) "තෙලෙ හැරගෙන තුලූ නොමරා අපට එවුවමැනවැ" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**අර්ථී ව**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

**පිළිතුරු:**

**(i) කුණ්ඩලකේසිගේ පියා/තාත්තා/අප්පච්චි/විසින් ('සිටුවරයා' යනුවෙන් ලියා ඇත් නම් ලකුණු පිරිනමන්න)**

**(ii) සොරා නොමරා /මරණයට පත් නො කොට ආපසු තමන් වෙත ගෙන්වා ගැනීම; සොරා බේරා ගැනීම**

**(iii) මෙය රැගෙන/ ඇර ගෙන/ ඇරැ ගෙන/හැර ගෙන/ හැරැ ගෙනැ/ගෙන/ ඔහු නොමරා අප වෙත එවන්න/ අපට ලබා දෙන්න.**

**(iv) අර්ථය අපේක්ෂාවෙන්, යහපත පිණිස, හිත පිණිස, හිතවැඩ පිණිස**

**(ලකුණු 01 x 4 = 04 යි.)**

**(ආ)** "වෛද්‍යශිල්පය හදාරා ගතිම් නම් වෛද්‍යාචාරිය යන නම ඇසූ කල ම සත්ත්වයෝ මවුන් පියන් ගුරුන් කොට ම සිතා ඔවුන් කෙරෙහි ප්‍රිය ඇති වන්නාහුය. වෛද්‍යශාස්ත්‍රය නම් දතුවාහට මෙලොවත් වැඩ වෙයි. පරලොවත් වැඩ වෙයි. පින් වෙයි. එසේ හෙයින් වෛද්‍යශාස්ත්‍රය ම උගන්මි"යි සිතා තක්සලා නුවර ගොස් දිසාපාමොක් ආචාරීන් දැක තමන් ආ පවත් කියා සිටියහ. ආචාරි "තෙපි කවුරු දැ"යි විචාළහ. "අනිකක් කීම් නම් මා කෙරෙහි ආදර නොකරති"යි සිතා "රජගහ නුවර බිම්බිසාර රජ්ජුරුවන්ගේ මුනුබුරාණෙමි. අභය නම් රාජකුමාරයන් පුතණුයෙමි"යි කීහ. "කුමන ශාස්ත්‍රයක් උගනුදැ"යි විචාළහ. "වෛද්‍යශාස්ත්‍රය උගනිමි"යි කීහ. ආචාරීහු "ආචාරිභාගය ගෙනාවු දැ"යි විචාළහ. "දෙමවුපියන්ට නොකියා ශිල්පලෝභයෙන් **සොරා අයිමි**. එසේ හෙයින් ආචාරිභාගය නොගෙනායෙමි. නුඹවහන්සේට මෙහෙ කොට ධර්මාන්තේවාසිකව ශිල්ප හදාරමි"යි කීහ.

(i) වෛද්‍ය ශිල්පය හැදෑරීමෙන් ලැබෙන එල **දෙකක්** ලියන්න.

(ii) ශිල්ප ඉගැන්වීම සඳහා දිසාපාමොක් ආචාර්යවරයා ශිෂ්‍යයන්ගෙන් අපේක්ෂා කළේ කුමක් ද?

(iii) "නුඹවහන්සේට මෙහෙ කොට ධර්මාන්තේවාසිකව ශිල්ප හදාරමි." මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**සොරා අයිමි**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

පිළිතුරු:

(i) 1. දෙමව්පියන් ගුරුන් සේ සලකා/ සිතා ඔවුන් (වෛද්‍යවරුන්) කෙරෙහි ප්‍රසාදය ඇති කර ගැනීම

2. මෙලොව සහ පරලොව යහපත (මෙලොව, පරලොව කරුණු දෙකක් වශයෙන් ගෙන තිබුණ ද ලකුණු ප්‍රදානය කරන්න)

3. පින් ඇති වීම (මෙයින් දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත් ය.)

(ii) ගුරු පඬුරු (ආචාර්යභාගය)/ ගුරුවරයාට මෙහෙ කිරීම

(iii) ඔබතුමාට සේවය/ බැළ මෙහෙවර කොට ධර්මයට අනුකූල ව ශාස්ත්‍ර උගනිමි/ ළඟ නැවතී උගනිමි/ ධර්මයෙහි හැසිරෙමි

(iv) (දෙමව්පියන්ගෙන් අවසර නොගෙන) රහසේ/ සොරෙන්/ හොරෙන්/ නොදන්වා පැමිණියෙමි

(ඉ) එසඳ බරණැස් රජ්ජුරුවෝ ඒ ගායනා ශබ්දය අසා පියසන් නොඇසෙන සේ සෙමෙන් සෙමෙන් අවුදින් ලියකිඳුරාණන් උන් නියාව ද නටමින් සිටි කිඳුරාඞ්ගනාවන් ද දැක පිළිබඳ වූ සිත් ඇති ව "මේ කිඳුරා විද දිවි තොර කොට මැ හා සමඟ වාසය කෙළෙම් නම් යහපතැ" යි සිතා සැඟවී සිට කිඳුරාට හීයක් විද්දේය. ඒ ශර ප්‍රහාරයෙන් වෑහෙන්නා වූ ලේ දියෙන් මහත් වේදනාවෙන් මඩනා ලදුව හඬන්නේය. "සඬඳ චන්ද්‍රිකාව මේ මාගේ ජීවිතය තව ද ආයු ඇති ව තිබිය දී සන්තතිවිච්ඡේදයෙන් නැසෙමි යි සිතමි. එබැවින් මම තිගේ ක්‍රීඩා විනෝදයෙහි නොඇලෙමි. ලද ශර ප්‍රහාරයෙන් වෑහෙන්නා වූ ලෙහෙයෙන් රැඳී ඔත්තා වූ හා මාගේ ජීවිතය නොබෝ කලකින් කඳ සැඟවෙන්නේය. කකියා ගිය තලතෙලක ලූ තණ සෙයින් ද මුලින් සිඳ හෙලූ ගසක් සෙයින් ද නියං සමයෙහි පැන් සිඳී වියළී ගිය මළ **හෝකඳුරක්** සෙයින් ජීවිත විනාශයට පැමිණෙන සේ බලව." පර්වතයක්හි වසන ලදුව ක්ෂණ ක්ෂණයෙහි වැහෙන්නා වූ වර්ෂා ජල ධාරාවක් සෙයින්ද කඳුළු වැහෙන්නට පටන් ගත්තේය.

(i) බරණැස් රජු කිඳුරාගේ දිවි තොර කිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(ii) කිඳුරා ක්‍රීඩා විනෝදයෙහි ඇලීම ප්‍රතික්ෂේප කළේ ඇයි?

(iii) "පියසන් නොඇසෙන සේ සෙමෙන් සෙමෙන් අවුදින්" මෙය ලිඛිල් බසින් ලියන්න.

(iv) '**හෝකඳුරක්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

පිළිතුරු:

(i) කිඳුරිය ලබා ගැනීම/ කිඳුරා මරා කිඳුරිය සමඟ එක් ව විසීම/ කිඳුරිය පිළිබඳ ව ඇති කර ගත් රාගය/ කැමැත්ත නිසා

(ii) තවත් ජීවත් වන්නට කල් තිබියදී අකල් මරණයකට ගොදුරු වන්නට සිදු වූ බව දැනුණු හෙයින්/ ආයුෂ ඇති ව තිබිය දී කිඳුරාගේ ජීවිතය නැති ව යන නිසා

(iii) පා ගැටෙන හඬ/ පියවර හඬ/ අඩි ශබ්දය නොඇසෙන පරිදි සෙමින් පැමිණ

(iv) කුඩා දිය පහරක්

(ලකුණු 01 x 4 = 04 යි.)

(ඊ) ඒ කුමාරිකාවන්ගේ මෑණියෝ අවුත් තමන් දියණියන් මලස්න ශුද්ධ නොකොට මල් පිදූ බව දැක "එම්බල චණ්ඩාල කෙල්ල, අත්‍යන්ත නිර්මල වූ බුදුරජාණන් වහන්සේට මලස්න නොසෝධා කුමක් පිණිස මල් පිදී ද; තී කෙළේ කටයුත්තෙක් නොවේ"යි කීහ. ඒ අසා කුමාරිකාවෝ මෑණියන්ට කිපී "චණ්ඩාලකෙලි නම් තෙපි ම යැ"යි කියා තමන් මෑණියන්ට බිණුහ. මෙසේ ඒ කුමාරිකාවෝ මෙපමණ කුසල් අකුසල් කොට මැතභාගයෙහි එයින් චුත ව දඹදිව උත්තර මධුරා නම් නුවර වීණා ගායනා කරන එක්තරා චණ්ඩාල බ්‍රාහ්මණයක්හට දුව උපන්හ; එකල්හි පළමු කළ ප්‍රාර්ථනා වූ පරිද්දෙන් විශිෂ්ට වූ රූ ඇති වූහ; ඔවුන්ගේ **සියලඟින්** විදුලිය කළඹක් වැනි රශ්මි මාලා සමූහයෝ නික්මෙති; හාත්පසින් සතර රියන් පමණ තන්හි ශරීරාලෝකයෙන් ම අන්ධකාර දුරු ව එකාලොක වෙයි; මුඛයෙන් මහනෙල්මල් සුවඳ හමා බස්සී; ශරීරයෙන් සඳුන් සුවඳ වහනය වෙයි; ඔවුන් දෙතන මැද රන්වන් වූ තිලකාභරණයෙක් මැවිණ; ඒ තිලකාභරණයෙන් අභිනව බාලාර්ක මණ්ඩලය සේ රශ්මි සමූහයෝ නික්මෙති.

(i) මෑණියන් දියණියන්ට දෝෂාරෝපණය කළ හේතුව කුමක් ද?

(ii) දියණියන් චණ්ඩාල කුලයෙහි ඉපදීමට හේතු වූ අකුශලය දක්වන්න.

(iii) "අභිනව බාලාර්ක මණ්ඩලය සේ" මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**සියලඟින්**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

පිළිතුරු:

(i) මල් ආසනය නොසෝදා/ පිරිසිදු නොකොට මල් පිදූ නිසා/ මල් පූජා කළ බව දැකීම

(ii) මවට චණ්ඩාල කෙල්ල යැයි ඇමතීම/ මෑණියන්ට කිපී "චණ්ඩාල කෙල්ල නම් තෙපි" යැයි බැණ වැදීම

(iii) අලුතින් පායා එන/ පෑයූ ළහිරු මඬල සේ

(iv) සකලාංගයෙන්/ සියල් සිරුරෙන්/ මුළු මහත් ශරීරයෙන්

**(ලකුණු 01 x 4 = 04 යි.)**

(උ)

සු ව ඳ කුසුම් වරලසෙ හී
පැ ල ඳ කපුරු හර උරෙ හී
නොමඳ බරණ ලා සැර හී
නි බ ඳ කෙළිති ලියො පුරෙ හී

ප සු ක ර රුසිරෙන් සුර ඹා
ගොස කර රන්මිණි සල ඹා
එ නු ව ර කෙළි රඟ පුර ඹා
බ ඹ ස ර සිත වත් කල ඹා

(i) ස්ත්‍රීන් අලංකාර කර ගත් ශරීරාංග **දෙක** කවරේ ද?

(ii) බඹසර සිත කැලඹීමට හේතු වූ කාරණය කුමක් ද?

(iii) "ප සු ක ර රුසිරෙන් සුර ඹා
ගොස කර රන්මිණි සල ඹා"
මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**නොමඳ බරණ**' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

පිළිතුරු:

(i) (අ) කේශ කලාපය/ කොණ්ඩය/ කෙස් කලඹ/ කෙස් වැටිය/ මුහුලස

(ආ) ළැම පෙදෙස/ පපු පෙදෙස/ වක්ෂස්තලය/ ළපැත්ත

(ii) ඒ පුරයේ/ නගරයේ ස්ත්‍රීන්ගේ/ ළඳුන්ගේ/ පුරාංගනාවන්ගේ/පුරඟනන්ගේ ක්‍රීඩා විලාසය/ නැටුම් විලාසය

(iii) රූපශ්‍රීයෙන්/ රූප ලාවණ්‍යයෙන්/ රූ සිරියෙන් දිව්‍ය ස්ත්‍රීන්/දෙවඟනන්/ දිව ළඳුන් පරාජය කර/ පසු බස්වා/ පරදවා රතින් කළ මිණි සළඹ (පාද වළලු) නාද කර/ නද කර/ ගොස කර/ හඬ නංවා

(iv) බොහෝ ආභරණ / නොයෙක් ආභරණ

(ලකුණු 01 x 4 = 04 යි.)

- (ඊ) සහ (එ) ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

(ඊ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "උන්ට පිදේනියක් දෙන්ට නැති හෙයින් මුසුප්පුයෙමි"

(ii) "වඩු රියන් උස කැකුළු ඇති මහරත්හලියකින් බත් උපදින්නේය"

(iii) "සොඳුර, තොප ඉණෙ තුබූ ඉණකඩින් තොප පලන් ආභරණ ගලවා බැඳ දී ලන්න"

(iv) "එම්බා නැගණියෙනි, මේ අනුන් සන්තක වස්තුවෙහි වරදවා පිළිපදනේය"

(v) "ඒක් ඒක මහ විපත්තියක් නේ! නන්නාඳුනන රටක නන්නාඳුනන මිනිස්සුත් එක්ක ඉන්න එක"

(vi) "උසුළු විසුළු නොකරනු මැන
පෙම්බර මා සමිඳාණෙනි"

(vii) "වතුර පැහෙනවා, තේ කෝප්පයක් වක්කරන්ඩ ද? කෝපි කෝප්පයක් හදන්ඩ ද?"

(ලකුණු 03 x 4 = 12 යි.)

පිළිතුරු:

(i) ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ කුණ්ඩලකේසිගේ වස්තුවෙන් උපුටා ගත් පාඨයකි.

කුණ්ඩලකේසි මරා ඇයගේ ආභරණ ගෙන විකුණා ජීවත් වීමට උපක්‍රමයක් සිතමින් සිටි සොරාගෙන් කණගාටුවෙන් සිටීමට හේතු විමසූ කුණ්ඩලකේසියට සොරා විසින් පවසන ලද්දකි.

(ii) මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියෙහි අනුරුද්ධ කුමාර කථාවෙන් උපුටා ගත්තකි.

බත් උපදින ආකාරය පිළිබඳ අනුරුද්ධ, කිම්බිල, භද්දිය යන කුමාරවරුන් අතර ඇති වූ සංවාදයේ දී අනුරුද්ධ කුමරා විසින් අනික් කුමරුවන්ට පවසන ලද්දකි.

(iii) පන්සිය පණස් ජාතක පොතේ චුල්ල ධනුද්ධර ජාතකයෙන් උපුටා ගන්නා ලද්දකි.

චුල්ල ධනුද්ධර කුමරා මිය ගිය පසු වැද්දා හා යන චුල්ල ධනුද්ධර කුමරාගේ භාර්යාව වූ කුමරිය යම් දිනක තමාට ද ද්‍රෝහ වනු ඇතැයි සිතූ වැද්දා ඇය හැර යාමට තීරණය කළ අවස්ථාවේ කුමරියට කියන ලද්දකි.

(iv) ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ නන්දිවාණිජ වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි.

සිව ඇමතිවරයා වෙළඳ භාර්යාවගේ සිත දිනා ගැනීමට දාසියක අත තෙවන වතාවටත් පඬුරු යැවූ කල වෙළඳ භාර්යාව විසින් දාසියට පවසන ලද්දකි.

බබුන්ගේ පැලට යන ප්‍රනාන්දු මුදලාලි දුර පළාතකට ගොස් යහතින් වාසය නොකරන්නේ මන්දැයි බබුන්ගෙන් විමසූ විට බබුන් විසින් ප්‍රනාන්දු මුදලාලිට කියන ලද්දකි.

(vi) එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත පෙමතො ජායතී සොකො නාට්‍යයෙන් උපුටා ගන්නා ලද්දකි.

ස්වර්ණතිලකා සමග ගෘහ වාසය ඇරඹූ උද්දාල බමුණා සිවු මසක් සිප් හලට නොගොස් සිටීම හේතුවෙන් ඇති වූ කතාබහේදී ස්වර්ණතිලකා විසින් උද්දාල බමුණා හට පවසන ලද්දකි.

(vii) සයිමන් නවගත්තේගම විසින් රචිත 'ස්නේහය' කෙටිකතාවෙන් උපුටා ගන්නා ලද්දකි.

සිල් සමාදන් වීමට පන්සලට යාමට රන්කිරාගෙන් අවසර ගැනීමට ඔහු හා කතා කිරීම සඳහා ඔහුගේ අවධානය තමා වෙත යොමු කරවා ගැනීමේ අදහසින් පිංචි මහයියා විසින් ඔහුට පවසන ලද්දකි.

(ඕනෑම 04 කට ලකුණු 03 x 04 = 12 යි.)

(ඵ) කොළඹ කවි මඟ අනුගමනය කළ ද ස්වකීය ප්‍රතිභාපූර්ණ කවිත්වය ඉස්මතු කොට දැක්වීමට කවියා දැරූ උත්සාහය විමර්ශනයට ලක් කරමින් පහත දැක්වෙන කාව්‍ය නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**වත්තියේ සැන්දෑව**

හිරුරැස් විඩාවෙන් පීඩිත කෙසෙල් වතු
සතසා පවන නළවයි දලු රිකිලි අතු
මළහිරු කිරණ සිප ගැවුණ පරිදි ලතු
රන්වන් වුණා පළගස්වල මහලු පොතු

මැඩියෝ අඬති පෙරළු නව කුඹුරු මඩින්
බක්සෝ ඉගිල යති නිහඬව හිසට උඩින්
වවුලෝ පියඹති මී ගෙඩි රැගෙන කුඩින්
ඈ කිසිවිටෙක නැති ගත්ත ද මෙවැනි හඬින්

සෙවණැලි නිදාගති ගම් වටකළ බැද්දේ
උණ බට තරඟයට මෙන් එකවෙක මැද්දේ
උකුළෙහි කළය ඉඟ අත තාලෙට පැද්දේ
ඇය එනු බලා වැඩිවෙයි රළවැල සද්දේ

මඟ අස මලාමැලි යුතු තැනිතලා වල
තණගොබ සමඟ පොරකයි නවතලා පැල
කේතකි පඳුරු අතරින් නැඟ සළා ගෙළ
ඇය දෙස බලයි නිහඬව පුදු බලා වැළ

හැන්දෑ වලාකුළු නිල් නුබ ඔතා ගති
වැබඩ උණ පඳුරු ඇය ගැන කතා ඇති
රත්සර කැකුළු පෙඳ රැළි මැද ගොතා වෙති
පොබයයි ඇගේ වත නැරඹුම පතා පෙති

දෙ සවන අදී වැව්පිටියේ නද සිරු
පෙද රැළි පෙනේ ලෙස නිල් වරලස පිරු
දේදුනු පෑ දියේ කව පීනති සේරු
පැපත් රළ වළලු ඉන් වෙයි හුව මාරු

මංකඩ දිලේ විසිතුරු හිරු කිරණ වැනි
ඈ ඒ එළිය බී මගෙ හදවතට අනී
දියවැල් ඇගේ පය දැවටී වැළඳ ගනී
රන්වන් පිදී පෙති වතුරෙන් උඩට පනී

රැබෝවීම මගෙ සතුටට හරස් වුණා
ඈ මා දැකීමෙන් මදකට තිගැස් සුණා
අව්හිංසකව ඒ සමඟම හිනැස් සුණා
සතරැස පුදුම විදියට එක ඇසක් වුණා

(ලකුණු 12 යි.)

■ විමලරත්න කුමාරගම අයත් වන කාව්‍ය ධාරාවෙහි ලක්ෂණ පැහැදිලි කොට කුමාරගම එයින් මිදී ස්විය කවිත්වය විදහා පෑ ආකාරය පිළිබඳ අවබෝධය ප්‍රකට කරමින් ශිෂ්‍යයා අදාළ කවි පන්තිය රසාස්වාදය කළ යුතු ය.

1. කුමාරගම කොළඹ කවියේ ද්විතීය තරංගයේ ප්‍රචලිත ව පැවති සමුද්‍රඝෝෂ විරිතෙන් යුත් එළිසම සිව් පද කාව්‍ය මාර්ගය අනුගමනය කළ ද සමකාලීන අන්‍ය කවීන්ට වඩා වෙනස් මගක යමින් අපූර්වත්වයෙන් යුත් කාව්‍ය නිර්මාණ බිහි කළ කවියෙකි.

♦ පුරාතන ආලංකාරිකයන් කවි ශක්තිය හඳුන්වා ඇත්තේ 'ප්‍රතිභාව' යනුවෙනි. ප්‍රතිභාව යනු "අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාව" ලෙස සැලකේ. මෙහි 'අපූර්ව' යන්නෙන් පෙර නොවූ විරූ දෙයක් ම අපේක්ෂා නොකෙරේ. සුපුරුදු දෙයක් වුව නවතාවෙන් ඉදිරිපත් කිරීම අපූර්ව වස්තු නිර්මාණයකි.

♦ මේ පද්‍ය පන්තියෙහි රචකයා තම අත්දැකීම කාව්‍යයට නැගීමේ දී පරිසරයෙහි එදිනෙදා දක්නට ලැබෙන සිද්ධි, අවස්ථා හා වස්තු කෙරෙහි වෙනස් දෘෂ්ටියක් හෙළමින් ඒවා අපූර්වත්වයෙන් යුතුව කාව්‍යයට නගනුයේ තහවුරු ව පවත්නා සම්ප්‍රදායයෙහි ම රැඳෙමින් සම්ප්‍රදාය අතික්‍රමණය කරමිනි.

♦ කුමාරගමගේ කාව්‍ය නිර්මාණ සඳහා වැඩි වශයෙන් වස්තු වූයේ වන්නියේ ජන ජීවිතය යි. තමා හොඳින් දන්නා වන්නියේ විවිධ සිදුවීම් කුමාරගම කවියට නගා තිබෙන්නේ නිරායාස කවි සිතුවිලි ලෙසිනි.

♦ සමකාලීන අන්‍ය කවීන් අතථ්‍ය කාල්පනික ලෝක කාව්‍යගත කරද්දී කුමාරගම තථ්‍ය ප්‍රායෝගික ලෝකය සිය කාව්‍ය නිර්මාණ සඳහා බහුල වශයෙන් යොදා ගෙන තිබේ.

2. ● දිවා කල දැඩි හිරු රැසින් විඩාපත් ගහ කොළ පවා සන්ධ්‍යාව එළඹෙත් ම ප්‍රාණවත් බවට පත් වූ සැටි කියමින් ඇරඹෙන නිර්මාණය ධ්වනි ගුණයෙන් යුක්ත ය. 'රන්වන් වුණා පළු ගස්වල මහලු පොතු' යන කාව්‍ය ඛණ්ඩය ධ්වනිතාර්ථ නංවන්නකි.

♦ දෙවන හා තෙවන පැදි කොටස්වලින් අඳුරට බිය නැති යුවතියක දිය පිණිස වැවට යන අයුරු වර්ණිත ය. අඳුර උදා වූ සැටි කවියා චිත්‍රණය කරන්නේ 'සෙවණැලි නිදා ගති ගම වට කළ බැද්දේ' යන නැවුම් කාව්‍යෝක්තියෙනි. යුවතිය දැකීමෙන් අචේතනික වැව පවා උදම් වන සැටි 'ඈ එනු බලා වැඩි වෙයි රළ වැල සද්දේ' යන කාව්‍යෝක්තියෙන් වර්ණිත ය.

♦ තෙවන, සිව් වන කාව්‍ය ඛණ්ඩ යුවතියගේ රූ සිරිය දැකීමෙන් උදම් වූ පරිසරයේ ඇතැම් ලක්ෂණ කාව්‍යයට නංවයි.

'කේතකි පඳුරු අතරින් ගෙල නගා බලන බලා වැළ' සහ 'පෙඳ රැළි මැද ගොත වන රත්සර කැකුළු පෙති පොබයමින්' යුවතියගේ රුව නැරඹීමට සැරසෙන අයුරු ඒ කාව්‍ය ඛණ්ඩවල වර්ණිත අතර සන්ධ්‍යාව එළඹෙන අයුරු කවියට නගා තිබෙන්නේ 'හැන්දෑ වලාකුළු නිල් නුබ ඔතා ගතී' යන කාව්‍යෝක්තියෙනි.

♦ පද විකෘතියක් (ගොත වෙයි - "ගොතා වෙතී") සහ වියරණ නය බිඳුමක් "රත්සර කැකුළු පෙඳ රැලි මැද ගොතා වෙතී", "පෙති (එනම් මත්ස්‍යයෝ) උඩට පනී" යන්නෙහි ඇතත් එයින් කවිත්වය සපුරා පළුදු නොවේ.

♦ යුවතියගේ සහ කථකයාගේ හමුවීම අඳුර විසින් සීමා කරන ලද මුත් ඔවුන් දෙදෙනාගේ නෙත් සතර එක් ඇසක් වීමෙන් ඒ අවස්ථාව අනුරාගී නිමේෂයක් බව ධ්වනිත වෙයි. සන්ධ්‍යාව ඇතැම් විට කථකයාගේ ජීවිතයේ සන්ධ්‍යා සමය සංකේතවත් කරනවා විය හැකි ය.

● කවියා සිය අනුභූතිය සහෘදයා හමුවට ගෙන එනු පිණිස යොදා ගත් භාෂා ව්‍යවහාර, කාව්‍යෝක්ති, සංකල්ප රූප ද විරිත, එළිසමය ආදි ආකෘතික ලක්ෂණ ද කෙරෙහි අවධානය යොමු කරමින් පිළිතුරු ලියා තිබීම අපේක්ෂා කෙරේ.

(ලකුණු 12 යි)

### 2.3.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 2.4**

**ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය**




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමි වේ.
ඉන්,

ලකුණු 00- 10 ප්‍රාන්තරයේ 10%ක් ද
ලකුණු 11- 20 ප්‍රාන්තරයේ 32%ක් ද
ලකුණු 21- 30 ප්‍රාන්තරයේ 44%ක් ද
ලකුණු 31- 40 ප්‍රාන්තරයේ 14%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 31 හෝ 31 වඩා ලබා ගත් අපේක්ෂකයන් 14%ක් වන අතර 42%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 20 හෝ 20ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

**ප්‍රස්තාරය 2.5**

ප්‍රශ්න අංක 1 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/ 4/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ.

මෙම ප්‍රශ්නයට කොටස් 07ක් ද, අනුකොටස් 27ක් ද, ඇති අතර අනිවාර්ය ප්‍රශ්නයක් වූ මෙම ප්‍රශ්නය අපේක්ෂකයන්ගෙන් 98% තෝරාගෙන ඇති අතර ප්‍රශ්නයේ පහසුතාව 42%කි. පහසුතාව 40%ට වඩා වැඩි කොටස් අනුකොටස් 15ක් ඇත. අනුකොටස් 02 40%ත් - 20%ත් අතර පවතියි. ඉතිරි අනුකොටස් 12ම 19%ත් 03%ත් අතර පවතියි.

පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (අර්ථාවබෝධය)

මෙම පත්‍රයේ I ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතු අතර එම ප්‍රශ්නය කොටස් 7 කින් සමන්විත වේ. මේ යටතේ අර්ථාවබෝධය මැන බැලීම සඳහා අ, ආ, ඉ, ඊ, උ යන කොටස් පහෙන් හතරක් තෝරාගෙන පිළිතුරු සැපයීමට අවස්ථාව ලබා දී ඇති අතර අවස්ථා සම්බන්ධය සඳහා (උ) කොටස ද, රසාස්වාදය සඳහා (ආ) කොටස ද වෙන් කර ඇත. මෙම ප්‍රශ්න සකසා ගෙන ඇත්තේ නිර්දිෂ්ට පුරාතන ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරිනි. අනිවාර්ය ප්‍රශ්නයක් වන මෙම ප්‍රශ්නයට අපේක්ෂකයන්ගෙන් 98%ක් පිළිතුරු සපයා ඇත. එහි පහසුතාව 42%කි.

අර්ථාවබෝධය සඳහා ඇති සෑම කොටසක් ම අනුකොටස් හතරකින් සමන්විත වේ. සාපේක්ෂ ව අපේක්ෂකයන්ගේ ඉහළ සාධන මට්ටමක් දැකිය හැක්කේ ඡේදය ඇසුරෙන් ඍජුව ම පිළිතුරු ලබාගත හැකි ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ දී ය. ඡේදයේ අර්ථය ලිහිල් බසින් ලිවීමේ දී හා දුරවබෝධ පදවලට කෙටි විවරණ සැපයීමේ දී අපේක්ෂකයන්ගේ සාධන මට්ටම සාපේක්ෂ ව පහළ මට්ටමක් දැකිය හැකිය.

සමස්තයක් ලෙස අර්ථාවබෝධය සඳහා පිළිතුරු ලබා දී ඇති ආකාරය විමසා බැලීමේ දී ජීවක කතාවස්තුව ඇසුරින් සැකසූ (ආ) ප්‍රශ්නය සඳහා සාපේක්ෂව ඉහළ සාධන මට්ටමක් දැකිය හැකිය.

එමෙන් ම පුරාතන ගද්‍ය සාහිත්‍යය ඇසුරින් සැකසූ ප්‍රශ්න අතුරෙන් අඩුම සාධන මට්ටමක් දැකිය හැකිය. ස්වර්ණතිලකා වස්තුව ඇසුරින් සකසා ඇති (ඊ) ප්‍රශ්නය සඳහාය. එහිදී අර්ථය ලිහිල් බසින් ලිවීමේ දී සහ දුරවබෝධ පදවලට අරුත් සැපයීමේ දී අපේක්ෂකයින්ගේ සාධන මට්ටම අඩු අගයක් ගෙන ඇත.

අර්ථාවබෝධ සම්බන්ධ ප්‍රශ්නවලට අදාළ ව පුරාතන පද්‍ය ආශ්‍රිත ව සකසන ලද (උ) ගුත්තිල කාව්‍ය ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ගද්‍ය සාහිත්‍ය ඇසුරින් අසන ලද ප්‍රශ්නවලට සාපේක්ෂව ව අඩුම සාධන මට්ටමක් දැකිය හැකිය. උද්ධෘත පාඨ ඇසුරින් අවස්ථා සම්බන්ධය ලිවීම සඳහා අනුකොටස් 7ක් ඇති අතර එම අනුකොටස්වල පහසුතාව 50%ට වඩා අඩුය. එහි දී බැද්දේගම කෘතිය ඇසුරින් සැකසූ ප්‍රශ්න කොටස සඳහා සාපේක්ෂ ව අඩු සාධන මට්ටමක් ඇත. එසේ ම පෙමතො ජායතී සොකො නාට්‍යය සහ කෙටි කතා ආශ්‍රිත (v),(vii) ප්‍රශ්න කොටස් දෙක සඳහා ද අඩු සාධන මට්ටමක් ඇත.

නූතන පද්‍ය ආශ්‍රිත රසාස්වාදය පිළිබඳ හැකියාව මැන බැලෙන (එ) ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය මධ්‍යස්ථ මටටමක පවතී.

පුරාතන ගද්‍ය - පද්‍ය සාහිත්‍ය පිළිබඳ අර්ථාවබෝධය මැන බැලෙන (අ, ආ, ඉ, ඊ, උ) යන කොටස් අතුරෙන් පූජාවලියෙන් උපුටා ගත් ජීවක කතා වස්තුව ආශ්‍රිත ව (ආ) ප්‍රශ්නය සඳහා වැඩි සාධන මට්ටමකුත් සද්ධර්මලංකාරයෙන් උපුටා ගත් ස්වර්ණතිලකා කතා වස්තුව ආශ්‍රිත (ඊ) ප්‍රශ්නය සඳහා ඊට සාපේක්ෂ ව අඩු සාධන මට්ටමකුත් දැකිය හැකි ය. ජීවක කතා වස්තුවේ උපුටාගත් ඡේදය ඊට භාෂා භාවිතය සරල සුගම වීමත්, ස්වර්ණතිලකා කතා වස්තුවෙන් උපුටාගත් ඡේදය සාපේක්ෂ ව ගැඹුරු සංකීර්ණ භාෂා ශෛලියකින් සමන්විත වීමත් මේ සඳහා හේතු විය හැකිය. එබැවින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නිර්දිෂ්ට කතා වස්තු පැහැදිලි කිරීමට නව ඉගෙනුම් ක්‍රමවේද භාවිත කරමින් වඩාත් සරල හා ආකර්ෂණීය ඉගැන්වීම් ක්‍රමවේද කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සුදුසු බව යෝජනා කළ හැකි ය.

එසේ ම ගද්‍ය සාහිත්‍යයට සාපේක්ෂ ව පද්‍ය සාහිත්‍යය සඳහා අපේක්ෂකයන්ගේ සාධන මට්ටම අඩුය. පුරාතන පද්‍ය සාහිත්‍ය කෙරෙහි අපේක්ෂකයන්ගේ වැඩි අවධානයක් යොමු වී නොවීම එයට හේතුවක් විය හැකිය.

අවස්ථා සම්බන්ධය (උ)

අවස්ථා සම්බන්ධය ආශ්‍රිත දැනුම මැන බැලීම සඳහා ප්‍රශ්න 4ක් පුරාතන ගද්‍ය සාහිත්‍යයෙන් ද බැද්දේගම ආශ්‍රිත ව එක් ප්‍රශ්නයක් ද, කෙටි කතා සංග්‍රහය ආශ්‍රිත ව එක් ප්‍රශ්නයක් ද වශයෙන් ප්‍රශ්න සැකසී ඇත. මෙහි දී පුරාතන ගද්‍ය සාහිත්‍ය ඇසුරින් නිර්මිත ප්‍රශ්න සඳහා අපේක්ෂකයන් සාපේක්ෂ ව වැඩි සාධන මටට්ටමක් පෙන්නුම් කරන අතර අනෙකුත් ප්‍රශ්න සඳහා අඩු සාධන මට්ටමක් පෙන්නුම් කර ඇත. මෙහි දී භාෂාවේ වැඩි සංකීර්ණතාවක් ඇති පුරාතන ගද්‍ය සාහිත්‍යයට සාපේක්ෂ ව බැද්දේගම නවකතාව, නාට්‍ය, නූතන කෙටිකතා සංග්‍රහය ආදිය කෙරෙහි සිසුන්ගේ වැඩි අවධානයක් යොමු කළ යුතුය.

### 2.3.3 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර

**2.** **(අ)** ශ්‍රාවක මනසෙහි ශ්‍රද්ධාව වර්ධනය වන ආකාරයට බණ කතා රචනා කිරීම දඹදෙණි කුරුණෑගල අවධිවල දී නව ප්‍රවණතාවක් ලෙස මතු වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07 යි.)

**(ආ)** ශ්‍රාවකයා තම ග්‍රහණයට ගැනීමට යෝග්‍ය ආකාරයෙන් අවස්ථා වර්ණනයේ දී භාෂාව භාවිත කිරීමෙහි ලා සද්ධර්මරත්නාවලී කතුවරයා දැක්වූ සාමර්ථ්‍යය මට්ටකුණ්ඩලී කථාව ආශ්‍රයෙන් විස්තර කරන්න.

**නැත හොත්**

ජාතක කතා කර්තෘවරයා ස්ත්‍රිය හෝ පුරුෂයා හෝ නො සලකා විවිධ අරමුණු ඔස්සේ ක්‍රියාත්මක වන සිතේ පැවැත්ම පාදක කොට ගෙන මනුෂ්‍ය ස්වභාවය විස්තර කරයි.
ජාතක පොතේ නියමිත කථාවස්තු ආශ්‍රයෙන් විමසන්න.

(ලකුණු 08 යි.)

**මේ ප්‍රශ්නය අනිවාර්ය එක් කොටසකින් හා වරණීය කොටස් දෙකකින් යුක්ත වේ.**

**අනිවාර්ය (අ) කොටසට හා (ආ) යටතේ දක්වා ඇති එක් කොටසකට පිළිතුරු සපයා තිබිය යුතු ය.**

**(අ) දඹදෙණි - කුරුණෑගල සාහිත්‍ය අවධි සම්බන්ධයෙන් ශිෂ්‍යයා සතු විචාරාවබෝධය මේ කොටසින් මැන බැලේ..**

2. (අ) දඹදෙණි රාජධානි සමයේ දී විදේශාක්‍රමණවලින් රට නිදහස් කොට ගැනීමෙන් අනතුරු ව ඇති කෙරුණු සාහිත්‍ය ප්‍රබෝධය පිළිබඳ ව හා ශාසන පුනර්ජීවනය හේතුවෙන් සාහිත්‍ය කටයුතු උද්දීප්තියට පත් වූ ආකාරය පිළිබඳ දැනුමක් ශිෂ්‍යයා සතු විය යුතු ය. මෙහි ලා තෙවන විජයබා හා දෙවන පැරකුම්බා රජවරුන්ගේ හා දේවප්‍රතිරාජ වැනි ඇමතිවරුන්ගේ අනුග්‍රහය හේතු වූ ආකාරයත් පැහැදිලි කොට තිබීම අවශ්‍ය වෙයි. දඹදෙණි සාහිත්‍යය පොලොන්නරු සාහිත්‍යයේ ම දිගුවක් හැටියට හැඳින ගත හැකි ආකාරයත් ගද්‍ය පද්‍ය කෘති රාශියක් රචනා වූ ආකාරයත් පැහැදිලි කළ යුතු ය.

- **පූජාවලිය තෙරුවන් ගුණ පවසමින් බෝධිසත්ත්ව පාරමිතාවෙහි අගය පහදන ආකාරයෙන් එය රචනා වී ඇති බවත් ධර්ම ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයක් වශයෙන් රචිත ව ධර්මෝපදේශ ඉස්මතු කොට දක්වමින් ඇති ආකාරයත් ශිෂ්‍යයා වටහා ගෙන තිබිය යුතු වෙයි.**

- **සද්ධර්ම රත්නාවලිය බණ කථා සංග්‍රයක් වුවත් හෘදයග්‍රාහී ගුණයෙන් යුක්ත ව රචනා කොට තිබීම කෙරෙහි විශේෂාවධානය යොමු කළ මනා ය. අලංකාරවාදී සම්ප්‍රදායයෙන් මිදී ධර්මෝපදේශ ඉදිරිපත් කරමින් ශ්‍රාවක මනසෙහි ශ්‍රද්ධාව ජනනය වන ආකාරයෙන් කතා වස්තු ඉදිරිපත් කොට ඇති ආකාරය පැහැදිලි කර තිබීම ද අවශ්‍ය වෙයි.**

කුරුණෑගල සාහිත්‍ය සමය ශාසනයට හා අධ්‍යාපනයට මෙහෙයක් ඉටු කෙරුණු දේශපාලන නායකත්වය හේතුවෙන් උද්දීප්ත වූ ආකාරය පිළිබඳ පසුබිම් දැනුමක් ශිෂ්‍යයාට තිබිය යුතු ය.

- ♦ මේ අවධියේ වැදගත් ම සාහිත්‍යික කර්තව්‍යය වන ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම හා එහි මූලිකත්වය ගත් අය පිළිබඳ වත් එමගින් ශ්‍රාවක මනසෙහි ශාස්තෘන් වහන්සේ පිළිබඳ ශ්‍රද්ධාව කුළු ගන්වා ලූ ආකාරයත් පැහැදිලි කොට තිබිය යුතු ය.
- ♦ සඟසරණ, සිංහල ථූපවංසය හා සිංහල බෝධිවංසය ද මේ යුගයේ රචනා වූ ගද්‍ය ආඛ්‍යාන වෙයි. ඒවායිනුත් ශාස්තෘන් වහන්සේගේ චරිතය හා ස්මාරක විෂයයෙහි ශ්‍රද්ධාව ජනනය වන අයුරින් හඳුන්වා තිබීම හා ධර්මඥානය හා ශ්‍රද්ධාව පතළ කෙරෙන බවත් පෙන්වා දී තිබීම අවශ්‍ය වෙයි.

මේ කෘති ධර්ම දේශනා ශෛලියෙන් යුක්ත ව සම්පාදනය වූ බවත් පාලි කථා වස්තු පදනම් කොට ගනිමින් ශ්‍රද්ධාව ජනනය වන ආකාරයෙන් කථා වස්තු රචනය මේ අවධිවල නව ප්‍රවණතාවක් සේ මතු ව ආ ආකාරයත් පැහැදිලි කොට කෘති දෙකක් පිළිබඳ කරුණු දක්වා තිබීම ප්‍රමාණවත් ය.

(ලකුණු 07 යි)

2 (ආ) ශ්‍රාවකයා සිය ග්‍රහණයට ගැනීමට සුදුසු ආකාරයෙන් සද්ධර්ම රත්නාවලී කතුවරයා අවස්ථා වර්ණනයේ දී භාෂාව භාවිත කළ ආකාරය මේ පිළිතුරෙන් පැහැදිලි කොට තිබීම අවශ්‍ය වෙයි.

- ♦ සද්ධර්ම රත්නාවලී කතුවරයා සිය කෘතිය සඳහා කථා වස්තු ලබා ගන්නේ පාලි සාහිත්‍යයෙනි. ඒ කථා වස්තු ප්‍රධාන වසයෙන් භාරතීය සමාජය පදනම් කොට ගත් ඒවා ය. එසේ වුවත් ඒවා සිංහල භාෂාවෙන් ඉදිරිපත් කිරීමේ දී කතුවරයා පාඨකයා ග්‍රහණයට ගැනීමට යෝග්‍ය පරිදි කථා වස්තු තෝරා ගැනීමත් පරිවර්තනය කිරීමත් සිදු කළ ආකාරය කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

අවස්ථා:

- ♦ නිර්දිෂ්ට කතා වස්තුව වන මට්ටකුණ්ඩලී වස්තුවෙහි අදින්නපුබ්බක බමුණා සිය පුතුට කුණ්ඩලාභරණයක් තැනවීමට තීරණය කළ අවස්ථාව
- ♦ මට්ටකුණ්ඩලීගේ පාණ්ඩු රෝගයට පිළියම් යොදන ආකාරය
- ♦ දරුවා රෝගී වූ විට ඔහු බැලීමට නිවසට පැමිණෙන අය සිය වස්තුව දකිති යි බියෙන් බමුණා මට්ටකුණ්ඩලී ගෙදොරින් බැහැර ව තැබූ අවස්ථාව
- ♦ මට්ටකුණ්ඩලීට පිහිට වීමට යාම සඳහා බුදුන් වහන්සේ සූදානම් වන ආකාරය වර්ණනා කෙරෙන අවස්ථාව
- ♦ මට්ටකුණ්ඩලී හා බුදුන් වහන්සේ හමුව
- ♦ අදින්නපුබ්බක බමුණා සොහොනෙහි හඬමින් සිටින අවස්ථාවෙහි මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයාගේ පැමිණීම
- ♦ අදින්නපුබ්බක බමුණා බුදුපාමොක් මහසඟනට දන් පිරිනමන අවස්ථාව

**භාෂා ප්‍රයෝග:**

**1. සරල කෙටි වාක්‍ය රටාවක් යොදා ගැනීම:**

නිදසුන්: ''උන්ගේ එක ම පුතණු කෙනෙක් ඇත. ජීවිතයක් සේ ඉතා ප්‍රියයෝ ය. ''

''එසේ කලට නැතක් වී සාල් වියදම් වෙයි.''

''බතුත් දුන මැනව.''

''මං කුලීත් දුන මැනව.''

''කෙළවර මිලත් දුන මැනව.''

**2. ධර්මදේශනා රීතියට අනුගත දීර්ඝ වාක්‍ය රටා:**

''මට්ටකුණ්ඩලීත් බුදුරැස් දැක මියෙන වේලෙක රුවන් සක්මන මුනි පෙත්තක් ගෙන ගොස් සිටුවා ලා පෙත්ත දිසාවට නමා ලූ කලක් මෙන් මිදුල දිසාවට නැමීලා වැද හොත් තැනැත්තෝ ...''

''ඌ තුමූ සුධාභෝජන ජාතකයෙහි කෙළ ගණන් වස්තු ඇති සිටාණන් සක් දෙව්දුගේ උපදෙසින් දන් දීමේ අදහස් ඇති වන තෙක් කිසි කෙනෙකුන්ට කිසිවක් දීමට මැලියා සේ...''

**3. කාව්‍යමය වර්ණනා**

''අලතාපිඩෙක ඇති වූ පබළු දලු වැනි දෝ හෝ''

''ලා රසෙහි ගලා ඔසවා ගත් කොබෝලීල මල් දමක් වැනි වූ'' පුන් සඳමඬලින් භාගයක් රත් වලායෙකින්

**4. ශබ්ද රසය ඉස්මතු වන පරිදි තත්සම පද යොදා ගැනීම:**

වසන කලක් පරිද්දෙන්...''

''මහා පුරුෂ ලක්ෂණයෙන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් හා ඛ්‍යාමප්‍රභාකේතුමාලායෙන්''

''ත්‍රිමණ්ඩල පටිච්ඡාදන වශයෙන්''

''ප්‍රවෘත්තිවිපාකදායක කුශලය''

''සර්වඥවිලාසය නමැති රසාඤ්ජනය''

**5. ශ්‍රාවකයාට පහසුවෙන් තේරුම් ගත හැකි ගැමි වහර යොදා ගත් අවස්ථා:**

''නුග ගස මහත් වුවත් නුග ඵලය කුඩා වන්නා සේ''

''පය බරවායට පිටිකර බෙහෙත් බඳිනා සේ''

''ආඳා යවා තබා වල්පත ගත්තා සේ''

''අකුරු ලියන සේ නො දන්නා කෙනෙකුන් පත්වල හිරි අඳනා සේ''

- **මෙවැනි අවස්ථා කිහිපයක් තෝරා ගනිමින් ඒ අවස්ථා පාඨක සිතෙහි කා වදින ආකාරයෙන් වර්ණනා කිරීමට කතුවරයා යොදා ගත් භාෂා ප්‍රයෝග හා ඔහුගේ භාෂා විලාසය පිළිබඳ ව විස්තර කොට තිබිය යුතු ය.**

(ලකුණු 08 යි)

**නැත හොත්**

ජාතක කථා රචකයා සිය චරිත මඟින් විවිධ අරමුණු ඔස්සේ ක්‍රියාත්මක වන සිතේ පැවැත්ම පාදක කොට ගනිමින් මනුෂ්‍ය ස්වභාවය විස්තර කර ඇති ආකාරය පිළිතුරෙන් පැහැදිලි ව දක්වා තිබීම අපේක්ෂිත යි. ජාතක පොතේ එන ඇතැම් කතා වස්තුවලට පාදක වී ඇත්තේ ස්ත්‍රීන්ගේ මෙන් ම පුරුෂයන්ගේ ද විවිධාකාර සිතිවිලි හේතුවෙන් උද්ගත වූ ගැටුම්කාරී තත්ත්ව බව පෙන්වා දිය හැකි ය. එහෙත් ඒ තත්ත්ව ස්ත්‍රීභාවයට හෝ පුරුෂභාවයට හෝ ආවේණික ලක්ෂණ නො ව මනුෂ්‍ය ස්වභාවය බව එකී කතා වස්තු විමසන කල පැහැදිලි වෙයි.

**1. චුල්ල ධනුද්ධර ජාතකය:**

කුමරා - කුමරාගේ අධිමානය හා මමත්වය, කුමරිය කෙරෙහි ගෞරවයක් නො දැක්වීම (මස් ගෙන්වා ගැනීම හා ඒවා ආපසු යැවීම බිරිඳට පැවරීම)

කුමරිය - අවනතභාවය (කුමරා නියෝග කළ අවස්ථා දෙකෙහි ම ඔහුට අවනත වෙමින් සොරුන් කරා යෑම)
(කුමරාගේ අධිමානී හැසිරීම හේතුවෙන් ඇති වූ වෛරය හා ඔහු කෙරෙහි විරෝධයෙන් යුක්ත වීම)

සොර දෙටු - අධිමානය / අභිමානය (කුමරියට ආක්‍රෝෂ පරිභව බිණීම, කුමරිය හැර දමා යාම)

**2. චන්දකින්නර ජාතකය:**

කිඳුරා - බිරිඳ පිළිබඳ දැඩි සෙනෙහස (කිඳුරා හී පහරට ලක් වූ අවස්ථාවේ තම මරණයෙන් පසු තනි වන කිඳුරියගේ අසරණභාවය ගැන සිතා දුක් වීම)

කිඳුරඟන - පති භක්තිය, සැමියා කෙරෙහි දැඩි සෙනෙහස (කිඳුරා හී පහරට ලක් වූ විට හඬා වැළපීම, රජුට ශාප කිරීම, දෙවියන්ගේ පිහිට ඉල්ලා සිටීම)

බරණැස් රජ -අනුරාගය හා ස්ත්‍රී ලෝලත්වය (කිඳුරියගේ සිත දිනා ගැනීමට තැත් කිරීම), ආත්මාර්ථකාමය (කිඳුරිය තමන් සතු කොට ගැනීමට කටයුතු කිරීම), අවස්ථාවාදී ස්වරූපය (කිඳුරිය අකැමැති වූ කල ඇය හෙළා දැකීම)

**(අදාළ ජාතක කථා දෙකින් ඒ ඒ චරිත සම්බන්ධ නිදසුන් දක්වමින් මෙවැනි කරුණු විස්තර කර තිබීම අවශ්‍ය වේ.)**

(ලකුණු 08 යි)

**2.3.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය**

**ප්‍රස්තාරය 2.6**

ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 81%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන්,

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 13%ක් ද
ලකුණු 04 -07 ප්‍රාන්තරයේ 51%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 29%ක් ද
ලකුණු 12- 15 ප්‍රාන්තරයේ 07%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 7%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 64%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

**ප්‍රස්තාරය 2.7**

ප්‍රශ්න අංක 02 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/ 4/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

මෙම ප්‍රශ්නය (අ) හා (ආ) ලෙස කොටස් දෙකක් ද, (ආ) කොටස විකල්ප ප්‍රශ්නයකින් ද, සැකසී ඇත. ප්‍රශ්නය තෝරා ගන්නා අපේක්ෂකයන් (අ) කොටසට පිළිතුරු ලියා (ආ) යන්න හෝ විකල්ප ප්‍රශ්නයට පිළිතුරු ලිවිය යුතු ය. මෙම ප්‍රශ්නය තෝරා ගැනීම 81%කි. පහසුතාව 53%කි. (අ) පහසුතාව 39%ක් ද, (ආ) කොටසේ අනුකොටස් දෙකෙහි පහසුතා පිළිවෙළින් 63%ක් හා 57%ක් වේ.

I මෙම ප්‍රශ්නය සඳහා ලබා දෙන සමස්ත ලකුණු ප්‍රමාණය ලකුණු 15ක් වන අතර (අ) කොටස ලකුණු 7ක් හා (ආ) කොටසට ලකුණු 8ක් ලෙස ලකුණු වෙන් වේ.

සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයට අයත් සද්ධර්මරත්නාවලියෙන් හා ජාතක පොත ඇසුරින් සකස් වී ඇති මෙහි (අ) ප්‍රශ්නය දඹදෙණි හා කුරුණෑගල අවධිවල බණ කතා රචනා කිරීම, නව ප්‍රවණතා ලෙස මතු වූ ආකාරය විචාරාත්මක ව විවරණය කිරීම අපේක්ෂා කර ඇත. මෙම (අ) කොටසේ පහසුතාව 39%කි. (ආ) ප්‍රශ්නයෙහි පළමු ප්‍රශ්නය මට්ටකුණ්ඩලී කතාවස්තුව ඇසුරින් හා විකල්ප ප්‍රශ්නය ජාතක පොත ඇසුරින් ද, නිර්මිත ය. මෙම ප්‍රශ්න දෙකෙහි පහසුතා අගයන් පිළිවෙළින් 63% හා 57% වේ. මට්ටකුණ්ඩලී කතාව ආශ්‍රයෙන් නිර්මිත ප්‍රශ්නය සඳහා ජාතක කතා ඇසුරින් නිර්මිත ප්‍රශ්නයට සාපේක්ෂ ව වැඩි සාධන අගයක් පෙන්නුම් කරයි.

මෙහි එන (ආ) ප්‍රශ්නය සකසා ඇත්තේ දඹදෙණිය හා කුරුණෑගල අවධිවල නව ප්‍රවණතා පිළිබඳ අවබෝධය මැනීම සඳහා වන බැවින් අපේක්ෂකයා සතු ව සාහිත්‍ය යුග පිළිබඳ මනා අවබෝධයක් තිබීම මෙම ප්‍රශ්නයට සාර්ථක ව පිළිතුරු සැපයීමට ඉවහල් වනු ඇත. නමුත් බොහෝ අපේක්ෂකයන් එම ප්‍රශ්නය තෝරා ගැනීමේ අඩු ප්‍රවණතාවක් දැකිය හැකි ය. අපේක්ෂකයන් සාහිත්‍ය කෘතිය පිළිබඳ වැඩි අවධානයක් යොමු කළත් සාහිත්‍ය යුග පිළිබඳ අඩු අවධානයක් යොමු කිරීම මෙයට හේතුව විය හැකිය. තව ද, විෂය නිර්දේශය අනුව සාහිත්‍යය අවධි පිළිබඳ ව ඉගැන්වීම් කටයුතු සිදු කරනුයේ මුල් අදියරේ දී පමණක් වන බැවින් මේ පිළිබඳ බොහෝ අපේක්ෂකයන්ගේ අවධානය ගිලිහී ඇතැයි අනුමාන කළ හැකි ය. එබැවින් ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලියේ දී පුරාතන සාහිත්‍ය නිර්මාණ රසවින්දන අවස්ථාවල දී සාහිත්‍ය අවධි පිළිබඳ නිරන්තර අවධානය යොමු කිරීම වඩා වැදගත් වනු ඇත.

2 ප්‍රශ්නයේ (ආ) කොටසෙහි විකල්ප ප්‍රශ්න දෙකෙන් අපේක්ෂකයා වැඩි අවධානයක් යොමු කර ඇත්තේ සද්ධර්මරත්නාවලියේ එන මට්ටකුණ්ඩලී කතා වස්තුව ආශ්‍රයෙන් සකසා ඇති ප්‍රශ්නයටයි. සද්ධර්මරත්නාවලියේ එන සරල සුගම බස් වහර මෙම තෝරා ගැනීමට ප්‍රධාන හේතුව විය හැකි ය.

උක්ත නිගමනවලට අනුව ශිෂ්‍යයා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙකී සාහිත්‍ය කෘති ඇසුරෙන් නිරූපණය වන විවිධ සංකීර්ණ ප්‍රශ්න සඳහා පුනරීක්ෂණ අභ්‍යාසවල යොමු කරවීම වඩාත් යෝග්‍ය ය. උක්ත දුර්වලතා මගහරවා ගැනීම සඳහා පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පන්ති කාමරයේ දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට යොදා ගැනීම ආදර්ශ පිළිතුරු කිහිපයක් ශිෂ්‍යයන්ට ලබා දීම හා ඒ ඇසුරින් පිළිතුරු ගොනු කිරීමට පෙලඹවීම, ශිෂ්‍යයන් විසින් ලියූ පිළිතුරු පන්ති කාමරයේ දී සාකච්ඡා කිරීම උචිත ය. පිළිතුරු සැපයීමට සිසුන්ට ඇති අපහසුතා හඳුනා ගෙන ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම ඉහළ නංවා ගැනීමට හැකි වනු ඇත.

### 2.3.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර

**3.** සද්ධර්මාලංකාරයේ කථා වස්තුවල ඇතැම් සිදුවීම් තර්කානුකූලභාවයෙන් ඈත් වී ගියත් රසවත්භාවයෙන් පාඨකයාගේ සිත් ඇද බැඳ ගනී.
නිර්දිෂ්ට කථා වස්තු ආශ්‍රයෙන් විමසන්න.

**නැත හොත්**

පූජාවලී කතුවරයා කෘෂි කර්මාන්තය හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ව ඉදිරිපත් කරන කරුණුවලින් තත්කාලීන සමාජය නිරූපණය වන ආකාරය නියමිත කථා වස්තු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

- **තර්කානුකූලභාවයෙන් දුරස් වන අවස්ථා**

  "එකල්හි පළමු කළ ප්‍රාර්ථනා වූ පරිද්දෙන් විශිෂ්ට රූ ඇති වූහ. ඔවුන්ගේ සියලඟින් විදුලිය කලබක් වැනි රශ්මි මාලා සමූහයෝ නික්මෙති."-

  - කර්මඵල හේතුවෙන් හීන ජන්මයක උපත ලබන බව හා මල් පූජා කිරීම නිසා රූප ශෝභාවෙන් යුක්ත ජන්මයක් ලද බව
  - මනුෂ්‍ය ස්වරූපයට නො ගැළපෙන අද්භූත කායික ලක්ෂණ පිළිබඳ වර්ණනය
    "හාත්පසින් සතර රියන් පමණ තන්හි ශරීරාලෝකයෙන් ම අන්ධකාර දුරු ව ඒකාලෝක වෙයි. ... ඔවුන් දෙතන මැද රන්වන් තිලකාභරණයක් මැවිණ; ඒ තිලකාභරණයෙන් අභිනව බාලාර්ක මණ්ඩලය සේ රශ්මි සමූහයෝ නික්මෙති."
  - පුරුෂයන් ස්වර්ණතිලකාවගේ රූපයෙන් වසඟ වී විසඥ වීම හා සිය දිවි හානි කර ගැනීම
  - ඈතා ස්වර්ණතිලකාව කෙරෙහි වශී වී ඇය කුඹ මත තබා ගැනීම

- **නන්දිවාණිජ වස්තුවෙහි ද අභව්‍ය අවස්ථා දැකිය හැකි වෙයි:**

  - සොහොනෙහි මළ සිරුරුවලට අමනුෂ්‍යයන් ආවේශ කරවීම
  - අමනුෂ්‍යයන්ගෙන් ප්‍රයෝජන ලබා ගැනීම
  - උපක්‍රම අසාර්ථක වූ විට අමනුෂ්‍යයා කපුවා හා සිව ඇමති මරා දමා පලා යෑම
  - වෙළෙඳ බිරිඳගේ මදලස බැලුම් හේතුවෙන් සිව ඇමති මූර්ච්ඡා වීම හා අසාමාන්‍ය හැසිරීම
    "උඩුමහල් තෙලෙහි සිට වීථිය දසාව බැලූ වෙළෙඳ භාර්යාවන් දුක උන්ගේ රූප නමැති සුරා පානයෙන් එම විට උමතු ව ගියා සේ මූර්ච්ඡා ව භ්‍රාන්ත ව ගිය සිත් ඇති ව තද හීයකින් විත් කෑ මුවකු සේ වෙළෙඳ භාර්යාවන්ගේ මදලස බැලුම් නමැති ශරප්‍රහාරයෙන් මූර්ච්ඡා ව දෑසින් වැහෙන කඳුළු ධාරා නමැති රුධිරයෙන් රැඳී විරූපභාවයට පැමිණියා වූ මුහුණු ඇති ව අඬ අඬා පෙරළෙමින් "

- **රසවත් බව ඇති වීමට හේතු:**

- **කාව්‍යමය වර්ණනා:**

  "ඇගේ මුඛ නමැති රත් පියුමෙහි ඇලුම් කළා වූ මාගේ නේත්‍ර නමැති භෘංගයෝ දෙදෙන මදකුත් මා සිහි නො කොට ස්වර්ණතිලකාවගේ මුඛ නමැති පද්මයෙහි ම සිත් අලවා වෙසෙති."

"රත් පියුමෙක රත් පියුම් කෙමියක් වටා ලීලෝපේත ව පෙළ සැදී සිට ගත්තා වූ රත් සුදු වෛ
මුසු කේශර පන්තියක් හා සමාන අතුරතුර රත් පැහැ මුසු කොඳ කැකුළු පෙළක් සුදු සිනිඳු වූ දන්ත රශ්මීන් විහිදුවා මඳ මඳ සිනා සිසී නිලුපුල පෙති පරයන නිල් නෙතින් මේ දසාව බලා සිටි..."

- **සරල වාග් රීතිය:**

"ඉතින් ස්වර්ණතිලකාව ජීවත් වුව හොත් අපගේ ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමට අන්තරාය වෙයි. එබ යම් කිසි උපායෙකින් ඈ මරවා පුව මැනවැයි සිතා ඇතරුවන් කැඳවා ඔවුන්ට අත්ලස් දී..."

"මේ ලංකාද්වීපයෙහි මාවටු නම් පටුන්ගම නන්දිය නම් වෙළෙඳාණ කෙනෙක් වෙසෙති. ඒ වෙළෙඳාණෝ ශ්‍රද්ධා සම්පන්නයහ. තුනුරුවන් ම මට පිහිට යැයි මමත්වය ඇතියහ..."

- **දෘෂ්ටාන්ත යොදා ගැනීම:**

"සිවුපා ජාතීන්ගෙන් හීන වූ කැනහිල් ධේනුවක් තොම උතුම් වූ සිංහ රාජයකු හා එක් ව කෙසේ නම් සමාගම් වේ ද?"

"කිමෙක් ද දේවයන් වහන්ස, පක්ෂීන්ගෙන් හීන වූ කපුටු ධේනුවක්, කවර කලෙක ස්වර්ණ හංස රාජයෙකු හා සමඟ කෙසේ නම් සමාගම වේ ද? "

**(මීට අමතර ව ඇතැම් අවස්ථා මඟින් කුතුහලය දනවීම, අද්භූත රසය ඇති කිරීම ආදි කරුණු කෙරෙහි ද අවධානය යොමු කළ හැකි ය.)**

(ලකුණු 15 යි)

**නැත හොත්**

පූජාවලී කතුවරයා කෘෂි කර්මාන්තය හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ව ඉදිරිපත් කරන කරුණුවලින් තත්කාලීන සමාජය නිරූපණය වන ආකාරය නියමිත කථා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

- සාහිත්‍ය කෘතියකින් ලබන නිර්මාණාත්මක වින්දනය මෙන් ම එය පාදක කොට ගනිමින් එය බිහි වූ අවදියේ සමාජ සංස්කෘතික ජීවිතය කෙරෙහි ද අවධානය යොමු කළ හැකි ය.

- සිංහල සම්භාව්‍ය ගද්‍ය කෘතිවලට මුල් වී ඇත්තේ භාරතය පසුබිම් කොට ගත් කතා පුවත් වුව ද ඇතැම් ලේඛකයකු අතින් ඒවා දේශීය පසුබිමෙහි පිහිටුවා ප්‍රතිනිර්මාණය කොට තිබීම හේතුවෙන් ඒවායින් දේශීය සුවඳක් වහනය වෙයි. මෙවැනි කෘති අතුරින් පූජාවලිය විශේෂස්ථානයක් හිමි කොට ගනී. එය සෘජු ව මත් ලංකා ඉතිහාසය පිළිබඳ වෘත්තාන්තයක් ගෙන හැර පාන්නකි.

- මෙහි දී අවධානය යොමු විය යුත්තේ නිර්දිෂ්ට කථා වස්තුවලින් ඒවායින් නිරූපිත යුගයේ සමාජ ජීවිතය චිත්‍රණය කොට ඇති ආකාරය කෙරෙහි ය:

''මේ ලංකාද්වීපයෙහි මාවටු නම් පටුන්ගම නන්දිය නම් වෙළෙඳාණ කෙනෙක් වෙසෙති. ඒ වෙළෙඳාණෝ ශ්‍රද්ධා සම්පන්නයහ. තුනුරුවන් ම මට පිහිට යැයි මමත්වය ඇතියහ...''

- **දෘෂ්ටාන්ත යොදා ගැනීම:**

''සිවුපා ජාතීන්ගෙන් හීන වූ කැනහිල් ධේනුවක් තොම උතුම් වූ සිංහ රාජයකු හා එක් ව කෙසේ නම් සමාගම් වේ ද?''

''කිමෙක් ද දේවයන් වහන්ස, පක්ෂීන්ගෙන් හීන වූ කපුටු ධේනුවක්, කවර කලෙක ස්වර්ණ හංස රාජයෙකු හා සමඟ කෙසේ නම් සමාගම් වේ ද? ''

**(මීට අමතර ව ඇතැම් අවස්ථා මගින් කුතුහලය දනවීම, අද්භූත රසය ඇති කිරීම ආදි කරුණු කෙරෙහි ද අවධානය යොමු කළ හැකි ය.)**

(ලකුණු 15 යි)

නැත හොත්

පූජාවලී කතුවරයා කෘෂි කර්මාන්තය හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ව ඉදිරිපත් කරන කරුණුවලින් තත්කාලීන සමාජය නිරූපණය වන ආකාරය නියමිත කථා වස්තු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

- සාහිත්‍ය කෘතියකින් ලබන නිර්මාණාත්මක වින්දනය මෙන් ම එය පාදක කොට ගනිමින් එය බිහි වූ අවදියේ සමාජ සංස්කෘතික ජීවිතය කෙරෙහි ද අවධානය යොමු කළ හැකි ය.

- සිංහල සම්භාව්‍ය ගද්‍ය කෘතිවලට මුල් වී ඇත්තේ භාරතය පසුබිම් කොට ගත් කතා පුවත් වුව ද ඇතැම් ලේඛකයකු අතින් ඒවා දේශීය පසුබිමෙහි පිහිටුවා ප්‍රතිනිර්මාණය කොට තිබීම හේතුවෙන් ඒවායින් දේශීය සුවඳක් වහනය වෙයි. මෙවැනි කෘති අතුරින් පූජාවලිය විශේෂස්ථානයක් හිමි කොට ගනී. එය සෘජු ව මත් ලංකා ඉතිහාසය පිළිබඳ වෘත්තාන්තයක් ගෙන හැර පාන්නකි.

- මෙහි දී අවධානය යොමු විය යුත්තේ නිර්දිෂ්ට කථා වස්තුවලින් ඒවායින් නිරූපිත යුගයේ සමාජ ජීවිතය චිත්‍රණය කොට ඇති ආකාරය කෙරෙහි යః

''මේ ලංකාද්වීපයෙහි මාවටු නම් පටුන්ගම නන්දිය නම් වෙළෙඳාණ කෙනෙක් වෙසෙති. ඒ වෙළෙඳාණෝ ශ්‍රද්ධා සම්පන්නයහ. තුනුරුවන් ම මට පිහිට යැයි මමත්වය ඇතියහ...''

- **දෘෂ්ටාන්ත යොදා ගැනීම:**

''සිවුපා ජාතීන්ගෙන් හීන වූ කැනහිල් ධේනුවක් තොම උතුම් වූ සිංහ රාජයකු හා එක් ව කෙසේ නම් සමාගම් වේ ද?''

''කිමෙක් ද දේවයන් වහන්ස, පක්ෂීන්ගෙන් හීන වූ කපුටු ධේනුවක්, කවර කලෙක ස්වර්ණ හංස රාජයෙකු හා සමඟ කෙසේ නම් සමාගම් වේ ද? ''

**(මීට අමතර ව ඇතැම් අවස්ථා මගින් කුතුහලය දනවීම, අද්භූත රසය ඇති කිරීම ආදි කරුණු කෙරෙහි ද අවධානය යොමු කළ හැකි ය.)**

(ලකුණු 15 යි)

■ මෙහි දී අවධානය යොමු විය යුත්තේ නිර්දිෂ්ට කථා වස්තුවලින් ඒවායින් නිරූපිත යුගයේ සමාජ ජීවිතය චිත්‍රණය කොට ඇති ආකාරය කෙරෙහි යඃ

1. අනුරුද්ධ කුමාර කතාවඃ මෙය භාරතීය පසුබිමෙහි පිහිටියක් වුව ද පැවිදි නො වී ගිහි දිවියෙහි කල් ගත කිරීමට සිත් උපදවා සිටි අනුරුද්ධ කුමාරයාට මහානාම කුමරා විසින් ගිහි ගෙයි ආදීනව දක්වමින් කරන අනුශාසනාව සාහිත්‍යික අගය ඉක්මවා යමින් තත්කාලීන ලාංකික සමාජ ජීවිතය නිරූපණය කරන්නක් සේ විචාරකයන්ගේ ඇගයුමට ලක් වූවකි.

■ **සී සෑම අරඹන තැන පටන් අස්වනු නෙළා ගෙන ඒම තෙක් වී ගොවිතැනෙහි ක්‍රම හා පටිපාටි පිළිබඳ දක්වන විස්තරය පදනම් කොට ගනිමින් ශිෂ්‍යයා මේ කරුණ පහදා තිබීම මෙහි ලා අපේක්ෂිත යි.**

"මලණ්ඩ, බත් උපදිනා ලෙස් මා අතින් අසව. සී සෑම නම් සුළං බඳනා සේ ඉතා උගහට දෙයෙක. නඟුලෙක, විය දණ්ඩෙක, පිටවකෙක, බඩවකෙක, නිමුනෙක, කෙවිල්ලෙක, අවකැටෙක, හී වැලෙක, පෙරගිලියෙක ... යන මේ අටළොස් දෙනාගේ එක්වීමෙන් යන්නා වූ ගමන සී සෑම් නම් වේ. මෙසේ සී සානා ගොවියක්හු විසින් පළමු ව පලා ගොස් කුඹුරෙහි වන අරත් ගසා ඇළ මං පායා පායා ගෙන දෙවනු ව සුබ වූ නකතකින් ගෙවඩා බිම් නඟා දෙසී තුන් සී සා නියර කපා කැට තළා පෝරු ගා බිජුවට වඩා විධි වූ පරිද්දෙන් කුඹුරෙහි වපුට ගත මැනව..."

මෙය පැරණි ලාංකික කෘෂිකාර්මික ජීවිතයේ යථාරූපී චිත්‍රණයක් සේ සැලකේ. එමෙන් ම මෙහි බස් වහර ද පැරණි සිංහල ගොවි බස් වහර සේ සැලකිය හැකි ය.

වෛද්‍යවරයාගේ චරිතය පදනම් කොට ගත්තකි. එහි ද මුල් පසුබිම භාරතය යි. එහි වෛද්‍ය වෘත්තිය සම්බන්ධයෙන් දක්වෙන කරුණු තත්කාලීන ලංකා සමාජයේ භාවිත වූ වෛද්‍ය ක්‍රම හා ස්වස්ථතා විධි සම්බන්ධයෙන් කතුවරයා සතු වූ දැනුම ද තත්කාලීන ජීවිතය නිරූපණය කිරීමක් සේ සැලකේ. පූජාවලී කතු හිමියන් වෛද්‍ය ශාස්ත්‍රයෙහි හසළ බුද්ධිමතකු බව උන් වහන්සේ විසින් රචිත යෝගාර්ණවය හා ප්‍රයෝගරත්නාවලිය යන කෘති දෙකින් තහවුරු වෙයි. එසේ හෙයින් ජීවක කතා පුවතෙහි දක්වෙන වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ අවස්ථා හා වර්ණනා සමකාලීන ලංකා සමාජය නිරූපණය කරන අවස්ථා සේ සැලකීම යෝග්‍ය වෙයි.

"පතක් පමණ ගිතෙල් උව මැනැයි කියා ගෙන්වා ගෙන තමන් අතින් නොයෙක් ඖෂධ ලා තෙල් සිඳ නිවා නශ්‍ය කළහ."

"සිටාණන් ඇඳෙක උඩු බලා වැද හොවා සියලඟ නො සැලෙන සේ ඇඳ හා එක් කොට පටි පිළියෙන් වෙළා සිටාණන් ඉස්දොර වැද හිඳ සූක්ෂ්ම වූ සැතක් ගෙන සිටාණන් ඉස්බොල්ල පළා තුන් සන්ධිය වෙන් කොට ඉස්මුල් කන පණුවන් දෙදෙනා සැත් තුඩින් ගෙන එළියේ ලූහ... හිස්බොල්ල පෙර සේ ම සන්ධි කොට ලෝමකුත් අඩු වැඩි නො කොට තබා බැහැනි ගෙන ඖෂධ ගල්වා සිටාණන් සත් දවසක් එම ශයනාවෙන් සතපා.. "

(වෙනත් උචිත නිදසුන් ඇසුරෙන් කරුණු ගෙන හැර පා ඇත්නම් යෝග්‍ය පරිදි ලකුණු පිරිනමන්න)

2. පූජාවලියේ ජීවකාරාම පූජා කථා නම් පරිච්ඡේදය බෞද්ධ සාහිත්‍යයේ එන ජීවක වෛද්‍යවරයාගේ චරිතය පදනම් කොට ගත්තකි. එහි ද මුල් පසුබිම භාරතය යි. එහි වෛද්‍ය වෘත්තිය සම්බන්ධයෙන් දක්වෙන කරුණු තත්කාලීන ලංකා සමාජයේ භාවිත වූ වෛද්‍ය ක්‍රම හා ස්වස්ථතා විධි සම්බන්ධයෙන් කතුවරයා සතු වූ දැනුම ද තත්කාලීන ජීවිතය නිරූපණය කිරීමක් සේ සැලකේ. පූජාවලී කතු හිමියන් වෛද්‍ය ශාස්ත්‍රයෙහි හසළ බුද්ධිමතකු බව උන් වහන්සේ විසින් රචිත යෝගාර්ණවය හා ප්‍රයෝගරත්නාවලිය යන කෘති දෙකින් තහවුරු වෙයි. එසේ හෙයින් ජීවක කතා පුවතෙහි දක්වෙන වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ අවස්ථා හා වර්ණනා සමකාලීන ලංකා සමාජය නිරූපණය කරන අවස්ථා සේ සැලකීම යෝග්‍ය වෙයි.

"පතක් පමණ ගිතෙල් උව මැනැයි කියා ගෙන්වා ගෙන තමන් අතින් නොයෙක් ඖෂධ ලා තෙල් සිඳ නිවා නශ්‍ය කළහ."

"සිටාණන් ඇඳෙක උඩු බලා වැද හොවා සියලඟ නො සැලෙන සේ ඇඳ හා එක් කොට පටි පිළියෙන් වෙළා සිටාණන් ඉස්දොර වැද හිඳ සූක්ෂ්ම වූ සැතක් ගෙන සිටාණන් ඉස්බොල්ල පළා තුන් සන්ධිය වෙන් කොට ඉස්මුල් කන පණුවන් දෙදෙනා සැත් තුඩින් ගෙන එළියේ ලූහ.. හිස්බොල්ල පෙර සේ ම සන්ධි කොට ලෝමකුත් අඩු වැඩි නො කොට තබා බැහැනි ගෙන ඖෂධ ගල්වා සිටාණන් සත් දවසක් එම ශයනාවෙන් සතපා.. "

(ලකුණු 15 යි)

(වෙනත් උචිත නිදසුන් ඇසුරෙන් කරුණු ගෙන හැර පා ඇත්නම් යෝග්‍ය පරිදි ලකුණු පිරිනමන්න)

**2.3.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය**

**ප්‍රස්තාරය 2.8**

**ප්‍රශ්න අංක 3හි අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය**




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ. ඉන්,

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 14%ක් ද
ලකුණු 04 -07 ප්‍රාන්තරයේ 29%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 44%ක් ද
ලකුණු 12- 15 ප්‍රාන්තරයේ 13%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 12ක් හෝ ඊට වඩා ලබා ගත් අපේක්ෂකයන් 13%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 43/%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ.

ප්‍රස්තාරය **2.9**

**ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශක**




මූලාශ්‍රය : RD/16/ 4/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

මෙම ප්‍රශ්නයට ද විකල්ප ප්‍රශ්නයක් ඇතුළත් වේ. අපේක්ෂකයා ප්‍රශ්න කොටස් දෙකෙන් එකක් තෝරාගෙන පිළිතුරු ලිවිය යුතු ය. 3 ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂක ප්‍රතිශතය 74%කි. සමස්ත පහසුතාව 69%කි. මෙම ප්‍රශ්නයේ එක් කොටසක් සද්ධර්මාලංකාරය ඇසුරෙන් ද අනික් කොටස පූජාවලිය ඇසුරෙන් ද විමසා ඇත. සද්ධර්මාලංකාරය ඇසුරෙන් ද, විමසූ ප්‍රශ්නයේ පහසුතාව 95%කි. පූජාවලිය ඇසුරෙන් විමසූ විකල්ප ප්‍රශ්නයේ පහසුතාව 42%කි.

උපුටා ගත් කතාවස්තුවල ඇතැම් සිදුවීම් තර්කානුකූලභාවයෙන් ඈත් වී ගියත් රසවත්භාවයෙන් පාඨකයාගේ සිත් ඇද බැඳ ගන්නා ආකාරය නිර්දිෂ්ට කතා වස්තු ආශ්‍රයෙන් විචාරාත්මක ව විමර්ශනය කිරීම 03 ප්‍රශ්නයේ අරමුණ වී ඇත. එහි ම විකල්ප ප්‍රශ්නය ලෙස පූජාවලියේ නිර්දිෂ්ට කතාවස්තු ආශ්‍රයෙන් පූජාවලියේ කතුවරයා කෘෂිකර්මාන්තය හා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඉදිරිපත් කරන කරුණුවලින් තත්කාලීන සමාජය නිරූපණය වන අයුරු පැහැදිලි කිරීම අපේක්ෂා කර ඇත.

නියමිත කතා වස්තු කියවා ලබාගන්නා රසවින්දනයත් එමගින් ඇති වන උපදේශාත්මක නැඹුරුව කෙරෙහිත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ශිෂ්‍යයාගේ විචාරාක්ෂිය යොමු කිරීමට පෙලඹවීම මෙන් ම තත්කාලීන සමාජ වපසරිය පිළිබඳ ව අවධානය යොමු කරවීම ද එහි දී ශිෂ්‍යයා අතිරේක ලිපි ලේඛන හා කෘතී පරිශීලනයට යොමු කිරීම ද, වඩාත් යෝග්‍ය වනු ඇතැයි යෝජනා කළ හැකි ය. එමෙන් ම නව ඉගෙනුම් ක්‍රමවේද ඔස්සේ රසවින්දනාත්මක ව අදාළ පාඩම් ඉගැන්වීම් කෙරෙහි අවධානය යොමු කිරීම වඩාත් යෝග්‍ය වේ. එමෙන් ම විභාග ප්‍රශ්නවලට අමතර ව නිර්දිෂ්ට පුරාතන සාහිත්‍ය කෘති පිළිබඳ ව ශිෂ්‍යයන් අතර විචාරාත්මක සංවාද ගොඩනැගීමට පෙලඹවීම් ඇති කරවන ක්‍රියාකාරකම් ප්‍රචලිත කිරීම යෝග්‍ය වේ. මේ ඔස්සේ පාසල් පරිසරයේ සාහිත්‍ය සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පරිසරයක් නිර්මාණය කළ හැකි ය. මෙම ක්‍රමවේදය මගින් විචාර ලිවීමටත් කෘතියක් ද විචාරාත්මක ව බැලීමේ ශක්‍යතාවක් සිසුන් තුළ ඇති කළ හැකි වේ යැයි යෝජනා කළ හැකි ය.

### 2.3.7. ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර

4. අනායාසයෙන් කෙරෙන අවස්ථා නිරූපණයත් කථා වස්තුව වේගවත් ලෙස ගලා යන්නට සැලැස්වීමත් ගුත්තිල කාව්‍යයේ රචනෝපක්‍රම වී ඇති ආකාරය ගුත්තිල මූසිල හමුව ආශ්‍රයෙන් විමසන්න.

**(ලකුණු 15 යි)**

ගුත්තිල කාව්‍යයේ විශේෂත්වයට එක් හේතුවක් වන්නේ එහි රචකයා විසින් අනුගමනය කෙරුණු රචනෝපක්‍රම යි. එහි ලා අවස්ථා නිරූපණයෙහි දී දැකිය හැකි අනායාසී වර්ණනා මෙන් ම අනවශ්‍ය වර්ණණාවලින් තොර ව කථා වස්තුව වේගයෙන් ගලා යෑමට සැලැස්වීමත් ප්‍රමුඛ වෙයි. මේ කරුණු නිදසුන් මඟින් දක්වා තිබීම මේ පිළිතුරෙහි ලා අපේක්ෂිත ය. අදාළ නිදර්ශන ගුත්තිල - මූසිල හමුව දැක්වෙන අවස්ථාවට සීමා කිරීම අවශ්‍ය වෙයි.

සැණකෙළියේ දී ගුත්තිල ඇදුරුතුමන් පිළිබඳ ව මූසිලට අසන්නට ලැබේ. එහි දී මෙතෙක් සිය ශිල්පීය ශක්තිය ගැන ඔහු දරා සිටි ආකල්පය හා මානය බිඳ වැටෙයි.

"උනිමු වෙණ සදති යි -
නො දත්තෙමු ගායනා කරති යි"

යන දෙපාදයෙන් ඒ අවස්ථාව ප්‍රතිනිර්මාණය කෙරේ. මෙය ගුත්තිල-මූසිල හමුවේ පූර්විකාව බඳු ය.

ඉන් අනතුරු ව මූසිල ගුත්තිල ඇදුරුතුමන් සොයා යයි. ඔහු ගුත්තිල ඇදුරුගේ නිවසට පැමිණෙන විට ඇදුරා නිවසින් බැහැර ය. එතුමාගේ මාපියෝ මූසිලට මෙසේ පවසති.

"සගය ඒ ඇදුරා
කිසි කාරියක නුදුරා
ගියෙ ය නො ව බැහැරා
කිවු ය දන් දන් එති යි ඉඳුරා"

මෙය ප්‍රබල අවස්ථා නිරූපණයකි. ගුත්තිල ඇදුරා හමු වීමට පැමිණි මූසිල ගුත්තිලගේ මහලු දෙමාපියන් හා කතා බස් කරන ආකාරය මේ පැදියෙන් ජංගම ආකාරයෙන් නිරූපණය කෙරෙයි. එහි විශේෂ ලක්ෂණයක් වනුයේ අනවශ්‍ය වර්ණනාවලින් තොර වීම යි. මේ කතාබහ සිදු වෙද්දී ම ගුත්තිල ඇදුරා පෙරළා නිවසට පැමිණෙයි.

"කියත උන් මෙතෙපල
ආයෙ ය ඇදුරු ගුත්තිල"

මහා කාව්‍ය ලක්ෂණවලට අනුගත වූ රචකයකු අත අනවශ්‍ය දීර්ඝ වර්ණනාවලට අවකාස සැලසෙන මේ අවස්ථාව එබඳු අනවශ්‍ය වර්ණනාවලින් තොර ව සරල ව චිත්‍රණය කොට තිබීම ගුත්තිල කාව්‍යයේ විශේෂ ලක්ෂණයක් සේ පෙන්නුම් කළ හැකි ය. මේ අවස්ථා නිරූපණය ප්‍රබල මෙන් ම අනායාසී වූවකි. අනවශ්‍ය වර්ණනා වලින් තොර ව කතා වස්තුව ගලා යාමට සැලැස්වීම මෙහි ලා කතුවරයා අත් කොට ගත් සාර්ථකත්වය යි.

ගුත්තිල ඇදුරා පැමිණි විගස මූසිල ඔහු දෙපා වැඳ තමන් පැමිණි කාරණය පවසයි. ඒ අවස්ථාව ද සංක්ෂිප්ත ව එහෙත් ප්‍රබල ආකාරයෙන් චිත්‍රණය කොට ඇත:

"වැඳ ඔහු පද කමල
තමා ආ තතු කී ය මූසිල"

හමු වූ පළමු අවස්ථාවේ දී ම මූසිලගේ ද දුර්දාන්ත ස්වරූපය මෙන් ම කූට ස්වභාවය ද ගුත්තිලට පැහැදිලි වෙයි. ඔහු මූසිලගේ ආචාරයට සමාචාර දක්වනුයේ මේ ආගන්තුකයා

පිළිබඳ කෙබඳු අවබෝධයක් තමා සතු ව ඇද්දැයි හෙළි කරමිනි. ඒ බව පැහැදිලි කර දීමට කවියාට වැඩි වචන අවශ්‍ය නො වී ය.

"බලමින් ලකුණු ගත
දුදන ගුණ දන ඔහු සිත
නො වසව තෙපි මවෙත
සිල්ප නො දෙමැයි කිවෙන් මහසත"

ගුත්තිලගේ මේ වචනවලින් කම්පාවට පත් වන මූසිල ගුත්තිලගේ සිත දිනා ගෙන ශිල්ප ලබා ගැනීම වංචනික මාර්ගයක් අනුගමනය කරයි. ඒ ගුත්තිලගේ අඳ මවුපිය දෙපළට උපස්ථාන කොට පහදවා ගෙ තමන්ට ශිල්ප ලබා දෙන මෙන් ඔවුන් ලවා සිය පුතුට ආයාචනා කරවීම යි. මවුපියන්ගේ ඉල්ලීමට පිටු පෑම අසමත් වන ගුත්තිල මූසිලට වෙණ සිප් උගැන්වීමට එකඟ වෙයි. මේ සිද්ධි මාලාව නාටකීය ආකාරයෙ ඉදිරිපත් වන්නේ අනවශ්‍ය වර්ණනාවලින් තොර ව ය. එය කථාව ශීඝ්‍රයෙන් ගලා යාමට සැලැස්වීමට කතුවරු ගත් විශේෂ ප්‍රයෝගයක් සේ සැලකිය හැකි ය. මේ ලක්ෂණය මහා කාව්‍ය මාර්ගයෙන් මිදී ජන සම්ප්‍රදා අනුගමනය කිරීමේ ප්‍රතිඵලයක් සේ සැලකිය හැකි වෙයි.

(ලකුණු 15 යි)

- **මේ හැර ගුත්තිල මූසිල දෙදෙනා වීණා වාදන තරගය සඳහා හමු වන අවස්ථාව ද උචිත නිදසුන් මඟින් පැහැදිලි කොට ඇත් නම් ලකුණු පිරිනැමිය හැකි යඃ**

ගුත්තිල ඇදුරු සඳ
වීණා වයන ලෙස ඉඳ
පසෙක පනවන ලද
සුදුසු අස්නෙක ගොසින් උන් සඳ

නො දත ම තමා බල
සබයට ඇවිත් නො පැකිළ
වැඳ රජු පද කමල
දෙසෙක මූසිලයා ද උන් කල

යන පැදි දෙකෙන් අරඹා වර්ණිත අවස්ථාව ද ප්‍රබලාකාරයෙන් නිරූපණය කොට ඇත. එය ද අනවශ්‍ය සි හා වර්ණනාවලින් තොර ව ශීඝ්‍ර ආකාරයෙන් දක්වෙන අවස්ථා නිරූපණයකි.

**මෙබඳු නිදසුන් දක්වමින් මේ කරුණු සවිස්තර ව සාකච්ඡා කොට ඇත්නම් යෝග්‍ය පරිදි ලකුණු පිරිනැමිය හැකි ය.**

**2.3.8 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය**

**ප්‍රස්තාරය 2.10**

**ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය**




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන්,

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 31%ක් ද
ලකුණු 04 -07 ප්‍රාන්තරයේ 42%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 12- 15 ප්‍රාන්තරයේ 04%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 12ට හෝ ඊට වඩා ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 4%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 73%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 7 හෝ 7ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ.

**ප්‍රස්තාරය 2.11**

**ප්‍රශ්න අංක 04හි කොටස් හා අනුකොටස්වල පහසුතා දර්ශක**




මූලාශ්‍රය : RD/16/ 4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ.

ගුත්තිල කාව්‍යය ආශ්‍රිත ව සකස් වී ඇති මෙම ප්‍රශ්නයේ සඳහා පහසුතාව 36%කි. මෙහි දී අනායාසයෙන් කෙරෙන අවස්ථා නිරූපණ කතා වස්තුව වේගවත් ලෙස ගලා යන්නට සැලැස්වීම ගුත්තිල කාව්‍යයේ රචනා උපක්‍රම වී ඇති අයුරු ගුත්තිල මූසිල හමුව ඇසුරින් විමර්ශනය කිරීම අපේක්ෂා කර ඇත.

ගුත්තිල කාව්‍ය පද්‍ය සාහිත්‍යයට අයත් රසවින්දනාත්මක කාව්‍ය ග්‍රන්ථයක් වුව ද, අනෙකුත් විචාර ප්‍රශ්නවලට සාපේක්ෂක ව අපේක්ෂකයන් විසින් මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ අඩු නැඹුරුතාවක් දක්වයි. විශේෂයෙන් ම කවි කටපාඩම් කිරීමට ඇති අකමැත්ත, තෝරාගත් ප්‍රශ්න කිහිපයක් සඳහා සූදානම් වීම ආදිය මේ සඳහා හේතු විය හැකි ය.

පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පද්‍ය සාහිත්‍ය නිර්මාණ විචාරශීලි ලෙස අවධානයට යොමු කරමින් තව දුරටත් ශිෂ්‍ය ආකර්ෂණය මේ ප්‍රශ්නය සඳහා යොමු කරවීමට ගුරුවරයා විසින් පාඩම් සැලසුම්කරණය සිදුකළ යුතු ය. එහි දී ශිෂ්‍ය රුචිකත්වය වර්ධනය කර ගැනීම උදෙසා ඒකාකාරී දේශන, සම්මන්ත්‍රණ අවස්ථාවලින් ඔබ්බට ගොස් විවිධ කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇසුරෙන් තරගකාරී අවස්ථා නිර්මාණය කිරීම වඩාත් යෝග්‍ය වනු ඇත. එසේ ම නිර්දිෂ්ට ගුත්තිල කාව්‍ය ඇසුරෙන් නිර්මිත හඬ පට, විඩියෝ පට පරිශීලනය කිරීමට අවස්ථාව සලසා දීම වඩාත් උචිත ය. මේ ඇසුරෙන් අපේක්ෂිත සාධන මට්ටමට ළඟා වීමට ශිෂ්‍යයන් අභිප්‍රේරණය කළ හැකි ය.

## 2.3.9 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර

**5.** නවකතාවක පසුබිම යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් දැයි විස්තර කොට බැද්දේගම කෘතියේ පළමු වන පරිච්ඡේදය කථා විකාසනය සඳහා පසුබිම සකසන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

1. ඕනෑම ආඛ්‍යානයක් නිශ්චිත පරිසරයක පිහිටුවමින් සිදුවීම් මාලාව ගොඩ නැංවීම නවකතාවක පොදු ලක්ෂණයකි. පාඨක මනසෙහි විශ්වසනීයත්වයක් ජනිත වන්නේ යෝග්‍ය පසුබිමක කතාව ස්ථානගත කළ හොත් පමණි. නවකතාවක පුළුල් පාඨක ප්‍රජාවට කිසියම් නිශ්චිත පරිසරයක් පාදක කොට ගෙන නිර්මාණය කෙරෙන ආඛ්‍යානයක් පිළිබඳ සුහද හැඟීමක් ඇති වීමට නම් පළමු කොට කතා පුවතට පසුබිම් වන පරිසරය පිළිබඳ පැහැදිලි වැටහීමක් ඇති කර ගත යුතු ය. තව ද කතාවේ සියලු චරිත හැසිරෙන්නේ ද සිදුවීම් විකාසනය වන්නේ ද ඒ නිරූපිත පරිසරයට අනුරූප ලෙසිනි. පාඨකයාට කතා පුවත පිළිබඳ විශ්වසනීයත්වයක් ඇති වන්නේ යෝග්‍ය පසුබිමක කතාව විකාසනය කළ විට ය.

- කැරොලයින් ගෝර්ඩන් විසින් නවකතාවේ පසුබිම පිළිබඳ කර තිබෙන විග්‍රහය මෙසේ යː
  "නවකතාකරුවකු විසින් මුලින් ම විසඳා ලිය යුතු ගැටලුවක් නම් කාලය හා ඉඩ හසර යන අන්තරයන් තුළ කතාව පිහිටුවීම වේ. නවකතාවේ සාර්ථක හෝ අසාර්ථක භාවය බොහෝ දුරට රඳා පවත්නේ මෙම ගැටලුව විසඳා ගනු ලබන ආකාරය මත ය."

2. බැද්දේගම නවකතාවට පසුබිම් වන්නේ වියළි කලාපයේ වනාන්තරයක් මැද පිහිටි වනගත ගමකි. පවුල් කිහිපයක් ජීවත් වන ඒ ගමෙහි වැසියන් ජීවත් වන්නේ නියඟයෙන්, කුස ගින්නෙන් හා විවිධ ලෙඩ රෝගවලින් පීඩා විඳිමිනි.

- අවුරුද්දේ මාස දෙකක් පමණි ඒ ප්‍රදේශයට වැස්ස ලැබෙන්නේ. ඉතිරි කාලය මුළු පරිසරය ම නියඟයට ලක් වෙයි. මිනිසුන් මෙන් ම වනයේ ජීවත් වන සිව්පා සතුන් ද ජලය සහ ආහාර හිඟකම නිසා බොහෝ පීඩාවන්ට බඳුන් වෙමින් ගත කරන්නේ කටුක ජීවිතයකි.
- දුබල වන සතා ප්‍රබල වන සතාගේ ගොදුර බවට පත් වෙයි. ඒ පරිසරයේ නීතියක් වශයෙන් පවතින්නේ බිය ය. ඊ ළඟට කුස ගින්න සහ පිපාසය යි.
- සොබා දහමේ විපත්වලට අමතර ව මිනිසා විවිධ සමාජ බලවේගවල ගොදුරක් බවට පත් වන අයුරු ද නවකතාවේ නිරූපිත ය.

■ බැද්දේගම නවකතාවේ පළමු පරිච්ඡේදයේ පහත දැක්වෙන කරුණු අන්තර්ගතය.

- වනාන්තරය පිළිබඳ විස්තරය
- වනයට බිලි වුණු දඩයක්කාරයා
- වනයේ ජීවත් වන සතුන් පිළිබඳ විස්තරය
- වැසි කාලය පැමිණි කල වනයේ තත්ත්වය
- නියඟය හා ඊට ගොදුරු වන වන සතුන්
- ගම් වැසියන් සහ ඔවුන්ගේ ජීවන තත්වය
- හේන් ගොවිතැන
- සිලිඳු, ඩිංගිහාමි, කර්ලිනාහාමි, දරුවන් දෙදෙනා

■ වනාන්තරය පිළිබඳ විස්තරය, එනම් නියඟය හා බිය, කුසගින්න, දුබලයා ප්‍රබලයාට බිලි වීම යන පසුබිම් විස්තරය නවකතාවේ නිරායාස විකාසනයට සාර්ථක පසුතලයක් සපයයි. සියලු සිදුවීම් විකාසනය වන්නේ හේතු ඵල සම්බන්ධතාවකට අනුරූප අයුරිනි. මේ නිසා නවකතාවේ ඉදිරි විකාසනයට අදාළ මනා පදනමක් නවකතාවේ ප්‍රථම පරිච්ඡේදයෙන් සම්පාදනය කෙරේ:

- "හැම වනයක් ම භයානක ය. එහෙත් බැද්දේගම අවට තිබූ වනය තරම් භයානක වනයක් තවත් නො වී ය."
- "ඉඳිකටු වැනි තියුණු දිග කටු ඇති මස් සහිත ඝන පතුවලින් ගහන පතොක් ගස් පිළිකුළත් බියත් උපදවනසුලු විය ..."
- "වනය ගම වට කර ගෙන, ගමට ඉහළින් ද වැඩෙමින් ගම තදබද කර ගෙන සිටියේ ය. ගෙමිදුල් හා එළිමහන් තැන් අකුල් කර ගෙන මැටි ගෙවල් මිරිකා ගෙන මංපෙත් අවුරා ගෙන වනය හාත්පසින් වැඩුණේ ය. ගම සම්පූර්ණයෙන් ම වනබත් වීම වළක්වා ගත හැකි වූයේ අවුරුදු පතා කැති පොරෝවලින් පහර දී පහත් කර දැමීමෙනි ... කැති පහරට අඩු නො වී නම් ක්‍රමයෙන් වැඩී ගෙන විත් මුළු ගම ම ගොදුරට ගන්නා එක ම ජීව ප්‍රාකාරයකි."
- "ඊසාන දිග මෝසම් සුළං නවතිනවාත් සමඟ ම වැසි නැවතේ ... වැව් පොකුණු හා කුඩා දිය වළවල් ද දැඩි හිරු රැසින් සිඳී යන්නට පටන් ගනී ... උණුසුම් වියළි සුළඟ ගස් කොළත් පිස ගෙන හමයි.. හිරු රැසින් පොළොව පැළිවළන් පැළී දූවිල්ල මතු වේ. කුඩා කුඩා ඇළ දොළ වියළී යන අතර මහ ගං හෝ දිය සිඳී, මහ වැලි කඳු අතර හෙමි හෙමින් ගලා බසින කුඩා දිය පාරවල් බවට පෙරළේ."
- "පොළොව බොහෝ නිසරු හෙයින් එක් අවුරුද්දක් දවා කපා වපුරා ගත් හේනකින් තවත් දහ අවුරුද්දකට අස්වැන්නක් ලැබිය නො හැකි ය."
- "වනයෙහි මෙන් ම ගමෙහි ද හැම තැනකින් ම හැම සතකුගෙන් ම නිකුත් වන්නේ බඩගින්නත් බඩගින්න පිළිබඳ නිතොර ව පවත්නා බියත් ය. අස්වැන්න කපා මිරිකාගත් පසු මාස කීපයක් ගත වන තුරු පමණකි, දිනපතා බඩ පුරා කෑමේ ආස්වාදය ගම්මුන් ලැබුවේ."
- "පරංගි වණවලින් තොර ව ගමේ සිටියේ ඉතා ටික දෙනෙකි ... ඉපදී වැඩි දවසක් යන්ට පෙර ආරා ගිය කහ පාට බඩ ගෙඩි ඇති ව උණෙන් ඉදිමී උදර රෝගයෙන් පිපිහළු වී ගිය මුහුණත් ගොරක නැටි මෙන් සිහින් ව ගිය ඇට ගැසුණු අත්පාත් ඇති කුඩා දරුවෝ නිරුවතින් හැසිරෙති."

■ **ගම් වැසියන් සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය**

♦ ''වනයෙහි බල පවත්වන ගතිය ගමෙහි ද එහි ජීවත් වන්නවුන් කෙරෙහි ද එසේ ම බලපවත්වයි. එහි වූවෝ කලකිරීමෙන් මුරණ්ඩු වූ සිත් ඇති, වැඩි කතාවක් බහක් නොකරන චාන් මිනිස්සු ය. උන්ගේ ජීවිතයේ තිබෙන බිය හා දුෂ්කරතා ද කෙනෙකුට උන්ගේ මුහුණෙන් ම දැක්ක හැකි ය. අවට වනයේ වාසය කරන තිරිසන් සතුන්ට උන් බෙහෙවින් සමාන ය. උන් එකෙක් අනිකකු දෙස බලන්නේ මීහරකුගේ ඇස්වල දැක්ක හැකි ඉවසිලිමත් දොම්නස් ජඩ බැල්මෙන් හෝ නරියකු කෙරෙහි ඇති කපට බැල්මෙන් හෝ යුතු ව ය. වනයේ දී පවතින අන්ධ සාහසිකත්වය ද, දිවියකුගේ මෙන් රෞද්‍රභාවය හා වලසකුගේ මෙන් හදිසි කෝපය ද, මේ ගම්මුන් තුළ දක්නට ලැබේ.''

■ **සිලිඳු ඩිංගිහාමි කර්ලිනාහාමි දරුවන් දෙදෙනා**

''බැලූ බැල්මට පෙනෙන්නේ ඔහු අනික් අයට වඩා ඔතැනි, වැඩි කතාවක් බහක් නැති මිනිසකු ලෙසිනි. එහෙත් ගම්මු වෙන කරුණු සැලකුහ... නිතර දෙවේලේ වනයේ රිංගමින් ම ගත කරතත් අනිත් හැම දෙනකුටමත් වඩා වනය ගැන හොඳින් දනිතත්, විස්තර කළ නොහැකි තරම් මහත් වන බියක් ඔහු කෙරේ ඇති ව තිබීම ය පුදුමය.''

'' පුන්චි මැණිකාටත් හින්නි හාමිටත් තුන් අවුරුදු වයස වන තුරු උන් ඉන්නවා ද මළා ද කියාවත් සිලිඳු නොබැලූ තරම් ය.''

(ලකුණු 15 යි)

### 2.3.10 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 2.12**

**ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය 55%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන්,

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 22%ක් ද
ලකුණු 04 -07 ප්‍රාන්තරයේ 38%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 12- 15 ප්‍රාන්තරයේ 07%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 12 හෝ ඊට වඩා ලබා ගත් අපේක්ෂකයන් 07%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 60%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 7ක් හෝ 7ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ.

**ප්‍රස්තාරය 2.13**

**ප්‍රශ්න අංක 5 සඳහා පහසුතා දර්ශක**




මූලාශ්‍රය : RD/16/ 4/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

බැද්දේගම නවකතාව ඇසුරෙන් විමසන ලද ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය තෝරා ගැනීම 55% වන අතර පහසුතාව 43%කි. නවකතාවක පසුබිම යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක්දැයි විස්තර කොට බැද්දේගම කෘතියේ පළමුවන පරිච්ඡේදයේ කතා විකාසනය සඳහා පසුබිම සකසන අයුරු විචාරාත්මක ව විමර්ශනය කිරීම මෙහි දී අපේක්ෂා කර ඇත. බොහෝ අපේක්ෂකයාට මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේ දී උපරිම ලකුණු 12 - 15 අතර ලකුණක් ලබා ගැනීමට නොහැකි වී ඇත.

මෙම ප්‍රශ්නයේ දී නවකතාවක පසුබිම, නවකතාවක කතා විකාසනය ආදි මූලිකාංග කෙරෙහි අවධානය යොමු කර ඇත. එම ක්ෂේත්‍ර අධ්‍යයනය කරනුයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ මුල් අදියරයේ දී වන බැවින් ශිෂ්‍යයන්ගේ මතකයෙන් මෙවැනි සිද්ධාන්ත ගිලිහී යාමට ඉඩ ඇත. එබැවින් බැද්දේගම ආශ්‍රිත සිසුන් ගේ විචාරාත්මක හැකියාව වර්ධනය කිරීම සඳහා මුල් අදියරේ දි සිද්ධාන්ත කෙරෙහි නිරන්තර අවධානය යොමු කරමින් පාසල් පරිසරය තුළ වඩාත් ප්‍රායෝගික සාකච්ඡා ගොඩනැගීම යෝග්‍ය වේ. එමෙන් ම නිර්දිෂ්ට සාහිත්‍ය කෘති පරිශීලනයට මෙන් ම, ඒ ආශ්‍රිත වෙනත් නිර්මාණ නැරඹීම (උදාහරණ - බැද්දේගම චිත්‍රපටය) සඳහා සිසුන්ට අවස්ථාව ලබා දිය යුතු ය. එමෙන් ම බැද්දේගම නවකතාව පිළිබඳ ලියවුණු විචාර ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි පරිශීලනය සඳහා මඟ පෙන්වීම සිදුකිරීම ද යෝග්‍ය වේ. ශිෂ්‍යයන් කණ්ඩායම් වශයෙන් බෙදා එක් එක් පරිච්ඡේද වෙන්කොට ලබා දී එකී පරිච්ඡේද පිළිබඳ ව විචාරාත්මක සංවාදයක් කණ්ඩායම් වශයෙන් ගොඩ නැඟීමට අවස්ථාව සලසා දීම මගින් මුල් අදියරේ ඉගැන්වෙන සිද්ධාන්ත කරුණු ගිලිහී යාමට ඉඩ නොදී නිරන්තර ඇගයීමකට බඳුන් කිරීමට හැකි වේ යැයි යෝජනා කළ හැකිය.

## 2.3.11 ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර

**6.** සිංහල කෙටිකතාවේ යථාර්ථ නිරූපණය පැහැදිලි කොට 'දිසොන්චිනාහාමි' කෙටිකතාවේ ආකෘතික හා ශෛලීමය විශේෂතා විස්තර කරන්න. (ලකුණු 15 යි.)

යථාර්ථ නිරූපණය: සමාජයේ සැඟවුණු යථාර්ථය නිර්මාණවලට පිවිසෙන්නේ මාර්ටින් වික්‍රමසිංහගේ කෘතිවලිනි. ඊට පෙර පැවතියේ කතා පුවත් විස්තර කිරීමේ මාර්ගය යි. මතුපිටින් පෙනෙන තත්ත්වයට එපිටින් ඇති සංකීර්ණත්වය සාහිත්‍ය කෘතියක නිරූපණය කිරීම යථාර්ථ නිරූපණය යි. එයින් අපේක්ෂා කෙරෙන්නේ මනුෂ්‍ය ජීවිතය යථා ස්වරූපයෙන් හෙවත් සත්‍ය හා අව්‍යාජ ආකාරයෙන් නිරූපණය කිරීම යි. ලේඛකයා මෙහි දී සැබෑ තත්ත්වය වාර්තා කිරීමක නිරත නො වේ. ඔහු කරන්නේ පවත්නා තත්ත්වයට ප්‍රතික්‍රියා දක්වමින් එය නිර්මාණාත්මක ව විදාරණය කිරීමකි. එහි දී චරිතයක බාහිර පාර්ශ්වය නො ව එහි අභ්‍යන්තරය ඇති සැටියෙන් පෙන්වා දීමට නිර්මාණකරුවාට හැකියාවක් ලැබේ.

ආකෘතිය: - මුල - මැද - අග වසයෙන් කතාවක් කීමේ ආකෘතියෙන් වෙනස් ව පාත්‍ර වර්ගයා/ චරිත මුල් /පදනම් කොට ගනිමින් කථා ප්‍රවෘත්තියේ අභ්‍යන්තරය නිරූපණය කිරීම මේ කෙටිකතාවේ ආකෘතික විශේෂත්වය යි.

ශෛලීමක විශේෂතා: මේ කෙටිකතාව සමකාලීන ලාංකික සමාජයේ එකිනෙකින් වෙනස් සමාජ ස්තර තුනක් නිරූපණය කරයි.

- ♦ දොස්තර ජයවර්ධන: වරප්‍රසාදිත තීරුව නියෝජනය කරයි. වෘත්තිය මූලික කොට ගත් හැඟීම් විරහිත ඉහළ නාගරික සමාජ ස්තරයට අයත් චරිතයකි.

  "එක ලෙඩෙක් මැරුණට වෛද්‍ය විද්‍යාව මැරෙන්නෙ නෑ නෙ. අපේ වගකීම ලෙඩ්ඩුන්ට වගේ ම වෛද්‍ය විද්‍යාවටත්. මේ වගේ වටින කේස් එකක් අවුරුදු ගණනකට හම්බ වෙන්නෙ නෑ."

- ♦ බන්ධුසේන: පහළ මැද පන්තිය නියෝජනය කරයි. වාමාංශික දේශපාලන මතවාදවලින් සකස් වුණු අදහස් සහිත පීඩිත පන්තියේ දුක් ගැහැට කෙරෙහි දැඩි ලෙස සංවේදී වූ, සාධාරණ සමාජයක් අපේක්ෂා කරන චරිතයකි.

  "වෛද්‍ය ඉතිහාසෙයට ඇතුළු වුණැයි කියල ඒ දුප්පත් හිඟන්නන්ට, මැරිච්ච කුණ ගෙදර ගෙනහුල්ල වළලන්න බැරි හිඟන්නන්ට ඇති වැඩේ මොකක් ද සර්?"

- ♦ දිසොන්චිනාහාමි: ගැමි පීඩිත පන්තිය නියෝජනය කරන චරිතයකි. ගැමි සමාජ ආකල්ප හා ඇඟයුම්වලින් මෙහෙයවුණු, දරිද්‍රතාවෙන් මෙන් ම හා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් පීඩනයට පත් වුව ද සාම්ප්‍රදායික ජීවිතයෙහි රැඳී සිටින ග්‍රාමීය දිළිඳු ජන කොටසෙහි ආකල්ප නිරූපණය කරයි.

  "මට දවස් දෙක තුනක නෙළුම් කාසිත් දෙන්න තියෙනව. කලබල වෙන්න එපා. ඔපරේෂන් කරන්නෙ හෙට ... ඔයාටත් දරුවන්ටත් බුදු සරණ යි"

මේ අන්දමින් එකිනෙකට වෙනස් සමාජ ස්තර තුනකට අයත් චරිත එක ම තැනකට ගෙන එමින් ඔවුන් අභිමුඛයෙහි පවත්නා සමාජ බේදවාචකය නිරූපණය කරයි.

- මේ හැර, මේ කෙටිකතාවේ යටි පෙළ මඟින් ප්‍රකාශ කෙරෙන කරුණු කිහිපයක් ද වේ. මෙරට රාජ්‍ය සේවයේ දක්නට ලැබෙන වගකීම් විරහිතභාවය මෙන් ම දේශපාලන අතපෙවීම් ද ඉහළ සමාජ ස්තරයෙහි බිඳ වැටුණු පවුල් සම්බන්ධතා හේතුවෙන් හුදෙකලා බවට පත් වන පුද්ගල චරිත මෙන් ම පොදු සමාජය හා බද්ධ වීමට නො හැකි වීම හේතුවෙන් ඔවුන් සංස්කෘතික අනාථභාවයට පත් වන ආකාරය ද මේ කෙටිකතාවෙන් නිරූපිත ය.

- අවස්ථා හා සිද්ධි ගළපමින් මෙය තනි ආඛ්‍යානයක් වශයෙන් ගොඩ නගා ඇති ආකාරය හේතුවෙන් මෙය සාර්ථක කෙටිකතාවක් ලෙස අගය කළ හැකි බව කෙරෙහි අවධානය යොමු කළ මනා ය. යෝග්‍ය නිදසුන් මඟින් මේ කරුණු පහදා තිබීම අපේක්ෂා කෙරේ.

### 2.3.12 ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 2.14**

**ප්‍රශ්න අංක 6 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය**




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන්,

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 04 -07 ප්‍රාන්තරයේ 37%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 36%ක් ද
ලකුණු 12- 15 ප්‍රාන්තරයේ 07%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂක ප්‍රතිශතය 07%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 57%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

**ප්‍රස්තාරය 2.15**

**ප්‍රශ්න අංක 6 සඳහා පහසුතා දර්ශක**




මූලාශ්‍රය : RD/16/ 4/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

නිර්දිෂ්ට කෙටිකතා සංග්‍රහය ඇසුරෙන් සකස් වූ මෙම ප්‍රශ්නයෙන් කෙටිකතාවේ මූලික අංගයක් වන යථාර්ථ නිරූපණය පැහැදිලි කොට ''දිසොන්චිනාහාමි චරිතය'' කෙටිකතාවේ ආකෘතික හා තේමාත්මක විශේෂතා ආශ්‍රයෙන් විචාරාත්මක ව විස්තර කිරීම අපේක්ෂිතය. නමුත් 23% ක් වූ අඩු අපේක්ෂකයන් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා තිබූ අතර එහි පහසුතාව 47%ක් වීම විශේෂත්වයකි.

නිර්දිෂ්ට කෙටිකතා සංග්‍රහය ඇසුරෙන් සකස් වූ මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් ප්‍රදානය කෙරේ.

කෙටිකතාවක මූලිකාංග පිළිබඳ අවබෝධය පරීක්ෂා කෙරෙන මෙම ප්‍රශ්නය තෝරා නො ගැනීමට හේතු වන්නට ඇත්තේ වැඩි අපේක්ෂක පිරිසක් තුළ මෙම කෙටිකතා මූලිකාංග පිළිබඳ පවතින අඩු අවධානය හා අනවබෝධය යැයි අනුමාන කළ හැකි ය. මෙම තත්ත්වය වර්ධනය කිරීම උදෙසා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා ශිෂ්‍යයාට මාර්ගෝපදේශ සපයමින් වඩාත් රසවින්දනාත්මක ව කෙටිකතා සංග්‍රහය ආශ්‍රිත මේ ප්‍රශ්නය තෝරා ගැනීමට සිසුන් අභිප්‍රේරණය කිරීම සුදුසු ය. ඒ සඳහා නව ඉගැන්වීම් ක්‍රමවේද භාවිත කරමින් සංවාද, සාකච්ඡා හා විවිධ ආකර්ෂණ ව්‍යාපෘති සංවිධානය කිරීමට අවස්ථාව ලබාදීම මෙන් ම කෙටිකතා ආශ්‍රිතව ලියැවුණු විචාර ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි පරිශීලනය සඳහා සිසුන්ට මග පෙන්වීම ද යෝග්‍ය වේ.

## 2.3.13 ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර

**7.** නිදහස් කවියේ ප්‍රථම තරංගයට/අවධියට අයත් ප්‍රමුඛ කවීන් තිදෙනෙකු පිළිබඳ කෙටි හැඳින්වීමක් කර, ඔවුන් කාව්‍ය නිර්මාණවල විශේෂ ලක්ෂණ **තුනක්** නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

**නැත හොත්**

නිදහස් කවියේ ද්විතීය තරංගයේ/අවධියේ කවීන්ගේ කාව්‍යමය වාග්විලාසයේ විශේෂතා පරාක්‍රම කොඩිතුවක්කු, දයාසේන ගුණසිංහ හා නන්දන වීරසිංහ යන කවීන්ගේ නිර්මාණ ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 15

නිදහස් කවියේ ප්‍රථම තරංගයට අයත් ප්‍රමුඛ කවීන් ලෙස **ජී. බී. සේනානායක, සිරි ගුනසිංහ, ගුණදාස අමරසේකර, මහගම සේකර, විමල් දිසානායක** ආදීන් නම් කළ හැකිය ඔවුන් පිළිබඳ කෙටි හැඳින්වීමක් පිළිතුරෙන් අපේක්ෂා කෙරේ. එහිදී පහත දැක්වෙන කරුණු පිළිබඳ අවධානය යොමු කළ හැකි ය.

1. නිදහස් ආකෘති භාවිත කිරීම
2. නව්‍ය කාව්‍යමය වාග් ව්‍යවහාරයක් යොදා ගැනීම
3. සංකේත භාවිතය
4. සාම්ප්‍රදායික හා ජන කවි ආකෘති උපයෝගි කර ගැනීම
5. හැඟීම් මාත්‍රයක් හෝ බුද්ධි ගෝචර තේමා නිර්මාණයට විෂය කර ගැනීම, දාර්ශනික නැඹුරුව

**ජී. බී. සේනානායක:**

බටහිර සාහිත්‍යයේ ජනප්‍රිය ව තිබූ නිදහස් කාව්‍ය සම්ප්‍රදායෙන් ආභාසය ලබා ගනිමින් 1946 දී රචනා කරන පලිගැනීම කෙටිකතා සංග්‍රහය මඟින් සිංහල පාඨකයාට පළමු වරට නිදහස් කවිය හඳුන්වා දෙන ලදී.

- මෙහි කැපී පෙනෙන ලක්ෂණ: ජී. බී. සේනානායක තම පද්‍ය නිර්මාණ හඳුන්වා දුන්නේ ගද්‍යයටත් පද්‍යයටත් අතර වන නිබන්ධ විශේෂයක් ලෙසිනි. එහෙත් ඒ නිර්මාණවල රිද්මයක් හා අර්ථ මාධූර්යයක් ඇති වන පරිදි පද සංඝටනාව සිදු කොට තිබේ.

**නිදසුන්:**

"දැවැන්තයකු වන බුද්ධිය
අඳුරෙහි මහ අඩි තබමින්
මා පිටු පසින් එනු
මට ඇසෙයි."

- උපමා, රූපක ආදි අලංකාර බහුල වශයෙන් භාවිත නො කිරීම - එහෙත් වාක් චිත්‍ර මැවීම.

**නිදසුන්:**

"යළිත් දෙවියන් සොයා ගිය මට
උන් වහන්සේගේ රන්වන් මළ සිරුර
මඟ අසල
නුග ගස යට තිබී සම්බ විය"

- සියුම් පුද්ගල මනෝභාව, දාර්ශනික සංකල්ප හා විචාර චින්තා ද කවියට යොදා ගැනීම. මාර්ටින් වික්‍රමසිංහ, ජී. බී. සේනානායකගේ පද්‍ය හඳුන්වා දී ඇත්තේ 'කවියට නඟන ලද විචාර චින්තා' ලෙස ය.

  නිදසුන්:
  දෙවියන් මැරීම
  බැමි
  රුව දැකීම
  නිශ්ශබ්දතාව

  ( මේ කරුණු යෝග්‍ය නිදසුන් මඟින් පැහැදිලි කර තිබීම අවශ්‍ය ය)

**සිරි ගුනසිංහ:**

සිරි ගුනසිංහ සමාජ ආර්ථික ව්‍යූහයෙහි දෘශ්‍යමානය නො ව එහි සැඟව පවත්නා අභ්‍යන්තර තතු කාව්‍යයට නැඟීමට ප්‍රයත්න දැරූ කවියෙකි. ආර්ථික හා සමාජ පදනම් ක්ෂණික වෙනස්වීම්වලට හෝ ඝෙදරායාම්වලට හෝ ලක් වන වකවානුවක මානව චර්යාවන්හි, චින්තනයෙහි හා සාරධර්මවල සිදු වන විපරිවර්තනය ඔහු ස්වකීය නිර්මාණ සඳහා විෂය කර ගත්තේ ය.

නිදසුන්:
සිහිනයක්, දිවා භෝජනය, මස් ලේ නැති ඇට, අබිනික්මන

- කාව්‍ය නිර්මාණකරණයේ දී සිරි ගුනසිංහ චිරාගත සාහිත්‍යාගත බස් වහර සමකාලීන ව්‍යවහාර භාෂාව සමග අපූර්ව ලෙස සංකලනය කොට නව්‍ය අනුභූති ප්‍රකාශනයට යෝග්‍ය අභිනව කාව්‍යමය වාග් ව්‍යවහාරයක් නිපදවීමෙහි සමත් විය. මස් ලේ නැති ඇට කාව්‍ය සංග්‍රහයේ මඳ වශයෙන් දක්නට ඇති මේ අපූර්ව භාෂා සංයෝජනය අබිනික්මන, රතු කැකුල යන කෘතිවල දී පරිපාකයට පත් ව ඇති ආකාරය පැහැදිලි වෙයි.

නිදසුන්: ජීවිතය ගොරවමින්
කෙල පෙරා නිරුවතින්
වැතිර ගෙන කුනු යහන් පල්ලේ
(මේ කරුණු යෝග්‍ය නිදසුන් මඟින් පැහැදිලි කර තිබීම අවශ්‍ය ය.)

**ගුණදාස අමරසේකර:**

ජී. බී. සේනානායක විසින් අරඹන ලද නිදහස් කාව්‍ය සාහිත්‍යය දේශීය සාහිත්‍ය මූල කරා ළඟා කරවීමේ ප්‍රවණතාවක් 1950 දශකය මැද භාගයේ සිට දක්නට ලැබිණ. ඒ ප්‍රවණතාවේ පුරෝගාමී කවියා ගුණදාස අමරසේකර ය.

අමරසේකර 1955 දී පළ කළ භාව ගීත කාව්‍ය සංග්‍රහයේ දී නිදහස් කාව්‍ය රීතියෙන් බොහෝ දුරට මිදී තම නිර්මාණ පැරණි විරිත්වලට අනුකූල ව රචනා කෙළේ ය. මේ ආකාරයට අතීත උරුමය කෙරෙහි ආසක්ත වූ අමරසේකර ස්වකීය කාව්‍ය නිර්මාණවල අන්තර්ගතය සම්බන්ධයෙන් ද පාරම්පරික චින්තනයට සමීප වූ බවක් පෙනී යයි. භාව ගීත කාව්‍ය සංග්‍රහයේ එන නිර්මාණවලින් කිහිපයක් ජන කවි රීතියට අනුව රචනා කර තිබේ.

චින්තනයට සමීප වූ බවක් පෙනී යයි. භාව ගීත කාව්‍ය සංග්‍රහයේ එන නිර්මාණවලින් කිහිපයක් ජන කවි රීතියට අනුව රචනා කර තිබේ.

**නිදසුන්:**

උදේ ඉඳන් අවු කට්ටේ උඹව තියන් මැඩෙච්චාට
උඹේ හිතට අමාරු දැයි කියාපන්කො දුන් වත් මට

- අනෙක් නිර්මාණ පවා කිසියම් නිශ්චිත වීරිතකට අනුව රචනා කර ඇත.
- මුල් කාලයේ පටන් කාව්‍යයේ ප්‍රකාශන රීතිය පිළිබඳ විවිධ අත්හදා බැලීම් කළ අමරසේකර ජන කවි රීතිය සහ දේශීය සාහිත්‍ය මූලාශ්‍රය කෙරෙහි නැඹුරු වූ අතර නිර්මාණවල ආකෘතිය පමණක් නොව අන්තර්ගතය ද ජන කවි රීතියට අනුව සකසා ගැනීමට යොමු වූයේ ය.
- ජී. බී. සේනානායක සහ සිරි ගුනසිංහ මෙන් නො ව අමරසේකර පුද්ගල හා සමාජීය අර්බුදවලට විසඳුම් සොයා අතීතයට යොමු වන කවියෙකි.

අමරසේකරගේ මුල් කාව්‍ය කෘතිවල සුලබ ව දක්නට ලැබුණු පුද්ගලවාදී දෘෂ්ටිය සමාජ දෘෂ්ටියක් බවට පරිවර්තනය වීම ආවර්ජනා කාව්‍ය සංග්‍රහයේ විශේෂ ලක්ෂණයකි. 1971 අප්‍රේල් කැරැල්ල ආශ්‍රිත සිදුවීම් පාදක කොට රචිත 'දිනපොතේ ලියූ කවියක්' හා 'මෙහෙකාරියගේ මිය ගිය පියා' වැනි නිර්මාණ ඊට නිදසුන් කළ හැකි ය.

**(මේ කරුණු යෝග්‍ය නිදසුන් මගින් පැහැදිලි කර තිබීම අවශ්‍ය ය.)**

මහගම සේකරඃ

මහගම සේකර ආරම්භක අවධියේ පටන් නානා විධ කාව්‍ය සම්ප්‍රදායන් සමීප ව ඇසුරු කරමින් අත්හදා බැලීම් රැසක් සිදු කළ කවියෙකි.

- 1950 දශකය වන විට ලංකාවේ ප්‍රචලිත වෙමින් පැවති නිදහස් කාව්‍ය රීතියට සමීප වනු දැකිය හැකි ය. නිදහස් කාව්‍යය සාම්ප්‍රදායික සිංහල කාව්‍යයට අනුරූප ව සකස් කර ගැනීමට ඇතැම් කවීන් උත්සාහ දරූ අතර ව්‍යංගා කෘතියෙහි ද ජන කවි රීතිය ආශ්‍රිත ව නිර්මාණය කරන ලද පද්‍ය පන්ති දෙකක් ඇතුළත් වෙයි.
- සක්වාලිහිණි 1962 - සේකරගේ කවිත්වයේ සාධනීය ලක්ෂණ මෙන් ම සීමා ද පැහැදිලි ව දැක ගත හැකි කෘතියක් ලෙස සක්වාලිහිණි හැඳින්විය හැකි යග මේ කෘතියෙහි ද සේකර ජන කවි රීතිය සිය නිර්මාණවලට උපයෝගී කර ගැනීම පිළිබඳ අත්හදාබැලීම්වල යෙදුණු අයුරු දක්නට ලැබේ. 1961 වසරේ පළවූ ගුණදාස අමරසේකරගේ අමල් බිසො කාව්‍ය සංග්‍රහයේ අන්තර්ගත කාව්‍ය නිර්මාණවල රීතියට බෙහෙවින් සමීප කාව්‍ය නිර්මාණ කිහිපයක් සක්වාලිහිණි කෘතියේ අන්තර්ගත වෙයි. අමරසේකරගේ 'අමල් බිසෝ' නමැති දීර්ඝ කාව්‍ය නිර්මාණයේ සේයාව සේකරගේ 'කිඳුරු කුමාරිගේ කතාව' නමැති දීර්ඝ කාව්‍ය නිර්මාණයෙහි දක්නට තිබේ.
- සාම්ප්‍රදායික රබන් පද ඇසුරෙන් මහගම සේකර විසින් නිර්මිත 'කොන්ත නෝනා' නමැති කවි පෙළ පර්යේෂණාත්මක නිර්මාණයකි. එහි දී කවියා එක් ළඳක කෙරෙහි පිළිබඳ සිතක් ඇති කර ගත් ගැමි තරුණයකු තුළ ඇය නො ලැබී යාම නිසා උපන් සිතුවිලි නාටකාකාර ව උත්ප්‍රාසයෙන් ඉදිරිපත් කර තිබේ.
- හෙට ඉරක් පායයි (1963) නමැති කෘතියෙන් කාව්‍යයේ ප්‍රකාශන මාධ්‍යය පිළිබඳ පුළුල් අත්හදා බැලීමක් කළ බව පෙනෙයි. නවීන සංකීර්ණ අනුභූති ප්‍රකාශ කිරීමෙහි ලා දෘශ්‍ය ගෝචර ආකෘතියක් හෙට ඉරක් පායයි කෘතියේ දී භාවිත කර තිබේ.

- **මක් නිසා ද යත්** (1964) කාව්‍ය ආඛ්‍යානයෙන් වඩාත් පරිණත ලෙසින් සංකීර්ණ අනුභූති කාව්‍ය නිර්මාණවලට විෂය කර ගැනීමට උත්සාහ දරා තිබේ. ඒ වන විට සිරි ගුනසිංහ විසින් වර්ධනය කරන ලද සිංහල නිදහස් කාව්‍ය සම්ප්‍රදායේ ශක්‍යතා පිළිබඳ මනා වැටහීමකින් යුතු ව තත් කාව්‍ය සම්ප්‍රදාය නිර්මාණශීලි ව භාවිතයට ගත් අයුරු **මක් නිසා ද යත්** කෘතියෙන් පැහැදිලි වෙයි. මක් නිසා ද යත් කෘතියට විෂය වන්නේ අතිශයින් සංකීර්ණ අනුභූතියකි. මුළු මහත් සමාජය විෂය භූමි කොට එම සමාජයේ නා නා විධ චරිත ආශ්‍රයෙන් කවියා නිරූපණය කර තිබෙන්නේ සමකාලීන ලාංකේය සමාජයේ යථාර්ථය යි.
- රාජතිලක ලයනල් සහ ප්‍රියන්ත කාව්‍යයෙහි රචනා රීතිය විවිධත්වයෙන් යුක්ත වන්නා සේ ම චරිත සහ අවස්ථා නිරූපණය සමග ඓන්ද්‍රීය ලෙස බද්ධ වී තිබේ.
- 1973 වර්ෂයේ දී මහගම සේකරගේ නොමියෙමි කාව්‍ය අඛ්‍යානය පළ වන විට ඔහු සිංහල සාහිත්‍ය සම්ප්‍රදායට අයත් ගද්‍ය පද්‍ය නිර්මාණ මෙන් ම විශ්ව සාහිත්‍යයේ විවිධ කාව්‍ය ප්‍රවණතා පිළිබඳ පැතුරුණු අවබෝධයක් ලබා ගත් වෘද්ධ හෙවත් පරිණත කවියකු බවට පත් ව සිටි බව. පළමු ව තමා ජීවත් වන සමාජයේ මිනිසාගේ තථ්‍ය ජීවිතය පිළිබඳ සියුම් වූත් ගැඹුරු වූත් නිරූපණයක් එම කෘතියෙහි අන්තර්ගත ය.
- කාව්‍යෝචිත බස් වහර සම්බන්ධ අත්හදාබැලීම: මේ යටතේ සම්භාව්‍ය සාහිත්‍ය භාෂාව, ජන කවි වහර හා අද්‍යතන ව්‍යවහාර භාෂාව සිය නිර්මාණවලට උපයෝගි කොට ගත් ආකාරය සාකච්ඡා කළ හැකි ය.

නිදසුන්:

■ කසී පලස්
සුවඳ බොජුන්
වර අඟනන් පිරුණු ඇතොර
රජ ගෙය පිරි රාජ ඉසුර

■ තහර වැල් ඉලිප්පී
කටු ගැසුණු පොතු සිරුර

- ධ්වනිතාර්ථ හා උචිත සංකල්ප රූප භාවිතය:

නිදසුන්:

■ දහදියෙන් ලුණු පිපෙන
ධූලි වැකි ගත කොරල ඉරිතැළෙන
ගිනියමෙහි
දිව ගිලෙන පිපාසා නොසිඳවා...

**විමල් දිසානායක:**
ජන කාව්‍ය සම්ප්‍රදාය හා විදග්ධ කාව්‍ය සම්ප්‍රදාය ඇසුරෙන් සිංහල කවියට උචිත භාෂා විලාසයක් සකස් කර ගැනීමට උත්සුක වූ කවියෙකි.

- සමකාලීන අත්දැකීම් වස්තු කර ගැනීම
- පැරණි කවි බස හා නූතන ව්‍යවහාර භාෂාව සංකලනයෙන් නිපදවා ගත් කවි බස
- ධ්වනිතාර්ථවත් හා රූපකාර්ථවත් භාෂා භාවිතය

"කොළ හැළී ඇටසැකිලි ගස් පෙනේ එක දිගට"
"බලන විට අවට ලොව ඇර මතකයෙහි දෙඇස"
"පෙනෙයි නාගලකන්ද පැරණි මිතුරකු විලස"

- සංකල්ප රූප හා සංකේත අතිශයෝක්තියෙන් කවියට නැඟීමට ගත් උත්සාහය

"සිරුර ගිනි ගත් විලස කලබලෙන් දුව පනින"

♦ කාව්‍ය අධ්‍යයනයෙන් උපන් පරිකල්පනීය ස්වභාවයකින් යුක්ත අනුභූතීන් තම කාව්‍ය නිර්මාණ සඳහා යොදා ගැනීම ආදී කරුණු යෝග්‍ය නිදසුන් මඟින් පැහැදිලි කර තිබීම අපේක්ෂා කෙරේ.

(ලකුණු 15 යි)

**නැත හොත්**

නිදහස් කවියේ ද්විතීය තරංගයේ/අවධියේ කවීන්ගේ කාව්‍යමය වාග්විලාසයේ විශේෂතා පරාක්‍රම කොඩිතුවක්කු, දයාසේන ගුණසිංහ හා නන්දන වීරසිංහ යන කවීන්ගේ නිර්මාණ ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 15 යි.)

■ නිදහස් කවියේ ද්විතීය තරංගය යටතට වැටෙනුයේ 1970 දශකයේ සිට ප්‍රචලිත වූ නව කාව්‍ය මාර්ගයට අනුගත කාව්‍ය නිර්මාණ යි.

■ 'කාව්‍යමය වාග්ව්‍යවහාරය' යන්නෙන් අදහස් කෙරෙනුයේ කාව්‍ය රචනයේ දී කවීන් විසින් උපයුක්ත භාෂා ශෛලිය, වාක් කෝෂය, අලංකාර විධි ආදිය යි. චිරන්තන සිංහල පද්‍ය සාහිත්‍යයෙහි පද්‍යකරණය සඳහා වෙන ම ව්‍යවහාර ප්‍රභේදයක් භාවිත විය. කෝට්ටේ යුගයෙන් පසු ව ඒ තත්ත්වය වෙනස් වූ බව පෙනේ. (හෙළ හවුල් කවීන් දූනුදු එවැනි වෙනස් භාෂා ව්‍යවහාරයක් භාවිත කරනු දැකිය හැකි ය.)

■ තේමාව අතින් මෙන් ම ආකෘතිය අතින් ද වෙනස් මඟක් ගත් නිදහස් කවියේ ද්විතීය තරංගයේ කවීන්ගේ බොහෝ නිර්මාණ සමකාලීන ව්‍යවහාර භාෂාවෙන් රචනා වුව ද ඇතැම් කවීන් සම්භාව්‍ය සාහිත්‍යික භාෂාවෙන් හා ජන කවි බසින් ද ආභාසය ලබමින් සිය බස් වහර සකසා ගත් ආකාරය කෙරෙහි මේ පිළිතුරෙන් අවධානය යොමු කොට තිබීම අවශ්‍ය වෙයි.

■ පරාක්‍රම කොඩිතුවක්කු ලියූ 'දේදුන්න පායාවි හෙටත් පාළම උඩින්' නම් පද්‍ය නිර්මාණයට වස්තු වී ඇත්තේ සිය පෙම්වතිය හැර යාම නිසා පරාජිත නො වී සිටීමට උත්සාහ දරමින් ජීවිතයට මුහුණ දෙන්නට තැත් කරන තරුණයෙකුගේ අදහස් ය.

**කොඩිතුවක්කු කවියාගේ කාව්‍යමය වාග් විලාසයේ කැපී පෙනෙන ලක්ෂණ:**

♦ පුද්ගල මනෝභාව තීව්‍රාකාරයෙන් නිරූපණය කිරීමට උචිත පරිදි පුරාණෝක්ති හා සම්භාව්‍ය සාහිත්‍යාගත යෙදුම් උපයෝගි කොට ගැනීම

**නිදසුන්:**

ඔබ යන්න මධුරතර සප්තස්වරය අරන්
ඔබේ රථ මැදිරියට මගේ ඉර හඳ අරන්
....
පෙම් ගී අලංකාර වීසි කොට යනු මැනවි
නිල් ගුවන් ගැබ වදින කුරුල්ලකු පරිද්දෙන්

♦ ව්‍යවහාර භාෂාව ඇසුරෙන් සකසා ගත් ධ්වනිතාර්ථවත් යෙදුම් උපයෝගි කොට ගැනීම

**නිදසුන්:**

හෙමෙන් මා අත අතැර - දෙපස හෙවණැලි අතර
ඔබ සෙමෙන් හැංගුණේ - එය වඩා විනීත යි

එදා ඔබ ගෙයි මුල්ලෙ - සොයා ගත් මං දිනුම්
ඔබ සැඟව ගියෙ කොයි ද- සොයන්නේ නෑ ඉතිං

♦ රූපකාර්ථවත්භාවය හා නව්‍ය කාව්‍යෝක්ති භාවිතය

**නිදසුන්:**

ඔබ යන්න මහද තෙත් වැහි වලාකුළ අරන්
...
සුරලා ගෙන යන්න මා හදේ පිපුණු මල්
මල් නඟන වසන්තය ඔබට ගෙන යා හැකි ද

■ දයාසේන ගුණසිංහගේ 'රන් තැටියක කඳුළු' පැදි පෙළට වස්තු වී ඇත්තේ සිය බිලිඳු දියණියන් තිඹිරි ගෙයි දී ම මිය යාම හේතුවෙන් පුද්ගලයකු තුළ ඇති වූ කම්පනය යි.

♦ කවි වහරේ ඇතැම් යෙදුම් ප්‍රතිවිරුද්ධාර්ථවත් ව නව්‍ය පරිසරයක යොදා ගැනීම

**නිදසුන්:**

මොහොතකින් සඳ ඒවි තනියට
රන් තැටිය පුරවා කඳුලින්

♦ උචිත කාව්‍යෝක්ති භාවිතය

**නිදසුන්:**

අවදි වන ඇසි පියෙන්
බිඳී සුන් වන ලොවක
...
කිරිගරුඬ කොත් හෙළන
අඳුරු සෙවණැලි අතර

♦ සංකේත භාවිතය

**නිදසුන්:**

සෙනෙහසේ නිධානය

♦ ධ්වනිතාර්ථවත් හා රූපකාර්ථවත් යෙදුම්

**නිදසුන්:**

වෙස් මුහුණු තුළට වූ බහිරවයින්
.... වට වෙමින් අඬු නියෙන්
පැහැර සඟවන අතර
....
මෙතෙක් ලොව නො ඇසුව

මියුරු නැලවිලි ගී
ළයට කැටි කොට නිඳයි ඔබෙ මව
අවදි වන ඇසිපියෙන්
බිඳී සුන් වන ලොවක

♦ භාවාත්මක ස්වරූපය

**නිදසුන්:**

සෙමෙන් තව තව සෙමෙන්
පස් පිඩලි පෙරළන්න
මවගෙ ඇකයෙහි පහස
නො දත් දූරියකි සිඟිති
...
මම ද යම් දියණියනි
මොහොතකින් සඳ ඒවි තනියට

■ නන්දන වීරසිංහගේ 'ආදරණීය පාසල' පැදි පෙළට වස්තු වී ඇත්තේ ගතානුගතික අධ්‍යාපන ක්‍රමය මඟින් නූතන ශිෂ්‍ය පරම්පරාවට අත්පත් කර ගත හැකි ජයග්‍රහණය කුමක් ද යන පැනය සමාජය හමුවේ තැබීම බව පෙනේ.

♦ උත්ප්‍රාසවත් භාෂා භාවිතය

**නිදසුන්:**

ප්‍රීති සිත් වියරු කළ තැන
මගේ ශුද්ධ වූ පාසල!
...
අදත් එහි උළෙලකි
සමත් අයහට කිළිණ පුද දෙන
....
තව ම පැසසුම් ලබන
ඉදිරි පෙළ සිසු කැල!

ආදරණීය පාසල!

♦ සංක්ෂිප්ත හා ධ්වනිතාර්ථවත් යෙදුම්

**නිදසුන්:**

කන්ද පාමුල
තව මත් පෙර සේ ම
එදා තිබූ තැන ම
මගෙ පැරණි පාසල!

කන්ද නො නැඟ ම පෙර මෙන්
එක ම තැන ලැග හිඳිමින්
පෙරමුණට සටන් සගයන් එවන

♦ වියත් බස හා නූතන ව්‍යවහාර භාෂාව සංකලනය

**නිදසුන්:**

ඉදිරි පෙළ සිසු නඩය
සරදම් සිනා දී
ප්‍රීති සිත් වියරු කළ තැන

මෙත් සිහිල් ආදර
වදන් වෑහෙන මහ සබයෙහි
තව ම පැසසුම් ලබන

**(මෙවැනි නිදසුන් දක්වමින් පිළිතුරු ලියා ඇත්නම් යෝග්‍ය පරිදි ලකුණු පිරිනමන්න.)**

**(ලකුණු 15 යි)**

### 2.3.14 ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 2.16**

**ප්‍රශ්න අංක 7 සඳහා අපේක්ෂකයන් ලබා ගත් ලකුණුවල ව්‍යාප්තිය**




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන්,

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 04 -07 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 35%ක් ද
ලකුණු 12- 15 ප්‍රාන්තරයේ 17%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 17%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 48%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

**ප්‍රස්තාරය 2.17**

**ප්‍රශ්න අංක 7 සඳහා පහසුතා දර්ශක**




මූලාශ්‍රය : RD/16/ 4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ.

නූතන පද්‍ය ඇසුරෙන් සැකසූ මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්නයකින් ද යුක්ත වේ. තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 43%කි. සමස්ත පහසුතාව 55%කි. පළමු ප්‍රශ්නයේ පහසුතාව 48%ක් වන අතර විකල්ප ප්‍රශ්නයේ පහසුතාව 63%කි.

නිර්දිෂ්ට නූතන පද්‍ය සංග්‍රහය ඇසුරින් සකස් වී ඇති මෙම ප්‍රශ්නය නිදහස් කවියේ ප්‍රථම අවධියට අයත් ප්‍රමුඛ කවීන් තිදෙනෙකු පිළිබඳ කෙටි හැඳින්වීමක් කර ඔවුන්ගේ කාව්‍ය නිර්මාණවල විශේෂ ලක්ෂණ නිදසුන් දක්වමින් සාකච්ඡා කිරීම අපේක්ෂිත ය. එසේ ම විකල්ප ප්‍රශ්නයේ දී නිදහස් කවියේ දෙවන අවධියට ඇතුළත් කවීන්ගේ කාව්‍යමය වාග්විලාසයේ විශේෂතා පරාක්‍රම කොඩිතුවක්කු, දයාසේන ගුණසිංහ හා නන්දන වීරසිංහ යන කවීන්ගේ නිර්මාණ ඇසුරෙන් විග්‍රහ කිරීම අපේක්ෂා කර ඇත. මෙම ප්‍රශ්නය තෝරා ගැනීම 43%කි. එහි පහසුතාව 55%කි. එහි පළමුවන ප්‍රශ්නය සඳහා පහසුතාව 48% ක් වන අතර විකල්ප ප්‍රශ්නය සඳහා පහසුතාව 63%කි. මෙම ප්‍රශ්නයේ පළමු කොටසින් **ඍජු** සිද්ධාන්තමය කාරණා පිළිබඳ අවබෝධය මැන බැලෙන අතර විකල්ප ප්‍රශ්නයෙන් කාව්‍යමය වාග් විලාසයේ විශේෂතා පිළිබඳ විමර්ශනය කරන රසවින්දනාත්මක පිළිතුරක් අපේක්ෂා කර ඇත.

මේ අනුව **ඍජු** සිද්ධාන්තමය කාරණාවලට සාපේක්ෂ ව රසවින්දනාත්මක විචාරය සඳහා අපේක්ෂකයන් වැඩි රුචිකත්වයක් දක්වා ඇති බව පෙනේ. එබැවින් සිද්ධාන්තමය කාරණා පිළිබඳ අපේක්ෂකයන්ගේ අඩු අවධානය හේතුවෙන් එම ප්‍රශ්නය තෝරා නොගෙන ස්වාධීන ව රසවින්දනාත්මක ව පිළිතුරු සැපයිය හැකි විකල්ප ප්‍රශ්නය තෝරා ගැනීමට අපේක්ෂකයන් යොමු වූවා යැයි උපකල්පනය කළ හැකිය. මේ අනුව පාසල තුළ දී සිදු කරනු ලබන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා ශිෂ්‍යයා ගේ කාව්‍යමය සිද්ධාන්ත පිළිබඳ ව පවතින අඩු අවධානය පිළිබඳ සැලකිලිමත් වී නව ඉගෙනුම් ක්‍රමවේද භාවිත කරමින් ශිෂ්‍යයාගේ කාව්‍යමය සිද්ධාන්ත පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම උදෙසා සිසුන් අභිප්‍රේරණය කළ යුතු ය. එමෙන් ම ස්වයං අධ්‍යයනය මගින් කාව්‍යමය මූලිකාංග ඇසුරු කොටගත් පද්‍ය නිර්මාණ පරිශීලනය, ඒවායේ නිර්මාණ ලක්ෂණ ඇගයීම හා නිර්මාණාත්මක ලේඛන කුසලතා වැඩි දියුණු කිරීම ආදි කාරණා කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කිරීම වඩාත් යෝග්‍ය වනු ඇත.

## 2.3.15 ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර

**8.** සාම්ප්‍රදායික චින්තනයෙන් මිදී මූලාශ්‍රය ඉක්මවා යෑමට එදිරිවීර සරච්චන්ද්‍ර සමත් වූ ආකාරය පෙමතො ජායතී සොකො නාට්‍ය පෙළ ඇසුරෙන් පරීක්ෂා කරන්න. (ලකුණු 15 යි.)

ස්වර්ණතිලකා කථා වස්තුව පදනම් කොට ගනිමින් නූතන සමාජයට ගැළපෙන ආකාරයෙන් යෝග්‍ය නාට්‍යෝචිත අවස්ථා හා සිද්ධි තෝරා ගැනීමත් පැරණි ලේඛකයා දරූ දෘෂ්ටියෙන් වෙනස් ව ස්ත්‍රී චරිතය දෙස බැලීමත් පෙමතො ජායතී සොකො නාටකයේ විශේෂත්වයක් වසයෙන් හඳුනා ගැනීමට ශිෂ්‍යයා සමත් වී තිබිය යුතු ය.

පෙමතො ජායතී සොකො නාට්‍යය සඳහා මූලාශ්‍රය කොට ගෙන ඇත්තේ සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා කථා වස්තුව යි. එහෙත් මූලාශ්‍රයයේ අන්තර්ගත චරිත කෙරෙහි පුළුල් දෘෂ්ටියක් හෙළමින් සැබෑ මනුෂ්‍ය චරිත ස්වරූපයෙන් යුක්ත වන සේ ද අවස්ථා විශ්වසනීයත්වයෙන් හා නාට්‍යෝචිතභාවයෙන් යුක්ත ව ද නිරූපණය කිරීමෙන් නාට්‍ය රචකයා මූලාශ්‍රයය ඉක්මවා යාමට සමත් වූ ආකාරය පිළිතුරෙන් පෙන්වා දිය යුතු ය. එහි දී පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කළ මනා යඃ

i. සාම්ප්‍රදායික යති සාහිත්‍යය දෘෂ්ටියට අනුව රචිත සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා වස්තුව ස්ත්‍රී ගර්භාව ඇතුළත් නිර්මාණයකි. මේ නාට්‍ය රචකයා ස්ත්‍රිය සම්බන්ධ ආචීර්ණ කල්පික දෘෂ්ටියට අභියෝග කරයි.

නිදසුන්ඃ සාම්ප්‍රදායික කතා පුවතට අනුව ස්වර්ණතිලකා රූප මානයෙන් මත් ව වංශවතකු පතමින් සිටින්නියකි. නාට්‍යකරුවා මවන ස්වර්ණතිලකා වියපත් පියාට උවටැන් කිරීමේ අරමුණින් පැමිණෙන්නියකි.

"කරනු වස් උවටහන්
ම පියාට අසරණ වූ
ආවෙමි ය ඔහු කැටුව
ස්වාමියකු සරණ
පාවා ගන්ට මා සිතේ
අදහසක් නො වී කිසි"

ii. කර්ම ඵල අනුව රූප ශෝභාව උරුම කොට ගත් ස්ත්‍රිය පිළිබඳ පුවත අත් හරී

නිදසුන්ඃ සාම්ප්‍රදායික කතා පුවතට අනුව ස්වර්ණතිලකා රූප ශෝභාව උරුම කොට ගන්නේ බුදුන්ට මල් පිදූ බැවිනි. ඇය හීන යැයි සම්මත ජන්මයක් ලබන්නේ මලස්න නො සෝදා මල් පිදූ බැවිනි. මේ අතීත කතා නාට්‍ය රචකයා අත් හැර දමා ඇත.

iii. මානව හැසිරීම් හා චිත්ත චෛතසික විග්‍රහයට යොමු වෙමින් උද්දාල - ස්වර්ණතිලකා බැඳීම ස්ත්‍රී පුරුෂ ප්‍රේම සම්බන්ධතාවක් සේ නිරූපණය හා මුල් කෘතියෙහි ඒ හා බැඳුණු අභව්‍ය සිදුවීම් අත් හැරීම

**නිදසුන්:** ''මා කෙරේ සෙනෙහෙ ඇති
කෙනෙක් නැත මුළු ලොවේ
පාලු කතරකි මා හද
නැත එහි සෙවණක්
සිහිලස ගෙන දෙන දිය සීරාවක්
නැත එහි හට ගන්නේ''

''ඇදුරුතුමා වෙන්න මගේ
තුදුන් නමුත් ශිල්ප ශාස්ත්‍ර
ජීවිතයේ ගිරි දුර්ගය
නගින්න අත්වැලක් වෙන්න''

iv. ප්‍රේමයෙන් මත් වූ උද්දාල බමුණා සිය වෘත්තීය හා සමාජ වගකීම් පැහැර හැරීම තාත්වික ආකාරයෙන් දැක්වීම හා ඔහු කාල්පනික ලෝකයක වින්දනය ලබන බව දැක්වීම හා ස්වර්ණතිලකා ව්‍යවහාර බුද්ධියෙන් යුතු ස්ත්‍රියක සේ දැක්වීම

**නිදසුන්:**

''සරණ වූ නිමිත්තෙන් ගුරුතුමා
මංගල විලාසෙන්
කෙළිත්වා සිසුහු සැම
අලස සුව විඳිත්වා
තව කලක් යන තුරු ම''

''ගෘහවාසේ ඇරඹූ අප දෙදෙනාහට
ගත නො වී ද සාර මසක් ඇදුරිඳුසඳ
බලා සිටිති කුමාරයෝ
ඔබ එන තුරු ශිල්ප දෙන්ට
නොපමා ව යනු යෙහෙකි
සමීපෙට ඔවුන්ගේ
මුදු මොලොක් තරුණ සිත
සුළු දෙයින් කලකිරේ
බොළඳ සිතුවිලි රැසක්
නැඟ ඒ ය ක්ෂණයකින්''

**(මෙවැනි කරුණු හා තවත් උචිත චරිත ලක්ෂණ හා අවස්ථා නිදසුන් දක්වමින් පැහැදිලි කොට ඇත්නම් යෝග්‍ය පරිදි ලකුණු පිරිනමන්න)**

(ලකුණු 15 යි)

**2.3.16 ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය**

**ප්‍රස්තාරය 2.18**

**ප්‍රශ්න අංක 8 සඳහා අපේක්ෂකයන්ගේ ලකුණුවල ව්‍යාප්තිය**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 51%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන්,

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 17%ක් ද
ලකුණු 04 -07 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 43%ක් ද
ලකුණු 12- 15 ප්‍රාන්තරයේ 15%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂක ප්‍රතිශතය 15%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 42%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 7ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ.

**ප්‍රස්තාරය 2.19**

**ප්‍රශ්න අංක 8 සඳහා පහසුතා දර්ශක**




මූලාශ්‍රය : RD/16/ 4/OL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ.

මෙම ප්‍රශ්නය "පෙමතො ජායතී සොකො'' නාට්‍යය ආශ්‍රිත ව සැකසී ඇති අතර මේ සඳහා ලකුණු 15ක් හිමි වේ. සම්ප්‍රදායික චින්තනයෙන් මිදී මූලාශ්‍රය ඉක්මවා යාමට එදිරිවීර සරච්චන්ද්‍ර සමත් වූ ආකාරය 'පෙමතෝ ජායති සොකෝ' නාට්‍යය ඇසුරින් පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිත ය. මේ ප්‍රශ්නය තෝරා ගැනීම 51%කි. එහි පහසුතාව 53%කි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නාට්‍ය පෙළ රසවින්දනය කළ යුතු අතර ම එහි එන චරිත විවිධ අවස්ථාවන් හි හැසිරෙන ආකාරය හා නාට්‍ය විකාශනයට එමගින් සිදුවන බලපෑම පිළිබඳ ශිෂ්‍ය අවධානය යොමු කළ යුතු ව ඇත. එමෙන් ම ප්‍රශ්නය නිවැරදි ව අවබෝධ කර ගනිමින් ඊට අදාළ පරිදි විමර්ශනශීලී ව කරුණු ඉදිරිපත් කරමින් පිළිතුරු ලිවීමට ශිෂ්‍යයන් පුහුණු කිරීම වැදගත් වේ. එමෙන් ම නාට්‍ය පෙළ රසවින්දනය කිරීමෙන් අනතුරු ව නාට්‍ය සජීවී ව නැරඹීම වඩාත් යෝග්‍ය වනුයේ නාට්‍ය හැදෑරීමේ දී පෙළ සාහිත්‍ය අධ්‍යයනය කිරීම මුඛ්‍ය පරමාර්ථය වන හෙයිනි.

## III කොටස

# 3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය

**කාලය පැය 03කි.**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත ය.

I කොටස

මෙම කොටසට වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 20කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 20කි.

II කොටස

අර්ධ ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න හතකි. 2 හා 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටසේ 2 හා 3 ප්‍රශ්නවලට ලකුණු 25 බැගින් ද සෙසු ප්‍රශ්නවලට ලකුණු 15 බැගින් ද, ලැබේ.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 20 + 80 = 100

මූලාශ්‍රය : අ.පො.ස (උ.පෙළ) විභාගය - 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න

## 3.1 II පත්‍රයේ විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.1**

**II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය හා එක් එක් ප්‍රශ්නයේ පහසුතාව**




මූලාශ්‍රය : RD/16/ 3/AL හා RD/16/ 4/AL පත්‍රිකාවලින් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

මෙහි දෙවන හා තෙවන ප්‍රශ්නය අනිවාර්ය වුව ද, අපේක්ෂකයන්ගේ ප්‍රශ්න ප්‍රතිශතය තෝරා ගැනීම 91%ක් හා 92%ක් පමණ වේ. දෙවන ප්‍රශ්නය අවබෝධය හා සාරාංශය ආශ්‍රිත ව ඉදිරිපත් වී ඇත. එහි පහසුතාව 84%කි. තෙවන ප්‍රශ්නය වූ රචනයේ පහසුතාව 20%කි. 4 ප්‍රශ්නයෙන් අපේක්ෂකයන්ගේ වාක්‍ය රීති හා කර්මකාරක වාක්‍ය පිළිබඳ අවබෝධය මැනීම සිදුකර ඇත. තෝරා ගැනීම 18%ක් වූ ව්‍යාකරණ අනු අංග දක්වන 5 ප්‍රශ්නයේ පහසුතාව 53%කි. කෙටි සටහන් ලිවීමට වෙන් කළ 8 ප්‍රශ්නය තෝරා ගැනීම 17%කි. එහි පහසුතාව 53%කි.

**ප්‍රස්තාරය 3.2**

පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය




මූලාශ්‍රය : RD/ 16/03/AL/ පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි. දෙ.

2 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 71%ක් ප්‍රශ්නය සඳහා වෙන්කළ ලකුණෙන් 76- 100% පන්ති ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගෙන ඇත. 1, 6 ප්‍රශ්න සඳහා අපේක්ෂකයන්ගෙන් වැඩි ප්‍රතිශතයක් ප්‍රශ්නය සඳහා වෙන්කළ ලකුණින් 26 -50% පන්ති ප්‍රාන්තරයේ ලකුණු ලබාගෙන ඇති අතර 2,3,5,7,8 ප්‍රශ්න සඳහා අපේක්ෂකයන්ගෙන් වැඩිම ප්‍රතිශතයක් ලකුණු ලබාගෙන ඇත්තේ එම ප්‍රශ්න සඳහා වෙන්කළ ලකුණෙන් 51-75% පන්ති ප්‍රාන්තරය තුළ ය.

වි
1.3

ප්‍රස්තාරය 3.3
II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/ 16/05/AL/ පත්‍රිකාවෙන් පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.4**

විෂයයේ තේමා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/ 16/05/AL/ පත්‍රිකාවෙන් පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

### 3.2 II පත්‍රයේ I කොටසේ පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

බහුවරණ ප්‍රශ්න 20කින් සමන්විත මෙම ප්‍රශ්නය මගින් සිංහල භාෂාව පිළිබඳ අපේක්ෂකයන් සතු නිරවුල් දැනුම, අවබෝධය, ස්මරණ හැකියාව, භාෂා පරිචය හා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්ෂා කර ඇත.

මෙම බහුවරණ ප්‍රශ්න 20ට ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල ප්‍රශ්න පත්‍රයට හිමි පැය 3ක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I කොටසේ ප්‍රශ්න 20ට ම පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත්, සාමාන්‍යයෙන් පැය 1/2 ක කාලයක් ඒ සඳහා යෙදවීම ප්‍රමාණවත් වේ යැයි අපේක්ෂා කෙරේ.

භාෂා කුසලතා, ව්‍යාකරණය, අවබෝධය යන ප්‍රධාන තේමාවලට යෝග්‍ය ආකාරයෙන් මෙම ප්‍රශ්න පත්‍රයෙහි අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 20 සකස් කර ඇත. භාෂා කුසලතා යටතේ අක්ෂර වින්‍යාසය ( 1.1, 1.2 හා 1.4) අකාරාදි පිළිවෙළ (1.3) වචන කෝෂය (1.5, 1.6 හා 1.7) ලේඛන ව්‍යවහාරය (1.20) යන අංශවලට අදාළ ව ප්‍රශ්න ඉදිරිපත් කර තිබේ.

1.8, 1.9, 1.10, 1.11, 1.12, 1.13, 1.14, 1.15,1.16, 1.17, 1.18, 1.19 ප්‍රශ්න ව්‍යාකරණ තේමාව යටතේ වර්ග කළ හැකි ය. මේ සෑම ප්‍රශ්නයක් සමග ම අවබෝධය අනුබද්ධ ව පවතී.

එම ප්‍රශ්න අතුරෙන් අංක 1.10 ප්‍රශ්නය වඩාත් පහසු ප්‍රශ්නය වී ඇති අතර එහි පහසුතාව 83%ක් වේ. දෙවනුව පහසු ප්‍රශ්න වී ඇත්තේ, අංක 1.13 හා 1.14 වේ. ඒ ප්‍රශ්න දෙකෙහි ම පහසුතාව 75%කි.

මෙහි 1.10 ප්‍රශ්නයෙන් මැන බැලෙන ක්‍රියාපද භාවිතය පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය ඉහළ මට්ටමක පවතී. අංක 1.13 ප්‍රශ්නයෙහි අව්‍යය ශබ්දවල ප්‍රභේදයක් වන නිපාත පද හඳුනා ගැනීම දී ඇති වරණ ඔස්සේ පහසුවෙන් හඳුනා ගැනීමට බොහෝ අපේක්ෂකයන් සමත් වී ඇත. අංක 1.14 ප්‍රශ්නයෙහි වාක්‍යයක යොදා නිවැරදි සන්ධි, උපසර්ග හා තද්ධිත පිළිබඳ විමසා ඇති අතර වැඩි අපේක්ෂයන් පිරිසක් අදාළ පිළිතුර තෝරාගත් බව දැකිය හැකිය.

අංක 1.2, 1.9, 1.15, 1.16 හා 1.20 යන ප්‍රශ්නවල පහසුතාව 50%- 74% අතර ප්‍රාන්තරයට අයත් වේ. අනෙකුත් ප්‍රශ්නවලට සාපේක්ෂ ව මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අපේක්ෂකයන්ට පහසු වී ඇති බව අනාවරණය වේ. 1.1, 1.3, 1.4, 1.5, 1.6, 1.8, 1.12, 1.17 හා 1.19 යන ප්‍රශ්නවල පහසුතාව 30% – 40% ත් අතර වේ.

අංක 1.7, 1.11 හා 1.18 යන ප්‍රශ්නවල පහසුතාව 30%ට වඩා අඩුය. එම ප්‍රශ්න බොහෝ අපේක්ෂයන්ට නිවැරදි පිළිතුරු සැපයීමට දුෂ්කර වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය. ඒ අතුරෙන් වඩාත් ම දුෂ්කර වී ඇති ප්‍රශ්නය වන්නේ 1.7 ප්‍රශ්නය යි. එහි පහසුතාව 21% කි. බොහෝ අපේක්ෂකයන් තුළ තද්භව පද හඳුනාගැනීම පිළිබඳ ව ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීම මෙයට හේතු විය හැකිය.

පළමු වන ප්‍රශ්නයේ 1-1 සිට 1- 4 දක්වා ප්‍රශ්න සැකසී ඇත්තේ අක්ෂර මාලාව පාදක කරගෙන යි. එහි 1.1,1.3,1.4 ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 38%, 35%, හා 35% 1.2 ප්‍රශ්නයේ පහසුතාව 50%ක් වේ.

1.5, 1.6, සහ 1.7 යන ප්‍රශ්නය සකස් කර ඇත්තේ නිෂ්පන්න, තත්සම හා තත්භව පද පිළිබඳ අවබෝධය විමසා බැලීමට යි. සංස්කෘත සහ පාලි භාෂා පිළිබඳ අවබෝධයකින් යුක්ත ව එම ප්‍රශ්නවලට යොමු විය යුතු ය. මෙම ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 39%, 41% සහ 21%ක් වේ.

1.8 සහ 1.16 ප්‍රශ්න සැකසී ඇත්තේ සමාස පිළිබඳ අවබෝධය මැන බැලීමට යි. එම ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 49%ක් සහ 59%ක් වේ.

1.9 සහ 1.11 ප්‍රශ්න ප්‍රත්‍යයාර්ථ නාම ඇසුරු කොටගෙන ඇත. එයින් 1-9 කෘදන්ත සඳහා ද, 1.11 තද්ධිත සඳහා ද වෙන් වේ. කෘදන්ත පිළිබඳ ප්‍රශ්නයේ පහසුතාව 64%කි. තද්ධිත ප්‍රශ්නයේ දී පහසුතාව 29%කි. 1-10 ප්‍රශ්නය ක්‍රියා පද ඇසුරින් ගොඩනැගෙන ප්‍රශ්නයක් වේ. එහි පහසුතාව 83%කි.

1.12 සහ 1.13 ප්‍රශ්න සැකසී ඇත්තේ අව්‍යයපද අනුසාරයෙනි. එයින් උපසර්ග පිළිබඳ ප්‍රශ්නයෙහි පහසුතාව 42%ක් වන අතර නිපාත පද පිළිබඳ ප්‍රශ්නයෙහි පහසුතාව 75%කි. එකම ව්‍යාකරණ මූලිකාංග යක කොටස් 02 කෙරෙහි අපේක්ෂකයා දක්වන වෙනස් ප්‍රතිචාර අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එම ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ සැලකිල්ලකින් යුතු ව පාඩම් ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතු බව පෙනේ. එම කොටස් ද ඇති ව සැකසෙන 1.14 සහ 1.15 ප්‍රශ්න සඳහා පිළිවෙළින් 75% සහ 61%ක පහසුතාවක් ඇත.

1.17 ප්‍රශ්නය සන්ධි විධි පිළිබඳ දැනුම විමසා ඇත. එහි පහසුතාව 39%කි. එය ද වඩාත් අභිප්‍රේරණය විය යුතු ව්‍යාකරණ සංකල්පයකි. 1.19 ප්‍රශ්නය ''වාක්‍ය රීති'' පිළිබඳ විමසන එකම ප්‍රශ්නය යි. එහි දී පහසුතාව 37% කි.

1.20 වැනි ප්‍රශ්නය ලේඛන ව්‍යවහාරය පිළිබඳව විමසීමක් වන අතර එහි පහසුතාව 62%කි.

විශේෂයෙන් ම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන් අභිප්‍රේරණය කර ගැනීම සඳහා ක්‍රියාකාරකම් සහිත ව සැලසුම් සහගතව සකස් කර ගැනීම යෝග්‍ය යැයි යෝජනා කරමු.

## 3.3 සිංහල II පත්‍රය I කොටස

NEW
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

විභාග අංකය : ..........................

**උපදෙස්:**

* **I** කොටසේ **1** ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

### I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. සිංහල අක්ෂර මාලාවෙහි එන 'ය්' යන්න කවර ගණයකට අයත් අක්ෂරයක් ද?
(1) මූර්ධජ අඝෝෂ ඌෂ්ම (2) තාලුජ අඝෝෂ අර්ධ ස්වර
(3) තාලුජ ඝෝෂ අර්ධ ස්වර (4) කණ්ඨෞෂ්ඨජ අඝෝෂ
(5) දන්තෞෂ්ඨජ ඝෝෂ අර්ධ ස්වර (……)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) ප්‍රස්ථාවනා, උච්චාරණ, නෂ්ඨාවශිෂ්ට, නික්ලේශී, පළතුරු
(2) ප්‍රස්ථාවනා, උච්ඡාරණ, නශ්ටාවශිෂ්ට, නික්ලේෂී, පලතුරු
(3) ප්‍රස්තාවනා, උච්චාරණ, නෂ්ටාවශිෂ්ට, නික්ලේශී, පලතුරු
(4) ප්‍රස්ථාවනා, උච්චාරණ, නෂ්ඨාවශිෂ්ඨ, නික්ලේෂී, පළතුරු
(5) ප්‍රස්තාවනා, උච්ඡාරණ, නෂ්ඨාවශිෂ්ඨ, නික්ලේශී, පලතුරු (……)

1.3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) ජ්‍යාමිතිය, ජංගම පුස්තකාලය, ජගන්මාතා, ඥාන විභාගය
(2) ඥාන විභාගය, ජ්‍යාමිතිය, ජංගම පුස්තකාලය, ජගන්මාතා
(3) ජගන්මාතා, ජ්‍යාමිතිය, ජංගම පුස්තකාලය, ඥාන විභාගය
(4) ජංගම පුස්තකාලය, ජගන්මාතා, ඥාන විභාගය, ජ්‍යාමිතිය
(5) ජගන්මාතා, ජංගම පුස්තකාලය, ඥාන විභාගය, ජ්‍යාමිතිය (……)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) මහාප්‍රාණ අක්ෂරයක් වචනයක මුල නො යෙදේ.
(2) මහාප්‍රාණ අක්ෂර දෙකක් වචනයක එක ළඟ නො යෙදේ.
(3) මහාප්‍රාණ අක්ෂරයකට පසු ව අනුස්වාරය භාවිත නො වේ.
(4) මහාප්‍රාණ අක්ෂරයකට මුලින් විසර්ගය නො යෙදේ.
(5) අල්පප්‍රාණ අක්ෂරයකට මුලින් මහාප්‍රාණ අක්ෂරයක් යෙදේ. (……)

1.5. එකිනෙකට අනුරූප වන සේ යෙදුණු වචන යුගල සහිත වරණය තෝරන්න.
(1) සමරු දෙසුම, මඟුල් බණ, වෙද මැඳුර, රස ගඟුල
(2) සමරු දේශනය, වෛද්‍ය මන්දිරය, විද්‍යා පිබිදුම, සූර්ය එළිය
(3) ආලෝක දහර, සාංවත්සරික උළෙළ, උයන් ක්‍රීඩා, සඳ පහන
(4) දිය කෙළිය, ස්වර සංකේත, සාපේක්ෂ ගනකම, විෂය දැනුම
(5) තෘණ පඳුරු, මේඝ නද, ගුවන් යාත්‍රාව, ස්ඵෝටන හඬ (……)

1.6. තත්සම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ජලය, විදුලිය, වාතය, සුළඟ
(2) විද්‍යුතය, ධ්වනිය, නාදය, නිද්‍රාව
(3) පද්‍ය, සූක්ෂ්ම, පිළිවෙත, මඬුල්ල
(4) පුෂ්පය, පරාගය, රොන්සුණු, දම්කඳ
(5) සඟපෙළ, අභියාචනය, වලාකුළු, වායුධාරාව (......)

1.7. තද්භව වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) සංසාරය, නිර්වාණය, බුදුසසුන, මෝහය
(2) ජනගහනය, චේතනාව, මෝහනය, සැදෑ අඳුර
(3) දියදම්, ගමන්මඟ, ගුවන්ගැබ, විසුළු මුහුණ
(4) සොබාදහම, අයුක්තිය, අටලෝදහම, ගුණදායක
(5) මියුරු නාදය, බව තිමිර, තාලරූප, හස්තලීලා (......)

1.8. අව්‍යය සමාස, විශේෂණ සමාස, විභක්ති සමාස, අන්‍යාර්ථ සමාස අනුපිළිවෙළින් යෙදී ඇති වචන පේළිය තෝරන්න.
(1) පාපියුම්, සුවඳ, සරාසඳ, දසබල
(2) සරාසඳ, පාපියුම්, සුවඳ, දසබල
(3) සුවඳ, දසබල, පාපියුම්, සරාසඳ
(4) දසබල, සුවඳ, පාපියුම්, සරාසඳ
(5) සුවඳ, පාපියුම්, සරාසඳ, දසබල (......)

1.9. කෘදන්තයක් **නො වන** වචනයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) කැඩූ, බැලූ, බිණූ, මැරූ
(2) කැඩුම්, බැලුම්, බිණුම්, රැකුම්
(3) පිසමන්, වියමන්, කියමන්, ලියමන්
(4) නටන, බණන, බලන, බසින
(5) නැටිලි, පැනිලි, බැලිලි, පැතලි (......)

1.10. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "බලා පලා **යව** අස්වන් ගුරුළු කෙත"
(ආ) "**සිඳින** මඩින එක ලෙස පැතිරෙයි සුවඳ"
(ඉ) "ගව්වෙන් ගව්ව දිව මාලිග **සැදේවා**!"
(ඊ) "**දමාලා** යන නරක කුණු කය..."
(1) විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා
(2) පූර්වක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(3) අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා
(4) ආශීර්වාදක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා, විධික්‍රියා
(5) විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා (......)

1.11. තද්ධිතයක් **නො වන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) තොටි, නැවි, පිනි, සැබි
(2) කෙටි, ගැමි, රැටි, ලෙව්
(3) දැහැමි, නැකැති, ඇඳිරි, සිඟිති
(4) වකුටු, කරටි, පහටි, පැනිති
(5) අරටු, ඉඟටි, කඩිති, කළටි (......)

1.12. උපසර්ගයක් **යෙදී නොමැති** වචනයක් සහිත වරණය තෝරන්න.
(1) සමාගම, සමුපකාර, සංචරණ, සංවර්ධන
(2) අනුකූල, අනුනායක, අනුරූප, අනුශාසන
(3) විරූප, විදේශ, විගමන, විකාල
(4) අවතරණ, අවමාන, අවධාරණ, අවනම්බු
(5) කුකවි, කුකුළු, කුදිටු, කුමන්ත්‍රණ (......)

1.13. නිපාතයක් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) අතර, අන්න, අනුව, අනේ
(2) එක්කෝ, එපා, එහෙත්, දැන්
(3) හෙයින්, හෙවත්, හොත්, හෝ
(4) පරිදි, පසු, පිණිස, පිළිබඳ
(5) නැවත, නිතර, කරා, නෑම (......)

1.14. **අතිශයෝක්ති** අලංකාරය භාවිතයෙහි ලා **ප්‍රබුද්ධ** කවිහු **උද්‍යෝගිමත්** වෙති.
යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරින් දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණාංගවලට ද?
(1) සන්ධි, උපසර්ග, තද්ධිත
(2) සන්ධි, තද්ධිත, උපසර්ග
(3) උපසර්ග, තද්ධිත, සන්ධි
(4) තද්ධිත, සන්ධි, උපසර්ග
(5) උපසර්ග, සන්ධි, තද්ධිත (......)

1.15. සමාන ව්‍යාකරණ ලක්ෂණ ඇතුළත් **නො වන** ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.
(1) කියවූ, කරවූ, පෙන්වූ, දැවූ
(2) පැවසුවා ය, පෙන්වුවා ය, විමසුවා ය, වැනසුවා ය
(3) කියූහ, දැක්වූහ, පැවසූහ, ලියූහ
(4) ඇසූ, නැසූ, පිසූ, විසූ
(5) කරයි, දුවයි, බලයි, කියයි (......)

1.16. සමාසයක් **නො වන** වචනයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අකුසල්, අයහපත්, උපකාර, යාවජීව
(2) ගත්කරු, බුදුගුණ, මල්පොකුර, සඳඑළිය
(3) අරමුණු, පොල්තෙල්, බලුනකුට, සිල්රෙදි
(4) පොතපත, මල්දම්, රියපොළ, හිරුසඳු
(5) කළුකෙස්, දිගගවුම, නිලුපුල්, රතුමල් (......)

1.17. එක ම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.
(1) අරුණාලෝක, නරේන්ද්‍ර, ස්වෝත්සාහ, මහාධිකරණය
(2) ලෝකෝත්තර, පුරුෂෝත්තම, විද්‍යෝදය, බහුපකාර
(3) ජාතිකානුරාගය, දැගසවි, බුත්සරණ, බුද්ධීන්ද්‍රිය
(4) අග්‍රාමාත්‍ය, ආත්මාරක්ෂාව, උපමාලංකාර, අමාත්‍යාංශය
(5) මලසුන, අල්ලස්, ඉන්නල, උනුන් (......)

1.18. ව්‍යාකරණානුකූල ව **නො ගැළපෙන** වරණය කුමක් ද?
(1) දකුණත, යනෙන, සුරිඳු, හිඟුරල
(2) මැටිබඳුන්, කිරිබත්, රන්කම්, මිරිස්කුඩු
(3) විසින්, බඳු, නොහොත්, කෙරෙන්
(4) අප, උප, අදි, අති
(5) ස්වර්ණමය, රන්මුවා, සිල්වත්, බීමත් (......)

1.19. ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.
(1) මාර්ග නීති උල්ලංඝනය කළ සිවුදෙනකු අත්අඩංගුවට ගන්නා ලදි.
(2) සියලු ඥාති මිත්‍රාදීන් මේ නිවේදනය පිළිගනිත්වා!
(3) රජතුමා විසින් සඟමිත් මෙහෙණින් වහන්සේ ගරු බුහුමනින් පිළිගන්නා ලදි.
(4) දියණියන් ආපසු ගමට ගියා ය.
(5) ජනතාව හමුවේ දේශපාලකයන් ආදර්ශවත් ව කටයුතු කළ යුතු ය. (......)

1.20. ලේඛන ව්‍යවහාරයට අනුකූල වාක්‍යය සහිත වරණය තෝරන්න.
(1) ඇමති මණ්ඩලයේ පදවි බාර ගන්න ඇතැමුන් ඉදිරිපත් වෙන්නේ නැහැ.
(2) කාගේවත් වරදක් කියන්නට කමක් ඇත්තේ නැතැයි මා විසින් කීවා.
(3) කොළඹට පැමිණි මොහු පිටරට යුද පිණිස නැව් නැඟුමට යෙදුණා.
(4) ඔවුන් නිසා දැන් ගම්වලත් ඒ සිරිත පැතිරෙනවා.
(5) මේ කතාව ඉදිරිපත් කරන්නේ ගැමියකුගේ දෘෂ්ටිකෝණයෙනි. (......)

(ලකුණු 20 යි.)

**3.4 II පත්‍රය - I කොටස සඳහා ලකුණු දීමේ පටිපාටිය**

වගුව 3.1

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 01 | 3 | 11 | 1 |
| 02 | 3 | 12 | 5 |
| 03 | 4 | 13 | 5 |
| 04 | 2 | 14 | 1 |
| 05 | 1 | 15 | 1 |
| 06 | 2 | 16 | 3 |
| 07 | 3 | 17 | 4 |
| 08 | 5 | 18 | 5 |
| 09 | 5 | 19 | 5 |
| 10 | 5 | 20 | 5 |

මූලාශ්‍රය : අ.පො.ස (උ.පෙළ) සිංහල - ලකුණු දීමේ පටිපාටිය, 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**3.5 සිංහල II පත්‍රයේ I කොටසේ වරණ තෝරා ගෙන ඇති ආකාරය**

වගුව 3.2

එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති අපේක්ෂක ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | ** |
| **1** | **3** | **6.00** | **34.68** | **38.21** | **10.07** | **10.90** | **0.13** |
| **2** | **3** | **18.14** | **7.40** | **50.48** | **14.77** | **9.10** | **0.10** |
| **3** | **4** | **17.51** | **9.17** | **28.78** | **34.61** | **9.70** | **0.23** |
| **4** | **2** | **7.04** | **34.68** | **11.54** | **16.47** | **30.24** | **0.03** |
| **5** | **1** | **38.78** | **8.60** | **13.70** | **29.21** | **9.50** | **0.20** |
| **6** | **2** | **16.24** | **40.98** | **15.11** | **12.50** | **15.14** | **0.03** |
| **7** | **3** | **13.70** | **10.30** | **21.17** | **37.75** | **16.94** | **0.13** |
| **8** | **5** | **5.20** | **11.60** | **28.91** | **5.10** | **49.08** | **0.10** |
| **9** | **5** | **9.07** | **4.60** | **7.24** | **15.21** | **63.79** | **0.10** |
| **10** | **5** | **1.40** | **8.17** | **6.27** | **0.87** | **83.29** | **0.00** |
| **11** | **1** | **28.78** | **23.57** | **20.21** | **17.57** | **9.84** | **0.03** |
| **12** | **5** | **43.18** | **4.17** | **7.30** | **3.70** | **41.58** | **0.07** |
| **13** | **5** | **6.34** | **9.94** | **3.23** | **5.70** | **74.72** | **0.07** |
| **14** | **1** | **74.79** | **7.77** | **8.84** | **2.67** | **5.84** | **0.10** |
| **15** | **1** | **61.49** | **9.40** | **5.74** | **19.37** | **3.80** | **0.20** |
| **16** | **3** | **16.64** | **5.24** | **59.05** | **9.14** | **9.80** | **0.13** |
| **17** | **4** | **10.54** | **31.98** | **8.00** | **38.91** | **10.50** | **0.07** |
| **18** | **5** | **15.74** | **35.61** | **10.24** | **15.87** | **22.44** | **0.10** |
| **19** | **5** | **17.27** | **16.21** | **21.24** | **8.04** | **37.21** | **0.03** |
| **20** | **5** | **5.47** | **6.14** | **17.71** | **8.70** | **61.82** | **0.17** |

* ප්‍රතිචාර නොදක්වූ හා එක් වරණයකට වඩා ප්‍රතිචාර දක්වා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.5 a**

II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක (2 -5)




මූලාශ්‍රය : RD/ 16/04/AL/ පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.5 b**

II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක (6 -8)




මූලාශ්‍රය : RD/ 16/04/AL/ පරීක්ෂණ හා සංවර්ධන ශාඛාව 2020, ශ්‍රී. ලං. වි. දෙ.

## 3.6 II පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා සුවිශේෂී නිරීක්ෂණ සහ නිර්දේශ

### 3.6.1 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර

### II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **සතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සාහිත්‍යකරුවා ද සෙසු මනුෂ්‍යයන් මෙන් සමාජයක ජීවත් වන්නෙකි. එහෙත් සමාජයේ ජීවත් වන සෙස්සන්ට වඩා ඇතැම් විශේෂතා ඔහු තුළ විද්‍යමාන වේ. නිරීක්ෂණ කෞශල්‍යයක් හා වින්දන ශක්තියක් ඔහු තුළ පිහිටා ඇත්තේ ය. ඔහු සූක්ෂ්මදර්ශී ය; සමාජයේ ඇති වන දුක-සැප, දොම්නස-සොම්නස, බැඳුම්-ගැටුම් විනිවිද දකී. ඒවා ඔහුගේ අමුද්‍රව්‍ය වන්නේ ය. එම අමුද්‍රව්‍ය ඇසුරින් ඔහු අපූරු කල්පනා ලෝකයක් නිර්මාණය කරයි. මෙනයින් බලන කල කවර උසස් සාහිත්‍ය කෘතියක වුව ද තැන්පත් වන්නේ රචකයා වෙසෙන සමාජයේ ජීවය යි; හරය යි. සිය කාර්යභාරය මැනවින් වටහා ගත් සාහිත්‍යකරුවා කාලීන සමාජ හරය පිළිබිඹු කිරීමෙන් පමණක් සෑහීමකට පත් නො වේ. ස්වකීය පුද්ගල දෘෂ්ටියට අනුව, සමාජයේ ප්‍රගතියට හේතු වන පරිද්දෙන්, තත්කාලීන සමාජයේ අඩුලුහුඩුකම් ද දක්වයි. සාහිත්‍යකරුවාගෙන් ජන සමාජයට සැලසෙන එක් වැදගත් මෙහෙයක් නම් අවටැති සමාජය පැහැදිලි ලෙස සිතුවම් කොට, සමාජ උන්නතියට අනර්ථකාරී වූ බලවේගයන්ගේ තථ්‍ය ස්වරූපය විශද කොට, ඒවා මූලෝත්පාටනය කිරීමට අනුබල දීම යි.

කවර සාහිත්‍යාංගයකට වුව ද පාදක වන්නේ අවටැති සමාජ ජීවිතයේ හරය යි. එහෙත් මෙකී ලක්ෂණය වඩාත් පැහැදිලි ලෙසත්, පරිපූර්ණ ලෙසත්, දක්නට ලැබෙන්නේ නවකථාවෙහි ය. කවියාටත් නාට්‍යකරුවාටත් යම් යම් සීමාවන් ඇතුළත ක්‍රියා කිරීමට සිදු වන්නේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් අභිමුඛයෙහි ඇති විෂය ක්ෂේත්‍රය එක්තරා ප්‍රමාණයකට පටු වේ. එහෙත් නවකථාකරුවා බැඳ තබන සීමා නැත; ඇත්නම් අල්පයකි. එහෙයින් අවශේෂ ලේඛකයන්ට වඩා තියුණු වූත් ගැඹුරු වූත් ආකාරයෙන් සමාජ ජීවිතය නිරූපණය කිරීමේ වරප්‍රසාදය නවකථා රචකයාට හිමි වන්නේ ය. නවකථාව වනාහි සමාජය හමුවේ තබා ඇති කැඩපතකි. එය දෙස බලන පාඨකයාට තමාගේත් සමාජයේත් අඩුලුහුඩුකම් ප්‍රත්‍යක්ෂ වේ. ඒ නිසා පොදුවේ සැම උසස් සාහිත්‍ය කෘතියකටත් විශේෂ වශයෙන් නවකථාවටත් සමාජ අර්ථයක් පදනම් වන බව කිව මනා ය.

(i) මෙහි සඳහන් වන ආකාරයට සෙසු මනුෂ්‍යයන්ට වඩා සාහිත්‍ය නිර්මාණකරුවා තුළ දක්නට ලැබෙන විශේෂතා **දෙක** කවරේ ද?

(ii) සාහිත්‍ය රචකයා ස්වකීය කෘති රචනය සඳහා අමුද්‍රව්‍ය වශයෙන් භාවිත කරන්නේ මොනවා ද?

(iii) සාහිත්‍යකරුවාගෙන් ජන සමාජයට සැපයෙන මෙහෙය වශයෙන් මෙහි දැක්වෙන්නේ කුමක් ද?

(iv) කවියාගේත් නාට්‍යකරුවාගේත් විෂය ක්ෂේත්‍රය පටු වන්නේ කවර හේතුවක් නිසා ද?

(v) අවශේෂ ලේඛකයන්ට වඩා නවකථා රචකයාට ඇති වරප්‍රසාදය කුමක් ද?

(vi) නවකථාව නමැති කැඩපත දෙස බලන පාඨකයාට ප්‍රත්‍යක්ෂ වන්නේ කුමක් ද?

(ලකුණු 12 යි.)

(අ)

i. 1. නිරීක්ෂණ කෞශල්‍යය

2. වින්දන ශක්තිය

**(කොටස් දෙක ම ඇත්නම් ලකුණු 02 කි. එක් කොටසකට ලකුණු 01 කි.)**

ii. 1. සමාජයේ ඇති වන දුක - සැප, දොම්නස - සොම්නස, බැඳුම් - ගැටුම්

**(කොටස් තුනට ලකුණු 02 කි. කොටස් දෙකකට ලකුණු 01 කි. එක් කොටසක් පමණක් ඇත්නම් ලකුණු හිමි නොවේ.)**

iii. අවට සමාජය පැහැදිලි ලෙස සිතුවම් කොට, සමාජයේ උන්නතියට අනර්ථකාරී වූ බලවේගයන්ගේ තථ්‍ය ස්වරූපය දක්වා ඒවා මූලෝත්පාටනය කිරීමට අනුබල දීම.
**(කොටස් තුනට ලකුණු 02 කි. කොටස් දෙකකට ලකුණු 01 කි. එක් කොටසක් පමණක් ඇත්නම් ලකුණු හිමි නොවේ.)**

iv. (කවියාට හා නාට්‍යකරුවාට) යම් යම් සීමාවන් ඇතුළත ක්‍රියා කිරීමට සිදුවීම

v. තියුණු වූත් ගැඹුරු වූත් ආකාරයෙන් සමාජ ජීවිතය නිරූපණය කිරීමේ හැකියාව ලැබී තිබීම.

vi. තමාගේත් (පාඨකයා) සමාජයේත් අඩුලුහුඬුකම්.

(ලකුණු 02 x 6 = 12 යි

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශයෙ අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

වසර දහසකට අධික කාලයක් අනුරාධපුරය හා පොළොන්නරුව කේන්ද්‍ර කොට ගෙන රජරට ව්‍යාප්ත ව පැවති සිංහල ශිෂ්ටාචාරය කෙටි කාලයක් තුළ දී පරිහානිය කරා ගමන් ගත්තේ ය. පළමු වන පරාක්‍රමබාහු රජ දවස උච්චස්ථානයක පැවති දේශපාලන ස්ථාවරත්වය, ආර්ථික සමෘද්ධිය හා ශාසනික උන්නතිය ඔහුගේ අභාවයෙන් දශක තුනක් වැනි කෙටි කාලයක් ඇතුළත දුර්වල තත්ත්වයකට පත් විය. මෙවැනි තත්ත්වයක් උදා වීමට හේතු වූයේ දේශපාලන අස්ථාවරත්වය හා විදේශ ආක්‍රමණ යි. මාඝ ආක්‍රමණය, චන්ද්‍රභානු ආක්‍රමණ, පාණ්ඩ්‍ය ආක්‍රමණ මෙකල එල්ල වූ ප්‍රබල විදේශ ආක්‍රමණ යි. විශේෂයෙන් ම මාඝ ආක්‍රමණය පෙර නො වූ විරූ ආකාරයේ ඉතා දරුණු එකක් විය. කේරළ කුලී හේවායන් විශාල සංඛ්‍යාවකින් යුත් සේනාවක් සමග පැමිණ මෙරට පාලකයා ව සිටි පරාක්‍රම පාණ්ඩ්‍ය නෙරපා දමා දරුණු ක්‍රියාකලාපයක් අනුගමනය කරමින් පොළොන්නරුව අල්වා ගෙන එහි දී අභිෂේකය ලබා ඔහු ස්වකීය ආධිපත්‍යය පැතිරවී ය. දීර්ඝ කාලයක් මෙසේ සිටිමින් මාඝ අනුගමනය කළ ක්‍රියාකලාපය රජරට ශිෂ්ටාචාරයේ ඉරණම කෙරෙහි තීරණාත්මක අයුරින් බල පෑ බව පෙනේ. ඔහු සිංහල බෞද්ධයන් තුළ චිරස්ථායී ව පැවති සමාජ සංවිධානය, කුල චාරිත්‍ර, ආර්ථිකයේ ජීවනාලිය වූ වාරිමාර්ග පද්ධතිය, සාහිත්‍යයේ මුදුන්මල්කඩ වූ වටිනා පොත්පත්, බෞද්ධ සිද්ධස්ථාන විනාශ කරමින් භික්ෂූන් වහන්සේලාට, ප්‍රභූ පන්තියට හා සාමාන්‍ය ජනතාවට වධහිංසා පමුණුවමින් සිංහල බෞද්ධ සභ්‍යත්වය විනාශ කරමින් රජරට ශිෂ්ටාචාරය කඩා බිඳ දැමී ය.

(ලකුණු 13 යි.)

(ආ) සාරාංශය (වචන 50 - 60)

- අනුරාධපුර හා පොළොන්නරුව කේන්ද්‍ර කොට ගෙන රජරට ව්‍යාප්තව පැවැති සිංහල ශිෂ්ටාචාරය පරිහානියට ලක්වීම.
- පළමුවන පරාක්‍රමබාහු රජ දවස උච්චස්ථානයක පැවැති දේශපාලන ස්ථාවරත්වය, ආර්ථික සමෘද්ධිය හා ශාසනික උන්නතිය ඔහුගේ අභාවයෙන් දශක තුනක කාලයක් ඇතුළත දුර්වල වීම.
- දේශපාලන අස්ථාවරත්වය හා විදේශ ආක්‍රමණ මෙයට ඉවහල් වීම.
- රජරට ශිෂ්ටාචාරයේ ඉරණම කෙරෙහි මාඝගේ ආක්‍රමණ දැඩිව බලපෑම
- සිංහල බෞද්ධයන් තුළ පැවැති සමාජ සංවිධානය, කුල චාරිත්‍ර, වාරිමාර්ග පද්ධතිය, වටිනා පොත්පත් බෞද්ධ සිද්ධස්ථාන ඔහු විසින් විනාශ කිරීම.
- භික්ෂූන් වහන්සේලාට, ප්‍රභූ පන්තියට හා සමාන්‍ය ජනතාවට වධහිංසා දී. සිංහල බෞද්ධ සභ්‍යත්වය විනාශ කිරීම හා රජරට ශිෂ්ටාචාරය බිඳ දැමීම ද මාඝ ආක්‍රමණයෙන් සිදුවීම.

**ඉහත කරුණු ඇතුළත්ව ලේඛන ව්‍යවහරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර, ඡේදවලට බෙදා ඇත්නම්, සමස්තයෙන් ලකුණු දෙකක් අඩු වේ. වචන**

සංඛ්‍යාව 50 - 60 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ නම් ලකුණු 03ක් අඩු වේ.

| | | |
|---|---|---|
| සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට | - | ලකුණු 02 යි. |
| අක්ෂර වින්‍යාසයට | - | ලකුණු 03 යි. |
| අන්තර්ගතයට | - | ලකුණු 08 යි. |

### 3.6.2 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය

ප්‍රස්තාරය 3.6

ප්‍රශ්න අංක 02 සඳහා අපේක්ෂකයන්ගේ ලකුණුවල ව්‍යාප්තිය




මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වුව ද පිළිතුරු සපයා ඇත්තේ 91%කි. මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව 25කි.

ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 02%ක් ද
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 04%ක් ද
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 19 -25 ප්‍රාන්තරයේ 71%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. ලකුණු 19 හෝ 19ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 71%කි. 6%ක අපේක්ෂක ප්‍රතිශතය ලබා ගෙන ඇත්තේ ලකුණු 12 හෝ 12 අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

ප්‍රස්තාරය 3.7

ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/ 4/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි, දෙ.

මෙම ප්‍රශ්නය (අ), (ආ) යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර (අ) කොටසේ අනුකොටස් 6කි. එම අනුකොටස්වල පහසුතාව 80% ඉක්මවා ඇත. (ආ) කොටසේ අනුකොටස් තුනකි. එම අනුකොටස්වල පහසුතාව පිළිවෙළින් 81%, 64%, 58%ක් වේ.

2 ප්‍රශ්නයේ (අ) කොටස ඇසුරෙන් ඡේදයක් කියවා අවබෝධ කර ගැනීමේ කුසලතාව පරීක්ෂා කර ඇත. ලබා දුන් ඡේදය ඇසුරෙන් ලකුණු 2x6 = 12 ලැබෙන ලෙස ප්‍රශ්න හයක් ඉදිරිපත් කර ඇත. (i),(ii) කොටස සඳහා 99%ක පහසුතාවක් ද **(vi)** කොටස සඳහා 97%ක පහසුතාවක් ද, (iii) කොටස සඳහා 96%ක පහසුතාවක් ද (v) කොටස සඳහා 86%ක පහසුතාවක් ද (iv) කොටස සඳහා 80%ක පහසුතාවක් ඇත. ඒ අනුව බොහෝ අපේක්ෂකයන් සතු ව අවබෝධය පිළිබඳ කුසලතාව ද ඉහළ අගයක පවතින බව මෙයින් මැනවින් පිළිබිඹු වෙයි.

එහෙත් අතළොස්සක පමණ අපේක්ෂකයන්ට ඍජු (කෙටි) පිළිතුරු සැපයීමට හැකියාවක් තිබුණු බවක් නො පෙනෙයි. ඔවුන් ඡේදයෙන් ම දීර්ඝ වාක්‍ය පිළිතුරු ලෙස ලියා තිබෙන අවස්ථා ද නිරීක්ෂණය විය. මේ තත්වය සරල ඡේදාවබෝධ ප්‍රශ්න විමසීමේ සිට සංකීර්ණ ඡේදාවබෝධ ප්‍රශ්න විමසීමත් දක්වා වූ අභ්‍යාස පන්ති කාමර ක්‍රියාවලියේ දී නිරන්තරයෙන් යොදා ගැනීමෙන් මඟහරවා ගත හැකිය.

2 ප්‍රශ්නයේ (ආ) කොටස ඡේදයක් හෝ ඡේද කිහිපයක් සාරාංශකරණය කිරීමේ කුසලතාව මැන බැලෙන ප්‍රශ්නයකි. මෙම කොටසේ සමස්ත පහසුතාව 76.66%කි. එය මධ්‍යස්ථ අගයක් ගනියි. මෙම ප්‍රශ්නයට ලකුණු ලබා දීම අනුකොටස් 3ක් යටතේ සිදු කර තිබේ. එනම්**,**

- සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට - ලකුණු 02
- අක්ෂර වින්‍යාසයට - ලකුණු 03
- අන්තර්ගතයට - ලකුණු 08

ලෙසිනි.

(ආ) කොටසේ සාරාංශකරණයේ පළමු කොටස සඳහා පහසුතාව 81%කි. ඒ අනුව සාරාංශ කිරීමේ මූලධර්ම පිළිබඳ මනා අවබෝධයක් බොහෝ අපේක්ෂකයන් තුළ පවතින බව කිය හැකිය. එහෙත් අක්ෂර වින්‍යාස පහසුතාව 64%ක් සහ අන්තර්ගතය දැක්වීමේ පහසුතාව 58%ක් වීමෙන් පැහැදිලි වන්නේ අපේක්ෂකයා සතු ව අක්ෂර වින්‍යාසය සම්බන්ධව හා අන්තර්ගතය දැක්වීම පිළිබඳ ව අවබෝධය අඩු බවයි. අක්ෂර වින්‍යාසට අදාළ ලකුණු 3 ලබා ගැනීමේ දී අපේක්ෂා කළ නිවැරදි වචන ලිවීම විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීමේ හා නිවැරදි පද බෙදීම පිළිබඳ අවබෝධය දුර්වල මට්ටමක පැවතීම බොහෝ අපේක්ෂකයන්ට අපහසු වී ඇත. ඡේදයක් හෝ ඡේද කිහිපයක් කියවා එහි සමස්ත අර්ථය පහසුවෙන් හඳුනා ගැනීමට බොහෝ අපේක්ෂකයා අපොහොසත් වීම මෙයට හේතුවක් විය හැකිය.

පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සාරාංශ කිරීම පිළිබඳ ලබාදෙන අභ්‍යාස වැඩි කිරීම වඩාත් යෝග්‍ය යැයි යෝජනා කළ හැකි ය. මෙහිදී ද ශිෂ්‍යයාට වඩාත් පහසුවෙන් අවබෝධ කර ගත හැකි ඡේද මුල් පියවරේ දී සාරාංශ කිරීමට ලබා දීම යෝග්‍යය. සිසුන් වඩාත් ප්‍රිය කරන ගීතයක (කවියක) සාරාංශය වචන කිහිපයකින් ලිවීමට ලබා දීම ආදි ක්‍රම ද මුල් පියවරේ දී අනු මනය කළහැකිය. අනතුරු ව සංකීර්ණ ඡේද ලබා දී සාරාංශයට යොමු කරන අභ්‍යාස සිදු කිරීම වඩාත් ප්‍රයෝජනවත් ය. සාරාංශයේ දී නිවැරදි පද බෙදීමේ වැදගත්කමත් විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කිරීමේ වැදගත්කමක් වචනවල අක්ෂර නිවැරදිව ලිවීමේ වැදගත්කමත් පන්ති කාමරයේ දී මැනවින් සිසුන්ට අවබෝධ කර දීම ශිෂ්‍යයා ලියූ සාරාංශයේ ඌනතා පෙන්වා දීම සිදුකළ හැකි ය. මෙහි දී ලකුණු ලබා දීමේ පටිපාටියේ එන සාරාංශයට ලකුණු ලබා දෙන ක්‍රමවේදයට අනුව ම (ඉහත සඳහන් කර ඇති) ලකුණු ලබා දී සාරාංශකරණයේ දුර්වලතා මගහරවාලීම සුදුසු බව තවදුරටත් යෝජනා කළ හැකි ය.

### 3.6.3 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ ඉගැන්වීමේ ක්‍රියාවලියට විද්‍යුත් මාර්ගගත (online) ක්‍රමය හඳුන්වා දීම

(ii) වසංගත රෝග ව්‍යාප්තිය මගින් ගෝලීය ආර්ථිකයෙහි පැවැත්ම කෙරෙහි සිදු කෙරෙන බලපෑම

(iii) ආනයනය කළ ආහාර ද්‍රව්‍ය මත පමණක් යැපීමේ දී රටකට මුහුණ පෑමට සිදු වන අභියෝග

(iv) නවීකරණය හමුවේ අභියෝගයට ලක් වන ශ්‍රී ලාංකේය චාරිත්‍ර - වාරිත්‍ර

(v) විද්‍යා හා තාක්ෂණික ඥානය කෙරෙහි අසීමාන්තික ව යොමු වීම නිසා පසුබෑමකට ලක් වන මෙරට සාහිත්‍ය කලා

(ලකුණු 25 යි.)

**වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.**

i. **රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය**

ii. **එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම**

iii. **කරුණුවල පැහැදිලි බව**

iv. **නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම**

v. **ව්‍යාකරණ දෝෂ රහිත වීම**

vi. **භාෂාව ව්‍යක්ත ලෙස හැසිර වීම**

vii. **සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම**

viii. **කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම**

- **විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)**

**වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.**

(ලකුණු 25 යි)

### 3.6.4 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.8**

**ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයින්ගේ ලකුණුවල ව්‍යාප්තිය**




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25 ක් හිමි වේ.
ඉන්,

ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 02%ක් ද
ලකුණු 07 – 12 ප්‍රාන්තරයේ 11%ක් ද
ලකුණු 13 – 18 ප්‍රාන්තරයේ 69%ක් ද
ලකුණු 19 – 25 ප්‍රාන්තරයේ 18%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 19 හෝ 19ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 18%ක් වන අතර 13%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 12ට හෝ ඊට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

**ප්‍රස්තාරය 3.9**

**ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශක**




මූලාශ්‍රය : RD/16/ 4/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි, දෙ

3 ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයක් වුව ද පිළිතුරු සපයා ඇත්තේ 92%කි. එහි සමස්ත පහසුතාව 20%කි. දී ඇති රචනා මාතෘකා පහෙන් එකක් තෝරා ගෙන රචනාවක් ලිවිය යුතු ව තිබුණු අතර ඉන් වැඩිම පහසුතාවක් ඇත්තේ (ii) වන රචනා මාතෘකාවේ දී ය. එය 46%කි. අනෙක් රචනා මාතෘකා හතරට 22%ට අඩු පහසුතාවක් ඇත.

මෙහි අඩු ම පහසුතාව (v) මාතෘකාවෙහි ය. එය 6%කි. (i) (iii) (iv) යන රචනා මාතෘකාවන්හි පහසුතාව පිළිවෙළින් 22%, 11%, 16%ක් වේ. 2019 වර්ෂයේ කොවිඩ් වසංගත රෝග තත්ත්වය සමාජයෙහි පැවතීම නිසා ඊට අදාළ වූ 'වසංගත රෝග ව්‍යාප්තිය මඟින් ගෝලීය ආර්ථිකයෙහි පැවැත්ම කෙරෙහි සිදු කෙරෙන බලපෑම' යන (ii) මාතෘකාව තෝරා ගැනීමට අපේක්ෂකයන් වැඩි නැඹුරුවක් දක්වා ඇති බව සිතිය හැකිය. 6%ක් වු අඩු ම පහසුතාව V රචනා මාතෘකාව වන 'විද්‍යා හා තාක්ෂණික ඥානය කෙරෙහි අසීමාන්තික ව යොමු වීම නිසා පසුබෑමකට ලක්වන මෙරට සාහිත්‍ය කලා' යන මාතෘකාව සඳහා වේ. මේ අනුව වත්මන් තරුණ පරම්පරාව තුළ මෙරට සාහිත්‍ය කලා පිළිබඳ දැනුම අවම මට්ටමක පවතින බව කිව හැකිය.

(i) (iii) (iv) රචනා මාතෘකා සැලකීමේ දී රටේ සමාජ ආර්ථික සංවර්ධන අවස්ථා පිළිබඳව හා ගැටලු නිරාකරණයට දායක වීම සම්බන්ධයෙන් අපේක්ෂකයන් තුළ එතරම් අවබෝධය නොමැති වීම එවැනි මාතෘකා තෝරා ගැනීමට වැඩි නැඹුරුවක් නොමැති වීමට හේතු විය හැකිය. ඊට තවත් හේතුවක් ලෙස අපේක්ෂකයන් පොත්පත් කියවීමටත් නව දැනුම හා තොරතුරු සොයා යාමටත් වැඩි රුචිකත්වයක් නො දැක්වීමත් බලපාන්නට ඇතැයි සිතිය හැකි ය.

එබැවින් පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කළ හැකිය.

ප්‍රශ්න පත්‍රයේ ලකුණු 25ක් ලැබෙන විශ්ලේෂණාත්මක රචනා ලිවීම පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

පන්ති කාමරයේ දී ශිෂ්‍යයාට රචනා මාතෘකාව ලබා දී ලිවීමට යොමු කිරීමට අමතර ව රචනාව පිළිබඳ තොරතුරු විමර්ශනාත්මක ව සාකච්ඡා කිරීම වැදගත් වේ.

ප්‍රවෘත්ති පත්‍ර කියවීමටත් විද්‍යුත් මාධ්‍ය ප්‍රවෘත්තිවලට සවන් දීමටත් ශිෂ්‍යයන් යොමු කිරීම පමණක් ප්‍රමාණවත් නො වන අතර එය නියාමනය කිරීමට ද වැඩ පිළිවෙළක් සකස් කරගත යුතු ය.

ශාස්ත්‍රීය ලේඛන ඇතුළු විවිධ ලේඛන පරිශීලනය සඳහා සිසුන්ට මඟ පෙන්වීම ද කාලෝචිත වේ.

### 3.6.5 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) කාශ්‍යප රජතුමා කලාකාමියකු විය.

(ii) පරහිතකාමී මනුෂ්‍යයෝ දෙවිවරු මෙන් ලෝකය දීප්තිමත් කරති.

(iii) උකුස්සා විසින් හාවකු හා මීයෙක් අල්ලා ගන්නා ලදහ.

(iv) සෞඛ්‍ය සේවකයා රෝගීහු රෝහලට ඇතුළත් කිරීමට කඩිනම් පියවර ගත්තේ ය.

(v) ශිෂ්‍ය නායකයා ද වැඩි ම ලකුණු ලැබූ ශිෂ්‍යයා ද උදෑසන රැස්වීමේ දී අදහස් දැක්වූහ.

i. කාශ්‍යප රජතුමා කලාකාමියෙක් විය.

ii. පරහිතකාමී මනුෂ්‍යයෝ දෙවිවරුන් මෙන් ලෝකය දීප්තිමත් කරති.

iii. උකුස්සා විසින් හාවෙක් හා මීයෙක් අල්ලා ගන්නා ලදහ.

iv. සෞඛ්‍ය සේවකයා රෝගීන් රෝහලට ඇතුළත් කිරීමට කඩිනම් පියවර ගත්තේ ය.

v. වාක්‍යය නිවැරදි ය.

(ලකුණු 01 x 5 = 05 යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ඇමතිතුමා නව ලේකම්වරියක පත් කරයි.

(ii) අභිගුණ්ඨිකයා නයින් දෙදෙනෙකු අල්ලා ගනී.

(iii) ශාලාධිපතිවරයා විභාග නීති උල්ලංඝනය කළ සිසුවකු ශාලාවෙන් ඉවත් කෙළේ ය.

(iv) සිරි රහල් හිමියෝ කාව්‍යශේඛරය රචනා කළහ.

(v) නිලධාරීහු ආරක්ෂක භටයන් ලවා මඟ යනෙන මිනිසුන් හා වාහන පරීක්ෂා කරවති.

i. ඇමතිතුමා විසින් නව ලේකම්වරියක් පත් කෙරෙයි/ කරනු ලබයි/ ලැබෙයි.

ii. අභිගුණ්ඨිකයා විසින් නයි දෙන්නෙක් අල්ලා ගැනෙති/ ගැනෙත්, ගනු ලබති/ ලැබෙති/ ලබත්/ ලැබෙත්.

iii.. ශාලාධිපතිවරයා විසින් නීතී උල්ලංඝනය කළ සිසුවෙක් ශාලාවෙන් ඉවත් කෙරුණේය/ කෙරිණි/ කරනු ලැබිණ/ ලැබිණි/ ලැබුණේය/ ලැබීය/ ලැබුවේය/ කරන ලද්දේය/ කරනා ලද්දේය/ කරන ලදි/ කරනා ලදි.

iv. සිරි රහල් හිමියන් විසින් කාව්‍යශේඛරය රචනා කෙරිණ/ කෙරිණි/ කෙරුණේය/ කරනු ලැබිණ/ ලැබිණි/ ලැබුණේය/ ලැබීය/ ලැබුවේය/ කරන ලද්දේය/ කරනා ලද්දේය/ කරන ලදී/ කරනා ලදී.

v. නිලධාරීන් විසින් ආරක්ෂක භටයන් ලවා මඟ යනෙන මිනිස්සු හා වාහන පරීක්ෂා කෙරවෙති/ කෙරවෙත්/ කරවනු ලබති/ කරවනු ලැබෙති/ කරවනු ලබත්/ ලැබෙත්.

(ලකුණු 01 x 5 = 05 යි.)

(ඉ) ව්‍යාකරණානුකූල වාක්‍යයක් නිර්මාණය කිරීමට යෝග්‍ය පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (පරිසරවේදීහු/පරිසරවේදීන්) වන සංරක්ෂණය සඳහා (ශිෂ්‍යයෝ/ශිෂ්‍යයන්) යොමු කළහ.

(ii) ජනප්‍රිය (නිළියක්/නිළියක) රැස්වීම අමතතොත් (ඡන්දදායකයෝ/ඡන්දදායකයන්) සතුටු වනු ඇත.

(iii) (ශිෂ්‍ය නායකයන්/ශිෂ්‍ය නායකයෝ) විසින් (නවක සිසුහු/නවක සිසුන්) පිළිගනු ලැබූහ.

(iv) අම්මා හා තාත්තා සමඟ (මා/මම) ද උත්සවයට සහභාගි (වීමු/වීමි).

(v) (ව්‍යාපාරිකයන්/ව්‍යාපාරිකයෝ) පරිසරය විනාශ කරද්දී (දේශපාලකයෝ/දේශපාලකයන්) නිලධාරීන්ට තර්ජනය කරති.

(ලකුණු 05 × 3 =15 යි.)

(i) (පරිසරවේදීහු/පරිසරවේදීන්) වන සංරක්ෂණය සඳහා (ශිෂ්‍යයෝ/ශිෂ්‍යයන්) යොමු කළහ.

(ii) ජනප්‍රිය (නිළියක්/නිළියක) රැස්වීම අමතතොත් (ඡන්දදායකයෝ/ඡන්දදායකයන්) සතුටු වනු ඇත.

(iii) (ශිෂ්‍ය නායකයන්/ශිෂ්‍ය නායකයෝ) විසින් (නවක සිසුහු/නවක සිසුන්) පිළිගනු ලැබූහ.

(iv) අම්මා හා තාත්තා සමඟ (මා/මම) ද උත්සවයට සහභාගි (වීමු/වීමි).

(v) (ව්‍යාපාරිකයන්/ව්‍යාපාරිකයෝ) පරිසරය විනාශ කරද්දී (දේශපාලකයෝ/දේශපාලකයන්) නිලධාරීන්ට තර්ජනය කරති.

i. පරිසරවේදීහු - ශිෂ්‍යයන්
ii. නිළියක - ඡන්දදායකයන්
iii. ශිෂ්‍ය නායකයන් - නවක සිසුහු
iv. මම - වීමි
v. ව්‍යාපාරිකයන් - දේශපාලකයෝ

(ලකුණු 01 x 5 = 05 යි.)

### 3.6.6 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය

ප්‍රස්තාරය 3.10

ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයින්ගේ ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන් ,

ලකුණු 00 – 03 ප්‍රාන්තරයේ 17% ක් ද
ලකුණු 04 – 07 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 08 – 11 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 12 – 15 ප්‍රාන්තරයේ 17%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11 හෝ ලකුණු 11ට වඩා ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 17%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 50%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 7ට හෝ 7ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

ප්‍රස්තාරය 3.11

ප්‍රශ්න අංක 4 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/ 4/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

4 ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 53%ක් වන අතර මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 51%කි. මෙම ප්‍රශ්නය කොටස් තුනකින් ද, අනුකොටස් පහළොවකින් ද යුක්ත වේ. එයින් පහසුතාව 59%කට වැඩි අනුකොටස් 5කි. ඉතිරි අනුකොටස්වල පහසුතාව 0- 59% අතර පවතියි.

4 ප්‍රශ්නයේ (i) කොටසෙන් වාක්‍ය 5ක් ඉදිරිපත් කර ඇති අතර ඒවායේ සදොස් තැන් තිබේ නම් නිදොස් කිරීම අපේක්ෂා කර ඇත. පළමුවන කොටස තුළ ඇති වාක්‍ය නිදොස් කිරීමේ දී ඇතැම් වාක්‍ය රීති කෙරෙහි අපේක්ෂකයන්ගේ අවබෝධය අඩු බව පෙනෙයි. වාක්‍ය රීති පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම සඳහා පුළුල් අභිප්‍රේරණයක් සිසුන් තුළ ඇති කළ යුතු වේ.

4 ප්‍රශ්නයේ (අ) කොටස මගින් දී ඇති වාක්‍ය පහ කර්ම කාරකයට හැරවීම සිදුකළ යුතු කර්ම කාරක වාක්‍ය සාධනය වඩාත් පුළුල් ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සාකච්ඡාවට බඳුන් කිරීම වඩාත් යෝග්‍ය බව පෙනෙයි.

4 ප්‍රශ්නයේ (ඉ) කොටස මගින් නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදයක් තෝරා ගැනීම කළ යුතු වේ. එම කොටස්වල පහසුතා අගයන් 40% ඉක්මවා ඇත.

මෙම ප්‍රශ්නයට අදාළ ව ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගැනීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කළ හැකිය.

වාක්‍ය රීති පිළිබඳ ව සාධන මට්ටම ඉහළ නැංවීමට ඒ ඒ රීතිය පිළිබඳ වෙන වෙන ම අවධානය යොමු කිරීම හා ප්‍රතිපෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම,

කර්මකාරක වාක්‍ය සාධනය පිළිබඳ අඛණ්ඩ අවධානය යොමු කිරීම, ප්‍රතිපෝෂණ හා ඇගයීම් ක්‍රියාවලි පුළුල් කිරීම

වාක්‍යයක නිවැරදි කිරීමට සුදුසු පද තෝරාගැනීමේ දී වාක්‍ය රීති පිළිබඳ ව අඛණ්ඩ ඇගයීම් සහිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් භාවිත කිරීම,

ව්‍යාකරණ හා සම්බන්ධ ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි පරිශීලනයට සිසුන් යොමු කරවීම මගින් ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමට කටයුතු කළ හැකිය.

## 3.6.7. ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු-අංගය** දක්වන්න.

(i) **කීර්තිමත් ප්‍රදේශාධිපතියෝ ගුණදහමින්** ආඪ්‍ය ව සිටිති.
(**කීර්තිමත්** - තද්ධිත, **ප්‍රදේශාධිපති** - සන්ධි, **ගුණදහම්** - සමාස)

(ii) **තුරුවදුලෙහි සුපිපි වනමල්** එහි ම මිලින ව යයි.
(**තුරුවදුලෙහි** - විභක්ති, **සුපිපි** - උපසර්ග, **වනමල්** - සමාස)

(iii) **විනිසකරු** අංක 70 **දරන** නඩුව **නිෂ්ප්‍රභ** කරයි.
(**විනිසකරු** - සමාස, **දරන** - කෘදන්ත, **නිෂ්ප්‍රභ** - උපසර්ග)

(iv) රූබර ලලනාවෝ **මිණිබරණ ද රනබරණ** ද අභිරුචියෙන් පලඳිති.
(**මිණිබරණ** - සන්ධි, **ද** - නිපාත, **රනබරණ** - සන්ධි)

(v) **අකෘතඥයෝ පාපතර** ක්‍රියාවන්හි **ම** නිරත වෙති.
(**අකෘතඥයෝ** - විභක්ති, **පාපතර** - තද්ධිත, **ම** - නිපාත) (ලකුණු 03 × 5 =15 යි.)

| වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
| --- | --- | --- |
| i කීර්තිමත් | තද්ධිත | අස්ත්‍යර්ථය/ ඇත යන අර්ථය |
| ප්‍රදේශාධිපති | සන්ධි | සමාන ස්වර දීර්ඝ/ සවර්ණ ස්වර දීර්ඝ/ ස්වර දීර්ඝ/ දීර්ඝ ස්වරාදේශ |
| ගුණදහම් | සමාස | ද්වන්ද්ව සමාස/ ද අරුත් සමස් |
| ii තුරුවදුලෙහි | විභක්ති | ආධාර විභක්ති/ අදර විබත් |
| සුපිපි | උපසර්ග | වඩා යන අර්ථය / අධික යන අර්ථය / අර්ථෝද්දීපනය කිරීම් අර්ථය / භූෂණාර්ථය |
| වනමල් | සමාස | විභක්ති සමාස/ විබත් සමස්/ ආධාර විභක්ති සමාස/ අදර විබත් සමස් |
| iii විනිසකරු | සමාස | විභක්ති සමාස/ විබත් සමස්/ කර්ම විභක්ති සමාස/ කම් විබත් සමස් |
| දරන | කෘදන්ත | වර්තමාන කෘදන්ත/ කර්තෘකාරක වර්තමාන කෘදන්ත |
| නිෂ්ප්‍රභ | උපසර්ග | දූෂ්‍යාර්ථය/ කුත්සිතාර්ථය/ නින්දිත අර්ථය |
| iv මිණිබරණ | සන්ධි | පරස්වර ලෝප සන්ධිය/ පර සර ලොප් සඳ |
| ද | නිපාත | සමුච්චයාර්ථ |
| රණබරණ | සන්ධි | ස්වර සන්ධිය/ සර සඳ/ ආරෝහණ සන්ධිය |
| v අකෘතඥයෝ | විභක්ති | ප්‍රථමා විභක්තිය / පෙර විබත් |
| පාපතර | තද්ධිත | අධික යන අර්ථයේ/ වඩා යන අර්ථයේ/ (තුලනාර්ථයේ) |
| ම | නිපාත | අවධාරණාර්ථයේ |

(ලකුණු (01 x 3) x 5 = 15 යි.)

### 3.6.8 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය

ප්‍රස්තාරය 3.12

ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයින්ගේ ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය 18%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ. ඉන්,

ලකුණු 00 – 03 ප්‍රාන්තරයේ 07% ක් ද
ලකුණු 04 – 07 ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 08 – 11 ප්‍රාන්තරයේ 43%ක් ද
ලකුණු 12 – 15 ප්‍රාන්තරයේ 22%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11 ට වඩා ලබා ගත් පිරිස 22%කි. 35%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

ප්‍රස්තාරය 3.13

ප්‍රශ්න අංක 5 සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/ 4/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

5 ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය 18%කි. එහි පහසුතාව 53%කි. 5 ප්‍රශ්නයේ කොටස් 5කි. එම කොටස් අතුරෙන් 58% වැඩිම පහසුතා අගය (ii) කොටස සඳහා ද, 47%, අඩුම පහසුතා අගය (iii) කොටස සඳහා ද වේ. (i), (iv), (v) කොටස් සඳහා පහසුතා අගයන් පිළිවෙළින් 50%, 57% හා 51% වේ.

සමස්තයත් ලෙස මේ පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය මධ්‍යස්ථ අගයක රැඳී තිබෙන බව මින් පැහැදිලි වේ. ප්‍රශ්නය සකස් කර ඇත්තේ මූලික ව්‍යාකරණ අංග වන සන්ධි, සමාස, විභක්ති, අව්‍යය පද, ප්‍රත්‍යයාර්ථනාම, සර්වනාම හා ක්‍රියා යන පද ආශ්‍රය කරගෙන යි. ඒ ඒ ව්‍යාකරණ අංග මැනවින් අධ්‍යයනය කිරීම ද එහි අනු අංග පිළිබඳ විශ්ලේෂණයන් මත අධ්‍යයනය ද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිදුවිය යුතු බව පෙනේ, ව්‍යාකරණ පිළිබඳ ව දුරවබෝධතා අවම කර ගැනීමට ගුරු සිසු දෙපක්ෂයේ සාමූහික කැපවීමකින් මෙහි පහසුතාව වර්ධනය කරගත හැකි වේ.

තවදුරටත් පන්ති කාමර ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගනිමින්, පාඩම් සැලසුම්කරණය කර ගැනීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කළ හැකිය.

ව්‍යාකරණ අනු අංග වෙන් වෙන් ව නිරවුල් ලෙස ශිෂ්‍යයාට උකහා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම් ලබා දීම,

ඒ ඒ අනු අංග ආශ්‍රිත ව ඇගයීම් ක්‍රියාවලිය පුළුල් කිරීම හා ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

ප්‍රශ්නය තෝරා ගැනීමට ශිෂ්‍ය අභිප්‍රේරණය උදෙසා යෝග්‍ය සැලසුමක් සකස් කොට ක්‍රියාත්මක කිරීම, මගින් මේ සම්බන්ධ ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවිය හැකිය.

### 3.6.9 ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර

**6.** (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට අර්ථානුකූල ව වඩාත් ම ගැළපෙන වචනය වරහනින් තෝරා ලියන්න.

(i) ...................... කියවිය හැකි සන්දේශ සිංහල සන්දේශාවලියෙහි සුලබ නො වේ.

(ii) නකත් බලවන, පෙරනිමිති සලකන මිනිසුන් ...................... පාත්‍ර කරන කථා වස්තු ජාතක පොතෙහි හිඟ නො වේ.

(iii) මිනිසාගේ චින්තනයට භාෂාව කෙතෙක් දුරට උපකාරී වේ ද යන්න ...................... ප්‍රශ්නයකි.

(iv) ලක්වැසි ජනතාව තුළ තමන් සිංහලයන් ය යන හැඟීම ක්‍රියාත්මක වූයේ කවර කලෙක පටන් ද යන්න මෑතක සිට ඇතැම් උගතුන් අතර ...................... ප්‍රශ්නයක් බවට පත් වී තිබේ.

(v) ශෛලිය හා වාග්විලාසය සකස් වීම කෙරෙහි ලේඛනයේ ...................... ද බල පාන බවට මෙය සාධකයකි.

(vi) සමකාලීන භාෂණ ව්‍යවහාරය ලේඛන කාර්යය සඳහා යොදා ගැනීමේ ...................... ඇල්බට් ද සිල්වා මිදුණු බව පෙනේ.

(විවාදාත්මක, නවතායෙන්, මනෝවිද්‍යාත්මක, වස්තු විෂයය, සම්ප්‍රදායයෙන්, පරිහාසයට)

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(අ)

i. නවතායෙන්
ii. පරිහාසයට
iii. මනෝවිද්‍යාත්මක
iv. විවාදාත්මක
v. වස්තු විෂයය
vi. සම්ප්‍රදායයෙන්

(ලකුණු ½ x 6 = 03 යි.)

(ආ) පහත සඳහන් වාක්‍යය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

පරාක්‍රමබාහු මුළු දිවයිනට ම අදිපති වී අබිසේක ලැබුවට පස්සේ පොලොන්නරුවේ තැනවූ මාලිගාව පඬුවස් නුවර මාලිගාවට සමාන නමුත් මහතින් ඊට ලොකු යි.

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

පරාක්‍රමබාහු මුළු දිවයිනට ම අධිපති වී අභිෂේක ලැබීමෙන් පසු පොළොන්නරුවේ තැනවූ මාලිගාව පඬුවස් නුවර මාලිගාවට සමාන නමුත් ප්‍රමාණයෙන් (පළලින්) ඊට විශාල ය.

(ලකුණු ½ x 6 = 03 යි.)

(ඉ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) බල්ලා **බළලා** එළවා දමයි. (iv) කුරුල්ලෙක් **ගසෙහි** වසයි.

(ii) **බළලා** මීයා මරයි. (v) ළමයා **ගසට** වතුර දමයි.

(iii) **ගසෙහි** අත්තක් කඩා වැටේ. (vi) ළමයා **අතින්** පොත බිමට වැටෙයි.

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

i. බළලා :- කර්ම විභක්තිය / කම් විබත්

ii. බළලා :- ප්‍රථමා විභක්තිය / පෙර විබත්

iii. ගසෙහි :- සම්බන්ධ විභක්තිය / සබඳ විබත්

iv. ගසෙහි :- ආධාර විභක්තිය / අදර විබත්

v. ගසට :- සම්ප්‍රදාන විභක්තිය / සපදන් විබත්

vi. අතින් :- අවධි විභක්තිය / අවදි විබත්

(ලකුණු ½ x 6 = 03 යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.
එහෙත් භාෂණය කරන්නේ සමාජය සමස්තයක් වශයෙන් නො වේ භාෂක සමාජයේ සාමාජිකයන් එනම් පුද්ගලයන් වශයෙනි එසේ නම් එය පෞද්ගලික වූවකැයි නො කිව යුතු ද

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඊ) එහෙත් භාෂණය කරන්නේ සමාජය සමස්තයක් වශයෙන් නො වේ. භාෂක සමාජයේ සමාජිකයන් එනම්, පුද්ගලයන් වශයෙනි. එසේ නම්, එය පෞද්ගලික වූවකැ'යි නො කිව යුතු ද?

(ලකුණු ½ x 6 = 03 යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) රාජ පුරුෂයන්ගේ බස් ඇසූ රජ "පුරෝහිතයා කෙසේ මරම් ද"යි කී ය.

(ii) "යන්නට එපා, අත්ත කඩා ගෙන වැටෙයි" යනුවෙන් යාළුවෝ කීහ.

(iii) "යුෂ්මතාගේ නිර්දෝෂීභාවයට යමක් ඇත්නම් කියන්න" යි විනිශ්චයකාරවරයා පැවසී ය.

(ලකුණු 01 × 3 = 03 යි.)

(උ)

i. රාජ පුරුෂයන්ගේ බස් ඇසූ රජ පුරෝහිතයා මරන ආකාරය/ ඇයුරු ගැන ඇසී ය/ විමසී ය

ii. • නොයන ලෙසත් අත්ත කඩා වැටිය හැකි බවත් යහළුවෝ කීහ.
• අත්ත කඩා වැටිය හැකි බැවින් නොයන ලෙස යහළුවෝ කීහ

iii. ඔහුගේ නිර්දෝෂීභාවයට යමක් ඇතිනම් කියන ලෙස විනිශ්චයකාරවරයා පැවසීය.

(ලකුණු 01 x 03 = 03 යි.)

### 3.6.10 ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය

ප්‍රස්තාරය 3.14

ප්‍රශ්න අංක 6 සඳහා අපේක්ෂකයින්ගේ ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන්,

ලකුණු 00 – 03 ප්‍රාන්තරයේ 09% ක් ද
ලකුණු 04 – 07 ප්‍රාන්තරයේ 47%ක් ද
ලකුණු 08 – 11 ප්‍රාන්තරයේ 39%ක් ද
ලකුණු 12 – 15 ප්‍රාන්තරයේ 05%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 12 හෝ 12ට වඩා ලබා ගත් අපේක්ෂකයන් 5%කි. අපේක්ෂකයන්ගෙන් 56%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 7 හෝ 7ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

**ප්‍රස්තාරය 3.15**

**ප්‍රශ්න අංක 6 සඳහා පහසුතා දර්ශක**




මූලාශ්‍රය : RD/16/ 4/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

අපේක්ෂකයන්ගෙන් 42% මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇත. එහි පහසුතාව 35% කි. 6 ප්‍රශ්නය කොටස් 5කින් යුක්ත ය.

6 ප්‍රශ්නයේ වැඩි ම පහසුතාවක් සහිත අනුකොටස (අ) (iii) අනුකොටසයි. එහි පහසුතාව 81%කි. අඩුම පහසුතාව සහිත අනුකොටස් වන්නේ උ(i), උ(ii) අනුකොටසයි. එම කොටස්වල පහසුතාව 2%ක් වේ.

විවිධ භාෂා කුසලතා මනිනු පිණිස සකසා ඇති 6 ප්‍රශ්නය බොහෝ පහසුවෙන් ලකුණු ලබා ගැනීමේ ශක්‍යතාව සහිත වූවකි. මෙහි (අ) කොටස දී ඇති වාක්‍ය පහක හිස්තැනට අර්ථානුකූල ව වඩාත් ම ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා ලිවීමකි.

එහිදී ආසන්න පදය ද සමස්ත වාක්‍යයේ අර්ථය ද, සැලකිල්ලට ගතයුතු වෙයි. ඇතැම්විට තත්සම-තද්භව රූප කෙරෙහි යම් අවබෝධයක් ද අපේක්ෂිත ය. නැවත නැවත මෙබඳු අභ්‍යාසවල යෙදීමෙන් ද පොතපත කියවීමෙන් ද මේ භාෂා කුසලතාව සංවර්ධනය කරගත යුතු වේ.

6 ප්‍රශ්නය (ආ) කොටසින් තරමක දිග වාක්‍යයක් ලේඛන ව්‍යවහාරයට ගොඩනැගීමක් අපේක්ෂා කර ඇත. එහි පහසුතාව 45%කි. උසස් පෙළ සිංහල විෂය නිර්දේශය හදාරන අපේක්ෂකයෙකු ලේඛන ව්‍යවහාරයෙන් වාක්‍යයක් නිවැරදි ව ගළපා ලිවීම අපේක්ෂා කිරීම කළ යුක්තක් ම ය. ඒ කෙරෙහි ගුරුභවතුන්ගේ මෙන් ම සිසුන්ගේ ද අවධානය යොමු විය යුතු බව හැඟේ. ප්‍රශ්නයේ (ඉ) කොටස විභක්ති පිළිබඳ ව්‍යාකරණමය අවබෝධය හඳුනා ගැනීමට යෙදූ කොටසකි. වාක්‍ය තුනක විභක්ති අවස්ථා හයක් හඳුනා ගැනීමට අපේක්ෂකයාට සිදු වේ. සමස්ත අනුකොටස් පහසුතාව 48%කි. ඒ අනුව විභක්ති පිළිබඳ පැහැදිලි අවබෝධයක් බොහෝ අපේක්ෂකයා තුළ නොමැති බව කිව හැකිය.

විශේෂයෙන් iii හා iv අනුකොටස්වල යෙදුණු "ගසෙහි " යන යෙදුම සහ v අනුකොටසේ යෙදුණු "ගසට" යන යෙදුම කුමන විභක්ති දැයි හඳුනා ගැනීමේ දුෂ්කරතාවට බොහෝ අපේක්ෂකයන් මුහුණ දී ඇති බව පෙනී යයි. ප්‍රශ්නයේ (ඊ) කොටස විරාම ලක්ෂණ පිළිබඳ සාධන මට්ටම විමසුමක් වන අතර දී ඇති වාක්‍යයට නිවැරදි ව විරාම ලක්ෂණ යෙදීම අපේක්ෂකයන්ගේ පහසුතාව 62%කි. ප්‍රශ්නයේ (උ) කොටස ප්‍රකෘති කථනයෙන් වාක්‍ය තුනක් විකෘති කථනයට හැරවීම පිළිබඳ ප්‍රශ්නයකි. පහසුතාව 3%කි.

මෙ ප්‍රශ්නයට අදාළ ශිෂ්‍ය සාධනය සංවර්ධනය කිරීම උදෙසා පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පහත සඳහන් යෝජනා ඉදිරිපත් කළ හැකිය.

වාක්‍යවල හිස්තැනට යෝග්‍ය වචන යෙදීම ගැන නිරන්තර අභ්‍යාස කරවීම.

ලේඛන ව්‍යවහාරය පිළිබඳ ව ශිෂ්‍යාවධානය වර්ධනය කරවීම.

විභක්ති පිළිබඳ පුළුල් අවධානයක් යොමු කොට, නව ඉගැන්වීම් ක්‍රම භාවිත කරමින් ශිෂ්‍යයා අභිප්‍රේරණය කර ගැනීම.

ප්‍රකෘති කථන හා විකෘති කථන පිළිබඳ ව අපේක්ෂකයන් දැනුවත් කිරීම හා නිරන්තර අභ්‍යාස සඳහා යොමු කිරීම, ඒ සඳහා ව්‍යාකරණාංග හා සම්බන්ධ විද්‍යුත් අධ්‍යාපන වැඩසටහන් උපයෝගී කර ගැනීම ආදිය මගින් ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම කටයුතු කළ හැකිය.

### 3.6.11 ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලක්දිව **ඓතිහාසිකත්වයෙන්** සැලකෙන **ආදිතම** ජනාවාස පිහිටුවූ යුගය වශයෙන් **උපකල්පිත වූ** කාලයෙහි සිට සියවස් දෙක හමාරක් පමණ වූ කාල පරිච්ඡේදයක් ඇතුළත, එනම් ක්‍රි. පූ. 3 සියවසේ දී මේ රටේ බුදු සසුන **සංස්ථාපිත** වූ තැන් පටන් චිරස්ථායී වන අයුරින් ලියැවුණු **පුරාලිපි** රැසක් ද අනුරාධපුර අවධියේ **ද්විතීය** භාගයට අයත් සීගිරි කුරුටු ගී ඇතුළු සාහිත්‍යමය ලේඛන හා ග්‍රන්ථ කීපයක් ද අප සතු ව තිබේ. මෙසේ සිංහල භාෂාවෙන් වාර්තාගත වී ඇති ආදිතම ලේඛන වන සිය ගණනක් පුරාලිපි හා ග්‍රන්ථ කීපය අතුරෙන් අඩු තරමින් භාෂා ඉතිහාසයේ යුග ලක්ෂණ නියෝජකත්වය අතින් වැදගත් සේ පෙනෙන ලිපි සෑහෙන ප්‍රමාණයක් වත් පරීක්ෂා කර බැලීමෙන්, වඩාත් හේතු යුක්ති ඇත්තේ ඉහත කී මතාන්තර අතුරෙහි කවර මතයකට ද යන්න මෙන් ම භාෂාවේ පරිණාමය සිදු වී ඇත්තේ කවර අයුරින් ද යන්නත් තමන්ට ම ප්‍රත්‍යක්ෂ ලෙස වටහා ගත හැකි වේ.

(i) **කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් පෙළ ගස්වා ලියන්න.

(ii) පිහිටුවූ, ඉතිහාසයේ, කුරුටු ගී යන වචනවල යෙදී ඇති පිලි හඳුන්වන්න.

(iii) මේ ඡේදයේ ඇතුළත් තද්ධිත පද **තුනක්** උපුටා දක්වන්න.

(iv) මේ ඡේදයේ ඇතුළත් ව්‍යංජන සංයුක්ත තුනක් සමග මූර්ධජ ඌෂ්මාක්ෂරයක් ඇතුළත් වචනයක් උපුටා දක්වන්න.

(v) ජනාවාස, වනාන්තර, වාර්තාගත යන වචන විසන්ධි කොට දක්වන්න.

(ලකුණු 03 × 5 =15 යි.)

i. • ආදිතම, උපකල්පිත වූ. ඓතිහාසිකත්වයෙන්, ද්විතීය පුරාලිපි, සංස්ථාපිත

ii. පිහිටුවූ - පි - කෙටි ඉස්පිල්ල    හි - කෙටි ඉස්පිල්ල
ටු - කෙටි පාපිල්ල    වූ - දීර්ඝ පාපිල්ල

ඉතිහාසයේ - ති - කෙටි ඉස්පිල්ල,    හා - ඇල පිල්ල
යේ - කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය/ හල් කිරීම

කුරුටු ගී - කු - කෙටි පාපිල්ල    රු - කෙටි පාපිල්ල
ටු - කෙටි පාපිල්ල    ගී - දීර්ඝ ඉස්පිල්ල

(ලකුණු 01 x 3 = 03 යි)

iii. 1. ඓතිහාසිකත්වයෙන්
2. ආදිතම
3. සාහිත්‍යමය
4. නියෝජකත්වය
5. ද්විතීය

(හමාරක්, පරිච්ඡේදයක්, රැසක්, කිහිපයක්, ගණනක්, ප්‍රමාණයක්)    (ලකුණු 01 x 3 = 03 යි

iv. ප්‍රත්‍යක්ෂ    (ලකුණු 03 යි

v. ජන + ආවාස
වන + අන්තර
වාර්තා + ආගත    (ලකුණු 01 x 3 = 03

(සියල්ල ලකුණු 03x 5 = 15

### 3.6.12 ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.16**

**ප්‍රශ්න අංක 7 සඳහා අපේක්ෂකයින්ගේ ලකුණුවල ව්‍යාප්තිය**




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන්,

ලකුණු 00 – 03 ප්‍රාන්තරයේ 09%ක් ද
ලකුණු 04 – 07 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 08 – 11 ප්‍රාන්තරයේ 39%ක් ද
ලකුණු 12 – 15 ප්‍රාන්තරයේ 19%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 12 හෝ 12ට වඩා ලබා ගත් අපේක්ෂක ප්‍රතිශතය 19%කි. අපේක්ෂකයන්ගෙන් 42%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 7ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

**ප්‍රස්තාරය 3.17**

**ප්‍රශ්න අංක 7 සඳහා පහසුතා දර්ශක**




මූලාශ්‍රය : RD/16/ 4/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

මෙම ප්‍රශ්නය කොටස් පහකින් සමන්විත වන අතර එක් කොටසකට ලකුණු 3 බැගින් මුළු ලකුණු 15ක් හිමි වන පරිදි සැකසුවකි. ඡේදයක් ලබා දී එම ඡේදය ඇසුරෙන් අපේක්ෂකයාගේ ව්‍යාකරණ දැනුම විමසන මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී භාෂාවේ අකාරාදි පිළිවෙළ, පිල්ලම් භාවිතය, තද්ධිත පද, අක්ෂර උත්පත්ති ස්ථාන, භාෂාවේ භාවිත සන්ධි පද ආදිය පිළිබඳ දැනුම හා අවබෝධය අපේක්ෂකයාට තිබිය යුතු ය. මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමට තෝරා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 63%ක් වූ අතර මෙම ප්‍රශ්නයේ පහසුතාව 56%කි.

වැඩි ම පහසුතාව (i) වන කොටසට වේ. එහි පහසුතාව 82%කි. අනෙකුත් කොටස්වල පහසුතාව පිළිවෙළින් (ii) කොටස 42% ද, (iii) කොටස 50% ද, (iv) කොටස 41% ද, (v) කොටස 62% ද වේ.

වැඩි ම පහසුතාව අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වීමේ කොටස (i) කොටසටය. අකාරාදි පිළිවෙළට ගොනු කිරීමට ලබා දුන් වචන හයේ මුල් අකුර දෙස පමණක් බලා පෙළ ගැස්වීමට හැකියාව පැවතීම එයට හේතු විය හැකිය. මේ සම්බන්ධ ශිෂ්‍ය සාධන මට්ටම වැඩි කර ගැනීමට පන්ති කාමරයේ දී නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම භාවිතයට යොමු වීම වඩාත් යෝග්‍ය විය හැකි ය. මෙහි දී වර්ණ මාලාව ප්‍රදර්ශනය කිරීම, මතකයෙන් ලිවීම, ශබ්දනගා උච්චාරණය කරවීම සහ කියවීම හා විභාග ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම යෝග්‍ය වේ. එසේ ම අකාරාදි පිළිවෙළට නාමාවලියක් පෙළ ගැස්වීමේ වටිනාකම සිසුන්ට අවබෝධ කරදීම හා ඒ සම්බන්ධ අභ්‍යාස නිරන්තරයෙන් කරවීමෙන් අපේක්ෂිත මට්ටමට ශිෂ්‍යයා ළඟා කරවීමට හැකියාව ලැබෙනු ඇත.

තද්ධිත පද උපුටා දක්වන (iii) කොටසෙහි පහසුතාව 50%කි. 'ආදිතම' 'සාහිත්‍යමය' යන පදවල යෙදී ඇති තද්ධිත ප්‍රත්‍යය අපේක්ෂකයාට පහසුවෙන් හඳුනා ගැනීමට හැකියාව ලැබී තිබුණත් 'ඓතිහාසිකත්වයෙන්', 'ද්විතීය', 'නියෝජකත්වය' යන පදවල තද්ධිත ප්‍රත්‍ය පහසුවෙන් හඳුනා ගැනීමට අපහසු වී ඇති බව දැකිය හැකිය. නාම ප්‍රකෘතියට තද්ධිත ප්‍රත්‍ය එකක් හෝ දෙකක් සමඟ විභක්ති ප්‍රත්‍ය යෙදී ඇති විට ඒවා වෙන් වෙන් වශයෙන් පහසුවෙන් හඳුනා ගැනීමට සමහර අපේක්ෂකයන්ට නො හැකි වීම මෙයට හේතුවක් වී ඇතැයි සිතිය හැකි ය. මෙවැනි පද වැඩිපුර ශිෂ්‍යයාට ලබා දී අභ්‍යාස කරවීමෙන් මේ තත්ත්වය මඟ හරවා ගත හැකි වනු ඇත.

ව්‍යංජන සංයුක්ත හා අක්ෂර උප්පත්ති ස්ථාන පිළිබඳ දැනුම මැන බැලෙන (IV) වන කොටස් පහසුතාව 41%කි. මේ පිළිබඳ ව ප්‍රමාණවත් අවබෝධයක් බොහෝ අපේක්ෂකයන් තුළ නොමැති බව පෙනෙයි. විශේෂයෙන් ම සංයුක්ත අක්ෂර හඳුනා ගැනීමට ශිෂ්‍යයා හුරුකරවීම සිදු කළ යුතු යි. මේ හා බැඳුණු අභ්‍යාස කරවිය යුතු මෙන් ම සංයුක්ත අක්ෂර දැක්වෙන ඉගෙනුම් ආධාරක පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීම ද, මෙහිදී ප්‍රතිඵලදායක වනු ඇත. අක්ෂර උත්පත්ති ස්ථාන පිළිබඳ අවබෝධය ලබා දීමට ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් අවස්ථාව ලබා දීම ද සුදුසු ය.

සන්ධි විසන්ධි කර දැක්වීමේ කුසලතාව මැන බැලෙන (v) කොටසෙහි පහසුතාව 62%කි. මෙහි දී විසන්ධි කිරීම සඳහා අපේක්ෂකයාට ලබා දී තිබෙන්නේ මිශ්‍ර සන්ධි (සමාන ස්වර දීර්ඝ) පද තුනකි. සිංහල භාෂාවේ භාවිත ප්‍රධාන සන්ධි (සිංහල සන්ධි) පිළිබඳ පන්ති කාමරයේ දී බහුලව අභ්‍යාස කළත්, මිශ්‍ර සන්ධි පිළිබඳ අභ්‍යාස කරවීම යම් මට්ටමක අඩුවක් පන්ති කාමර ඉගැන්වීම්වල දී හඳුනාගත හැකි ය. මිශ්‍ර සන්ධි (සංස්කෘත සන්ධි) පද පිළිබඳ ව ද සිසුන්ට අවබෝධයක් පන්ති කාමරයේ දී ලබා දිය යුතු ය. ඒ සඳහා අභ්‍යාස කරවීම ද පෘථුල කළ යුතු ය. එවිට ශිෂ්‍යයා අපේක්ෂිත මට්ටමට සමීප කරවීම පහසු වනු ඇත.

පිල්ලම් භාවිතය පිළිබඳ ශක්‍යතාව මැන බැලෙන (ii) කොටසේ පහසුතාව 42%කි. ඒ අනුව මේ පිළිබඳ බොහෝ අපේක්ෂකයන්ගේ දැනුම, ප්‍රමාණවත් මට්ටමක නොපැවතුණු බව කිව හැකිය. ස්වර වර්ණ ව්‍යංජන වර්ණ හා සංයෝග වීමේ දී ස්වර වෙනුවට යෙදෙන්නේ පිල්ලමක් බව ශිෂ්‍යයාට අවබෝධ කර දිය යුතු ය. ස්වර යෙදී නොමැති විට එම ව්‍යංජනයේ පිල්ලමක් ද නැති බව ශිෂ්‍යයා හඳුනා ගත යුතු ය. එසේ ම හ්‍රස්ව ස්වර හා දීර්ඝ ස්වර ව්‍යංජන හා සංයෝග වූ විට එම පිල්ලම් කෙටි - දීර්ඝ ලෙස හැඳින්වීමට සිසුන් හුරු කරවිය යුතු ය.

### 3.6.13 ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) නාම විශේෂණ
(ii) දකාරාර්ථ සමාසය
(iii) වත් හා මත් ප්‍රත්‍යය භාවිතය
(iv) ස්වරාදේශ සන්ධිය
(v) ප්‍රයෝජ්‍ය ක්‍රියාව

(ලකුණු 05 × 3 =15 යි.)

**(මෙහි හැඳින්වීමට ලකුණු 02 යි. උදාහරණවලට ලකුණු 03 යි.)**

**(i) නාම විශේෂණ :-**

● නාම පදයකට විස්තරයක් වශයෙන් යෙදෙන පදය නාම විශේෂණ නම් වේ.

● සිංහලයෙහි විශේෂණ විශේෂ්‍යයට පෙර හා අපරව ද යෙ දේ.

● විශේෂණ වශයෙන් නාම නාම. සර්ව නාම, කෘදන්ත නාම, තද්ධිත නාම, සංඛ්‍යා නාම ශබ්ද යෙදේ. නාමනාමවලින් විශේෂණ ලෙස යෙදෙන්නේ ජාති, ද්‍රව්‍ය, ගුණ හා සංඥා වශයෙන් පමණි. නාම නාම ශබ්ද.

ජාති නාම - රෝස මල
ද්‍රව්‍ය නාම - සෙල් පිළිම
ගුණ නාම - කළු ලෑල්ල
සංඥා නාම - සිදුහත් කුමරු

**සර්ව නාම - අප රට**
**කෘදන්ත නාම - හමන සුළඟ**
**තද්ධිත නාම - සිල්වත් තෙර**
**සංඛ්‍යා නාම - පස් පියුම්**

● **විශේෂණ හා විශේෂ්‍ය ගැළපීමේ ප්‍රභේද දෙකකි.**
එනම්,

01. තුල්‍යාධිකරණ
02. භින්නාධිකරණ වශයෙනි

01. තුල්‍යාධිකරණ යනු විශේෂ්‍යයෙහි එන ලිංග, විභක්ති, වචන යන ව්‍යාකරණ ලක්ෂණ විශේෂණයෙහි ද යෙදේ නම් එය තුල්‍යාධිකරණයයි.

උදා:- දුබල මිනිසා
දුබල ගැහැණිය
දුවන ළමයා

02. භින්නාධිකරණ යනු විශේෂ්‍යයෙහි එන ලිංග විභක්ති වචන යන ව්‍යාකරණ ලක්ෂණ විශේෂණයෙහි දක්නට නොලැබීමයි.

උදා :- රජ පිරිස
ලී වැඩ
මුහුදු දිය

- මීට අමතරව ප්‍රශ්නාර්ථ විශේෂණ ලෙස යෙදෙන නාම විශේෂණ ද වේ.

උදා:- කවර මිනිසෙක්
කොයි රට
කෙබඳු දෙයක්
කීවැනි වසර

(ii) දකරාර්ථ සමාසය :-

"ද" නිපාතයෙන් සම්බන්ධ කළ හැකි නාම පද කීපයක්, එම නිපාත පදය නැතිව සමාස භාවයට පත්වීම "ද" කාරාර්ථ සමාසයි.

| | | | |
|---|---|---|---|
| උදා:- | මවද පියාද | - | මවුපිය |
| | හිරු ද සඳුද | - | හිරිසඳු |
| | ගී ද නැටුම් ද | - | ගීනැටුම් |
| | වතු ද පිටි ද | - | වතුපිටි |

- ද කාරාර්ථ සමාසයෙදී වචන තුනක් ද නිපාතයෙන් සමාසවන අවස්ථා
  උදා: - වා ද පිත් ද සෙම් ද - වාපිත්සෙම්

- ද කාරාර්ථ සමාසයෙදී වචන හතරක් ද නිපාතයෙන් සමාසවන අවස්ථා
  උදා : - ඇස් ද ඉස් ද මස් ද ලේ ද - ඇස්ඉස්මස්ලේ

- විරුද්ධාර්ථ පද ද නිපාතයෙන් සමාසවන අවස්ථා
  උදා :- ඉර ද හඳ ද - ඉරහඳ

- සර්ව නාම පද ද නිපාතයෙන් සමාසවන අවස්ථා
  උදා : - ඒක ද මේක ද - ඒකමේක

- සංඛ්‍යාවාචී පද ද නිපාතයෙන් සමාසවන අවස්ථා
  උදා : - හය ද හතර ද - හයහතර

- සමානාර්ථ පද ද නිපාතයෙන් සමාසවන අවස්ථා
  උදා : - අරුම ද පුදුම ද - අරුමපුදුම

**(iii) වත් හා මත් ප්‍රත්‍යය භාවිතය :-**

නාමප්‍රකෘතියකට (නාම මූලයකට/ ශබ්ද ප්‍රකෘතියකට) පද සාධනය පිණිස ප්‍රත්‍යයක් යෙදීමෙන් සෑදෙන නාම තද්ධිත නමින් හැඳින්වේ. නාම ප්‍රකෘතිය ඉ, ඊ, උ, ඌ, ස්වරවලින් අන්ත වේ නම් ඇත්තේය යන අර්ථය දීම සඳහා මත් ප්‍රත්‍යය යෙදේ.

| | | | |
|---|---|---|---|
| 1. | සිරි + මත් | - | සිරිමත් |
| 2. | ඉසුරු + මත් | - | ඉසුරුමත් |
| 3. | බුද්ධි + මත් | - | බුද්ධිමත් |
| 4. | ධී + මත් | - | ධීමත් |
| 5. | රූ + මත් | - | රූමත් |
| 6. | දිරි + මත් | - | දිරිමත් |

නාම ප්‍රකෘතිය අග ඉ, ඊ, උ, ඌ, ස්වර හැර අ. ආ, යන ස්වරයක් හෝ හල් ව්‍යංජනයක් වේ නම් එයට පරව ඇත යන අර්ථය දීම සඳහා **වත්** ප්‍රත්‍යය යෙදේ.

| | | | |
|---|---|---|---|
| 1. | ආදර්ශ + වත් | - | ආදර්ශවත් |
| 2. | ගුණ + වත් | - | ගුණවත් |
| 3. | ප්‍රභා + වත් | - | ප්‍රභාවත් |
| 4. | පින් + වත් | - | පින්වත් |
| 5. | සිල් + වත් | - | සිල්වත් |

**(iv) ස්වරාදේශ සන්ධිය :-**

- සන්ධි වන පද දෙකෙන් මුල් පදයේ අග හා අග පදයේ මුල ඇති ස්වර දෙක වෙනුවට වෙනත් ස්වරයක් ආදේශ කිරීමෙන් ගළපනු ලබන සන්ධිය ස්වරාදේශ සන්ධිය (සරදෙස් සඳ) නම් වේ.

- මිශ්‍ර සිංහල සන්ධි යටතේ එන ගුණ හා වෘද්ධි සන්ධි ද ස්වරාදේශ සන්ධි ගණයට ගැනේ. මෙහි දී ස්වර ආදේශවන අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 1. | අ + ඉ = ඒ - උච්චාරණ + ඉන්ද්‍රිය | = | උච්චාරණේන්ද්‍රිය |
| 2. | අ + ඊ = ඒ - ධන + ඊශ්වර | = | ධනේශ්වර |
| 3. | ආ + ඉ = ඒ - මහා + ඉන්ද්‍ර | = | මහේන්ද්‍ර |
| 4. | ආ + ඊ = ඒ - මහා + ඊශ්වර | = | මහේශ්වර |

| | | | |
|---|---|---|---|
| 1. | අ + උ = ඕ - මාර්ග + උපකරණ | = | මාර්ගෝපකරණ |
| 2. | අ + ඌ = ඕ - වෘත්ත + ඌරු | = | වෘත්තෝරු |
| 3. | ආ + උ = ඕ - මහා + උත්සව | = | මහෝත්සව |
| 4. | ආ + ඌ = ඕ - රවිතා + ඌරු | = | රවිතෝරු |

1. අ + ඖ = ඖ - දන්ත + ඖෂ්ඨජ = දන්තෞෂ්ඨජ
2. අ + ඖ= ඖ - වන + ඖෂධ = වනෞෂධ
3. ආ + ඖ= ඖ - මහා + ඖෂධ = මහෞෂධ

1. අ + ඒ = ඓ - චිත්ත + ඒකාග්‍රතා = චිත්තෛකාග්‍රතා
2. අ + ඓ = ඓ - සකල + ඓශ්වර්ය = සකලෛශ්වර්ය
3. ආ + ඓ = ඓ - උමා + ඓශ්වර්ය = උමෛශ්වර්ය

**(v) ප්‍රයෝජ්‍ය ක්‍රියාව :-**

- අනුන් විසින් මෙහෙයවා කරනු ලබන ක්‍රියාව ප්‍රයෝජ්‍ය ක්‍රියාව නම් වේ. ක්‍රියා ධාතුවටත් ප්‍රත්‍යයටත් අතරට "ව" ප්‍රත්‍යය යෙදීමෙන් ප්‍රයෝජ්‍ය ක්‍රියාව සදා ගනු ලැබේ.

උදා: - නට + ව + යි - නටවයි
බල + ව + යි - බලවයි

- ප්‍රයෝජ්‍ය ක්‍රියා ශබ්දයක් බවට නැගුණු කල්හි අකර්මක ධාතු සකර්මක බවට පත්වේ.

උදා:- හඬවයි, දුවවයි. නටවයි
අක්කා මල්ලී හඬවයි
අහිකුණ්ටකයා නයා නටවයි

- ප්‍රයෝජ්‍ය ක්‍රියා ශබ්දයක් බවට නැගුණු සකර්ම ධාතු සමග කර්ම දෙකක් යෙදේ.

උදා:- පියා පුතා ලවා පොත් කියවයි
ගුරුතුමා ශිෂ්‍යා ලවා අකුරු ලියවයි

- ප්‍රයෝජ්‍ය ක්‍රියා සහිත වාක්‍යවල කර්තෘවරු දෙදෙනෙක් සිටිති
  i. ප්‍රයෝජක කර්තෘ
  ii. ප්‍රයෝජ්‍ය කර්තෘ වශයෙනි.

i. ප්‍රයෝජක කර්තෘ යනු මෙහෙය වන්නා ය.

උදා: - ගුරුවරයා ළමයා ලවා වැඩ කරවයි.

මෙහි ගුරුවරයා ප්‍රයෝජක කර්තෘ ය.

ii. ප්‍රයෝජ්‍ය කර්තෘ යනු මෙහෙය වීම ලබන්නා ය.

උදා: - ගුරුවරයා ළමයා ලවා වැඩ කරවයි.

මෙහි ළමයා යනු ප්‍රයෝජ්‍ය කර්තෘ ය.

- ප්‍රයෝජ්‍ය ක්‍රියාව බොහෝ ක්‍රියා විෂයයෙහි යෙදේ.

| | | |
|---|---|---|
| උදා: - | පූර්ව ක්‍රියාව | - කරවා, බලවා |
| | මිශ්‍ර ක්‍රියාව | - කරවමින්. බලවමින් |
| | අපර ක්‍රියාව | - කරවන්නට, බලවන්නට |
| | අසම්භාව්‍ය ක්‍රියාව | - කරවද්දී. බලවද්දී (කාලාර්ථ) |
| | | - කරවතොත්, බලවතොත් (අනියමාර්ථ) |
| | කර්ම කාරක ක්‍රියාව | - කැරවෙයි, බැලවෙයි. |
| | විධි ක්‍රියාව | - කරවව, බලවව |
| | ප්‍රාර්ථනා ක්‍රියාව | - කරවාවා, බලවාවා |

- ප්‍රයෝජ්‍ය ක්‍රියාව සහිත වාක්‍යවල ලවා නිපාතය යෙදීම විශේෂත්වයකි.

(ඕනෑම තුනකට ලකුණු 05 x 3 = 15 යි.)

### 3.6.14 ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.18**

**ප්‍රශ්න අංක 8 සඳහා අපේක්ෂකයින්ගේ ලකුණුවල ව්‍යාප්තිය**




මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.
ඉන්,

ලකුණු 00 – 03 ප්‍රාන්තරයේ 11%ක් ද
ලකුණු 04 – 07 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 08 – 11 ප්‍රාන්තරයේ 37%ක් ද
ලකුණු 12 – 15 ප්‍රාන්තරයේ 26%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 12 හෝ 12ට වඩා ලබා ගත් අපේක්ෂක ප්‍රතිශත 26%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 37%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 7ට හෝ 7ට අඩුවෙනි.

මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

**ප්‍රස්තාරය 3.19**

**ප්‍රශ්න අංක 8 සඳහා පහසුතා දර්ශක**




මූලාශ්‍රය : RD/16/ 3/AL පත්‍රිකාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2020, ශ්‍රී. ලං. වි, දෙ

8 ප්‍රශ්නයෙහි කොටස් අතුරෙන් 70% ක පහසුතාවක් පෙන්නුම් කරනුයේ (ii) වන කොටසට ය. (iii), (iv), (v) කොටස්වල පහසුතාව පිළිවෙළින් 41%, 51% හා 63%වේ. අඩු ම පහසුතාවක් පෙන්නුම් කරනුයේ (i) වන කොටසට ය. එහි පහසුතාව 39%කි. මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 53%කි. එය මධ්‍යස්ථ තත්ත්වයක් පෙන්නුම් කරන්නකි.

මෙම ප්‍රශ්නය කොටස් පහකින් සමන්විත වන අතර එයින් කොටස් 3කට කෙටි සටහන් ලිවිය යුතු ය. එක් නිවැරදි පිළිතුරකට ලකුණු 5 බැගින් මුළු ලකුණු 15ක් හිමි වන මෙම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 17%කි. එහි පහසුතාව 13%කි.

අදාළ ව්‍යාකරණ වර්ග පිළිබඳ ව පැහැදිලි ව නිර්වචනය කිරීම හා සුදුසු නිදසුන් ඉදිරිපත් කිරීම අපේක්ෂිත මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 00 - 07 ප්‍රාන්තරයේ සඳහා 37%ක් ද, 08 - 15 ප්‍රාන්තරයේ 63%ක අපේක්ෂක පිරිසක් ද වේ.

අඩු අපේක්ෂක සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබුණ ද, ලකුණු ලබා ගැනීම හා පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවතී.

මෙම ප්‍රශ්නය සඳහා සාර්ථක අන්දමින් පිළිතුරු සැපයීමට සඳහා සිසුන් ගේ අවධානය හා පෙළඹවීම වැඩි කර ගැනීම සඳහා පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් කළ යුතු වේ. මේ සඳහා ආදේශ කර ගන්නා මූලික ව්‍යාකරණ පාඩම්වල ව්‍යාකරණ වර්ග හා ප්‍රවර්ග කෙරෙහි අවධානය යොමු කරවීම, පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන ක්‍රියාපටිපාටිය පිළිබඳව දැනුවත් කිරීම සුදුසු අභ්‍යාසවල නිරත කරවීම හා පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කරවීම ද, වඩාත් ඵලදායී වේ යැයි යෝජනා කළ හැකිය.

# IV කොටස

## ඉගෙනුම් - ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

### ශිෂ්‍යයාගේ විෂයෙහි සාධනය ඉහළ නැංවීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ යෝජනා

### 1. මූලික කුසලතා ශක්තිමත් කිරීම.

පාඨ අවබෝධය, සාහිත්‍ය අවබෝධය වැනි මූලික කුසලතා මත වැඩි අවධානයක් යොමු කළ යුතු ය. එහිදී නිර්දිෂ්ට පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ ආශ්‍රිත ශාස්ත්‍රීය ලිපි පරිශීලනය සඳහා සිසුන් යොමු කිරීම සුදුසු ය. පුරාතන ගද්‍ය සාහිත්‍යයට අදාළ නිර්දිෂ්ට කතා වස්තුවල දුරවබෝධ වචනවල අරුත් පැහැදිලි කර ගැනීම සඳහා ශබ්දකෝෂ හා ගැටපද විවරණය පරිශීලනයට සිසුන් යොමු කිරීම උචිත ය. අවස්ථා සම්බන්ධය සඳහා සාර්ථක ව පිළිතුරු සැපයීම සඳහා නිර්දිෂ්ට සියලු කෘතීන් නිවැරදිව පරිශීලනය කිරීමත් හැකි සෑම අවස්ථාවක ම උද්ධෘත පාඨ මතකයේ තබා ගැනීම සඳහා නාට්‍යානුසාර ක්‍රියාකාරකම්වල යෙදවීමත් සිසුන් විචාරාත්මක සංවාද සඳහා යොමු කරවීමෙන් වඩාත් යෝග්‍ය වේ.

### 2. විශ්ලේෂණාත්මක චින්තනය දියුණු කිරීම හා සංකීර්ණ ප්‍රශ්න සඳහා සූදානම් කරවීම

සිසුන්ගේ විෂය විශ්ලේෂණාත්මක හා විවේචනාත්මක චින්තන කුසලතා වර්ධනය කිරීම සඳහා වැඩි අවස්ථාවක් සපයන දේශන, සාකච්ඡා, කේවල හා කණ්ඩායම් ක්‍රියාකාරකම්වල විවිධ වැඩසටහන් සඳහා යොමු වීමට ඉඩ ප්‍රස්තාර සැලසීමත් ,සාහිත්‍ය විචාරය තර්කානුකූල ව හා රසවින්දනාත්මක ව ලිවීමේකුසලතා පුහුණු කිරීමත් සඳහා නිරන්තර ඇගැයීම් ක්‍රමවේද ගුරුවරුන් විසින් සකස් කිරීම. එහි දී නිර්මාණාත්මකව ලිවීමේ අභ්‍යාස, සාහිත්‍ය කෘති විශ්ලේෂණය කිරීම, කාල කළමනාකරණය, ප්‍රශ්න තෝරා ගැනීමේ උපයාමාර්ග, ප්‍රශ්න පත්‍ර ව්‍යුහය අපේක්ෂකයින්ගේ අවධානයට ලක් කිරීම වැදගත් වේ. සිසුන්ගේ දක්ෂතා මට්ටම් විවිධ බැවින්, ඒකල ඉගැන්වීම් ක්‍රම ද භාවිත කිරීම වැදගත් වේ. මෙමඟින් එක් එක් සිසුවාගේ ප්‍රතිපෝෂණ අවශ්‍යතා සපුරාලීමට හැකිවනු ඇත.

### 3. පුහුණු විභාග හා ආදර්ශ ප්‍රශ්න

සිසුන් විභාග ආකෘතියට හුරුවීමට පෙර පුහුණු විභාග හා ආදර්ශ ප්‍රශ්න පත්‍ර භාවිත කළ යුතු ය.

### 4. තාක්ෂණය භාවිතය

ඉගෙනුම් ක්‍රියාවලියට තාක්ෂණය ඒකාබද්ධ කිරීම සඳහා අන්තර් ක්‍රියාකාරී භාෂා පාඨමාලා මාර්ගගත ඉගැන්වීම් ක්‍රම වැනි සිසුන්ට සිත් ගන්නා ඉගෙනුම් අවස්ථා සම්පාදනය කළ හැකි ය. මෙහි දී විවිධ කතුවරුන් පිළිබඳ නවකතා හා කෙටිකතා මෙන් ම එහි මූලිකාංග වැනි සිද්ධාන්තමය කාරණා ඉදිරිපත් කිරීමට හා මතකයේ රඳවා ගැනීමට බහු මාධ්‍ය සමර්පණ භාවිතයට ගැනීම සිසුන් යොමු කිරීම වඩාත් උචිත ය. එමෙන්ම පාසල් ජනමාධ්‍ය ඒකකය හා සම්බන්ධ වෙමින් විවිධ රූපවාහිනී හෝ ගුවන් විදුලිසාකච්ඡා මණ්ඩප නිර්මාණය කොට නූතන පද්‍ය රසවින්දනයට පාසල් පරිසරයේ අවස්ථාව ලබාදීමට ද හැකියාව ඇත.

### 5. ප්‍රතිපෝෂණ යාන්ත්‍රණය

නිරන්තර ප්‍රතිපෝෂණ ලබා දීමට සහ සිසුන්ගේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට ක්‍රමවේදයක් සැකසීම. දුර්වලතා කල් තියා හඳුනා ගැනීමට සහ ඒවා නිවැරදි කර ගැනීමට පාසැල් පාදක තක්සේරුකරණ ක්‍රියාවලිය හා පාසැල් අභ්‍යන්තර ඇගයීම් ක්‍රියාවලිය නිවැරදි ව ක්‍රියාත්මක කිරීම, මේ සඳහා බෙහෙවින්ම උපකාර වනු ඇත.